# 2016 වර්ෂය සඳහා
# පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව

සෙනරත් බණ්ඩාර දිසානායක
MSc, PhD.

2024

**2016 වර්ෂය සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව**

ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක

© පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ISBN 978-624-5840-32-8

# ගවේෂණ හා ලේඛනගතකිරීම් අංශය

**ආරක්ෂිත / පැරණි ස්මාරක ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය**

පුරාවස්තු ආඥා පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා පැරණි ස්මාරක වශයෙන් 2016 වර්ෂය තුළ පහත සදහන් දිස්ත්‍රික්කයන්හි ස්ථාන 157 ක් රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ලදි.

| දිස්ත්‍රික්කය | ආරක්ෂිත ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ස්මාරක ප්‍රමාණය | ස්මාරක පිහිටි ස්ථානය | ස්මාරක | ගැසට් අංකය/දිනය |
|---|---|---|---|---|
| අනුරාධපුර | 03 | ගෝනගිරි රජමහා විහාර භූමිය | මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති සහිත කටාරම් කෙටූ ලෙන් විහාරය සහ ඒ ආසන්නයේ ඇති කටාරම් සහිත ලෙන් දෙක, පැරණි චෛත්‍ය ගොඩැල්ල, ශිලාමය ප්‍රාකාර, පියගැටපෙළ හා විහාර භූමියේ විසිරී ඇති අනෙකුත් පුරා විද්‍යාත්මක අවශේෂ | 2016.03.09 1957/18 |
| | | බඹරහෙළ දේවගිරි රජමහා විහාර භූමියේ | කටාරම් සහ ශිලාලේඛන සහිත ලෙන් සංකීර්ණය පිහිටි බඹරහෙළ කන්ද සහ විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ අනෙකුත් පුරා විද්‍යාත්මක අවශේෂ | 2016.03.24 1960 |
| | | ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාර භූමිය | පැරණි ටැම්පිට විහාර ගොඩනැගිල්ල | 2016.07.07 1974/16 |
| කුරුණෑගල | 01 | අකරගනේ දේවාලය | කටාරම් කෙටූ ලෙන | 2016.03.09 1957/18 |
| මහනුවර | 26 | බුලත්වත්ත වලව්ව සහිත භූමිය | පෞරාණික අටුව | 2016.03.09 1957/18 |
| | | හතරලියද්ද වැලිවිට පහළගමකැටල රත්නැහැගෙදර හිටිනාවත්ත නැමැති ඉඩම | කටාරම් කෙටූ ගල් ලෙන | 2016.03.09 1957/18 |
| | | වරාතැන්න | පැරණි ගල් ළිද (පැරණි සොරොව්ව) | 2016.03.24 1960 |
| | | සිරිමල්වත්ත | සිරිමල්වත්ත අම්බලම | 2016.03.24 1960 |
| | | වත්තේගම විද්‍යා දර්ශන පිරිවෙන් විහාර භූමිය | පැරණි දෙමහල් ගොඩනැගිල්ල | 2016.07.07 1974/16 |
| | | ගල්කොටුව | කටාරම් ලෙන | 2016.07.07 1974/16 |
| | | කටාරංගල | ගල් ලෙන සහ ඒ ආසන්නයේ ඇති කටාරම් කෙටූ ලෙන | 2016.07.07 1974/16 |
| | | ගිඩ්ඩව පුරාණ විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව, චෛත්‍යය දෙක | 2016.07.07 1974/16 |

| | | | | |
|---|---|---|---|---|
| | | කරලියද්ද ශ්‍රී උපෝසථාරාම විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහයේ ඇති ශිලාමය ද්වාරය හා පැරණි පියගැටපෙළ | 2016.07.07 1974/16 |
| | | කන්දගම්මැද්ද | කන්දේ වලව්ව | 2016.07.07 1974/16 |
| | | වලවත්ත වලව්ව සහිත භූමිය | පැරණි ළිද සහ පිහිල්ල | 2016.07.07 1974/16 |
| | | උඩවෙල පුරාණ බෝධිමළු විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | ගබ්බල | කඩවර දේවාලය | 2016.07.07 1974/16 |
| | | වරදිවෙල පූර්වාරාම විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | උඩගම සත්පත්තිනි දේවාල භූමිය | උඩගම සත්පත්තිනි දේවාල ගොඩනැගිල්ල ඒ අසල කුඹුරු ඉඩමේ ඇති ඉරහඳ ගල | 2016.07.07 1974/16 |
| | | උඩිස්පත්තුව | මඩුගල්ලේ වලව්ව | 2016.07.07 1974/16 |
| | | පොත්දල්ගොඩ පුරාණ විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | ගණේපිටිය ඉඩම | ශිලාලේඛනය හා චෛත්‍යය | 2016.07.07 1974/16 |
| | | දෙගන්තිලක විහාර භූමිය | කටාරම් කෙටූ ලෙන සහ ශිලාමය පියගැටපෙළ | 2016.07.07 1974/16 |
| | | හීල්ඔය පුරාණ විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | බෝධිරුක්ඛාරාම විහාර භූමිය | පැරණි විශ්ණු දේවාලය | 2016.07.07 1974/16 |
| | | කුරුකොහෝගම රජමහා විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | වෙඩරුව කිරි විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක | 2016.07.07 1974/16 |
| | | මැදගම්මැද්ද | පැරණි සෙක්කුව | 2016.07.07 1974/16 |
| | | කටාරම් කුඹුරේ පිල්ලෑව ඉඩමේ | කටාරම් සහිත ලෙන | 2016.07.07 1974/16 |
| | | වල්වාසගොඩ රජමහා විහාර භූමිය | චෛත්‍යඝරය, චෛත්‍යය හා ශිලා ලේඛනය | 2016.07.07 1974/16 |
| මාතලේ | 07 | නාගොල්ල ආරණ්‍ය සේනාසනය-ගොම්මොට්ටා කන්ද | ලෙන් ලිපි සහිත කටාරම් කෙටූ ලෙන් සංකීර්ණය | 2016.03.09 1957/18 |
| | | නියදගල රජමහා විහාරය | ලෙන් විහාරය සහ සිරිපතුල් ගල | 2016.03.09 1957/18 |
| | | වෙහෙරගල රජමහා විහාරය | ගොඩනැගිලි නටබුන් ස්ථාන, චෛත්‍යය ගොඩැලි, පර්වත ලිපි, කටාරම් සහිත ලෙන්, පියගැට පේළි, සිරිපතුල් ගල, පා දෝවනය ඇතුළු පුරාවිද්‍යාත්මක සාධක විසිරී ඇති ආරාම සංකීර්ණය | 2016.03.09 1957/18 |
| | | හුළංගමුව | මොණරවිල කැප්පෙටිපොල හුලංගමුව මහ වලව්ව | 2016.03.09 1957/18 |

| | | | | |
|---|---|---|---|---|
| | | වැවල වැව ගල්ලෙන් ආරණ්‍ය සේනාසනය | කටාරම් සහ ශිලාලේඛන සහිත ලෙන් සංකීර්ණය සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක | 2016.03.09 1957/18 |
| | | හුලංගමුව ඇඹිල්ල රජමහා විහාරය | බිතු සිතුවම් සහිත ලෙන් විහාරය | 2016.03.09 1957/18 |
| | | වාරියපොල හන්දිය | මාතලේ වාරියපොල කැරල්ල සිහිවටන ශිලා පුවරුව | 2016.03.24 1960 |
| නුවරඑළිය | 01 | පදියපැලැල්ල වට්ටාරම්තැන්න පුරාණ විහාරය | පැරණි ප්‍රතිමා ගෘහය සහ චෛත්‍යය | 2016.03.09 1957/18 |
| කෑගල්ල | 19 | දෙවනගල රජමහා විහාර භූමිය | චෛත්‍යය, ටැම්පිට විහාරය, ධර්ම ශාලාව, පර්වත ලිපි, නටබුන් ගොඩැලි, ප්‍රාකාර, පොකුණු, පියගැට පේළි, ගල්ලෙන්, ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ස්ථාන, කාණු ඇතුළු පුරාවිද්‍යාත්මක නටබුන් සංකීර්ණය සහිත දෙවනගල පර්වතය | 2016.03.09 1957/18 |
| | | මාලිගාතැන්න වත්ත | පැරණි පොකුණ, පියගැටපේළි, ප්‍රාකාර බැම්ම, ශිලා කුළුණු, කණු සිදුරු ස්ථාන සහ අනෙක් පුරාවිද්‍යාත්මක සාධක | 2016.03.09 1957/18 |
| | | කෑගල්ල ශුද්ධ වූ යොහොන් රෙපරමාදු දේවස්ථානය | දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09 1957/18 |
| | | ගොවිජන මධ්‍යස්ථානය ඉදිරිපිට කුඹුරුයාය මධ්‍යය | කුඩා ගල් පර්වතයේ ඇති සත්ව රූ සටහන සහිත ස්ථානය | 2016.03.09 1957/18 |
| | | කටුගහවත්ත ඉඩම | නටබුන් ගොඩැල්ල | 2016.07.07 1974/16 |
| | | කිතුල්ගහ හේන | කටාරම් සහ ශිලාලේඛනය සහිත ලෙන | 2016.07.07 1974/16 |
| | | හිටිනාවත්ත (දෙවයගහමුල කොටුව) | පියගැටපේළි, ආධාරක බැම්, සඳකඩ පහන සහිත පිවිසුම් මාර්ගය | 2016.07.07 1974/16 |
| | | පහලකොටුව ඉඩම | කටාරම් සහිත ලෙන | 2016.07.07 1974/16 |
| | | ගල්පොත්ත පිටහේන | ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ගල්ලෙන් | 2016.07.07 1974/16 |
| | | පොල්කුඹුර | කටාරම් සහිත ලෙන, පියගැට පෙළ හා වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහිත බෝගල ගල්තලාව | 2016.07.07 1974/16 |
| | | පරගහහේන ඉඩම | මානව රූ සටහන හා ධර්මචක්‍ර සලකුණ ඇති ගල්තලාව | 2016.07.07 1974/16 |
| | | දේවාලවත්ත | කටාරම් කෙටූ ලෙන් | 2016.07.07 1974/16 |
| | | දිගනේහේන | ලෙන් ලිපිය, කටාරම් ඇති ලෙන | 2016.07.07 1974/16 |
| | | බලත්ගම පුරාණ තාපා ගල්ලෙන් විහාර භූමිය | පැරණි සිතුවම් හා මූර්ති සහිත ලෙන් විහාරය | 2016.07.07 1974/16 |
| | | වාකිරිගල රජමහ විහාර භූමිය | ටැම්පිට ප්‍රතිමා ගෘහය, දිග්ගෙය, දාගැබ, සිරිපතුල සහිත ගල් තලාව | 2016.07.07 1974/16 |
| | | ශ්‍රී ධර්මවිජය සුන්දරාරාමය විහාරය | පැරණි ධර්ම ශාලාව | 2016.07.07 1974/16 |
| | | ඇත්නාවල ශ්‍රී පුෂ්පාරාම විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |

| | | | | |
|---|---|---|---|---|
| | | මංගලගම ශ්‍රී විද්‍යා මංගල පිරිවෙන් විහාරය | පැරණි ටැම්පිට ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| | | බෙලිගෙදර ඉඩමේ ගාල්ලේගල නම් ස්ථානය | පැරණි ගොඩනැගිලි ඉදිකිරීම් සාධක සහිත ගල් තලාව | 2016.07.07 1974/16 |
| රත්නපුර | 02 | මාකඳුර | මාකඳුර මහ වලව්ව | 2016.03.09 1957/18 |
| | | බලවින්න පුරාණ ගංගාරාම විහාර භූමිය | පැරණි සිතුවම් සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය | 2016.07.07 1974/16 |
| බදුල්ල | 07 | දංකුඹුර රජමහා විහාර භූමිය | කටාරම් කෙටූ ලෙන සහ අනෙකුත් පුරා විද්‍යාත්මක සාධක | 2016.03.09 1957/18 |
| | | කණුගොල්ල ශෛලබිම්බාරාම විහාර භූමිය | ගුහා චිත්‍ර සහ කටාරම් කෙටූ ලෙන් විහාරය | 2016.03.09 1957/18 |
| | | හෙබරව | නටබුන් චෛත්‍යය ගොඩැල්ල | 2016.03.09 1957/18 |
| | | සොරබොර වැව | පැරණි සොරොව්ව සහිත සොරබොර වැව | 2016.03.24 1960 |
| | | රිදීමාලියද්ද | පෝට්ටුව අම්බලම | 2016.03.24 1960 |
| | | මාපාකඩවැව | පැරණි දාගැබ් ගොඩැල්ල සහ ශිලා මෙවලම් අවශේෂ තැන්පතු ස්ථාන ඇතුළු වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහිත මාපාගොඩ වෙහෙරගොඩැල්ල නමින් හඳුන්වන ගල් පර්වතය | 2016.03.24 1960 |
| | | කනත්තේවෙල | පැරණි අම්බලම | 2016.03.24 1960 |
| මොණරාගල | 20 | විහාරමුල්ල, ගල්කැටිය නමින් හඳුන්වන ප්‍රදේශය | සංකේත සටහන් සහ කාණු සකස් කළ ස්ථාන සහිත ගල්තලාව (සුද්දිගේවත්ත) | 2016.03.09 1957/18 |
| | | වැලිගම් වෙහෙර පුරාණ විහාර භූමිය | පැරණි චෛත්‍යය සහ ගොඩනැගිලි නටබුන් ස්ථාන | 2016.03.09 1957/18 |
| | | උණවටුන රජමහා විහාර භූමිය | පෞරාණික දාගැබ, ගොඩැලි, නටබුන් ස්ථාන සහ පැරණි ප්‍රාකාරය | 2016.03.09 1957/18 |
| | | පුරාණ ගල්ලෙන් පුරාණ භූමිය | කටාරම් කෙටූ ලෙන සහ ස්වභාවික ලෙන් දෙක | 2016.03.09 1957/18 |
| | | වත්තේගම මීයන්ගොඩපිටිය නමින් හඳුන්වන ප්‍රදේශය | ගොඩනැගිලි නටබුන්, ප්‍රාකාර කොටස්, පොකුණ ඇතුලු බෞද්ධ ආරාම නටබුන් ස්ථාන | 2016.03.09 1957/18 |
| | | ගෝනගංආර වළගම්බා පුරාණ රජමහා විහාරය | ස්තූපය හා ගොඩනැගිලි නටබුන් සහිත ස්ථාන | 2016.03.09 1957/18 |
| | | පන්සල්වත්ත උස්ගල නමින් හඳුන්වන ස්ථානය | කටාරම් කෙටූ ලෙන | 2016.03.09 1957/18 |
| | | තුනිකෙම්ගල රජමහා විහාර භූමිය | නටබුන් ගොඩැලි, පොකුණු, සහ ගල් පර්වතයේ ඇති කණු වළවල් සහිත ස්ථාන | 2016.03.09 1957/18 |
| | | නාමළුව | කටාරම් හා ශිලාලේඛන කෙටූ සියලු ම ලෙන්, පර්වත ලිපි, පැරණි ස්තූපය හා ගොඩනැගිලි නටබුන් සහිත නාමළුව පුරාවිද්‍යා ස්ථානය | 2016.03.09 1957/18 |

| | | | | |
|---|---|---|---|---|
| | | හෙළගම දේවගිරිය ආරණ්‍ය සේනාසන භූමිය | ලෙන් සංකීර්ණය, ගොඩනැගිලි හා චෛත්‍යය නටබුන් ස්ථාන ඇතුලු අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක | 2016.03.24 1960 |
| | | දිග්ගලයාය වැවට යාබද භූමිය | චෛත්‍ය  ගොඩැල්ල සහිත නටබුන් ස්ථානය | 2016.03.24 1960 |
| | | පුදාමයාය | ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් තැන්පතු සහිත ස්ථානය | 2016.03.24 1960 |
| | | මහගොඩයාය රහතුන්කන්ද බුද්ධ රක්ඛිත ආරණ්‍ය සේනාසන භූමිය | කටාරම් කෙටූ ලෙන් | 2016.03.24 1960 |
| | | දඹේආර වැව පාමුල | බුද්ධ ප්‍රතිමා (අඩක් නිමකළ) සහ ශිලා කුලුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථාන | 2016.03.24 1960 |
| | | හැබැස්ස - උතුර ගල්තලාව ආශ්‍රිතව | කටාරම් කෙටූ ලෙන්, පියගැටපෙළි සහ කොරි සටහන් සහිත ස්ථාන | 2016.03.24 1960 |
| | | ගෝතමිගම | කටාරම් කෙටූ ලෙන | 2016.03.24 1960 |
| | | රහතන්කන්ද ආරණ්‍ය සේනාසන භූමිය | කටාරම් සහ ශිලා ලේඛන කෙටූ සියලුම ලෙන් සහ පෞරාණික චෛත්‍යය | 2016.03.24 1960 |
| | | ඇතිලිවැව | ඇතිලිවැවේ පැරණි සොරොව්ව | 2016.03.24 1960 |
| | | යාල ජාතික වනෝද්‍යාන භූමිය තුළ | පැරණි ස්ථූප, ගොඩනැගිලි නටබුන්, කටාරම් කෙටූ ලෙන් සහ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් තැන්පතු ස්ථාන සහිත වෙහෙරදිවුලාන පුරාවිද්‍යා භූමිය | 2016.03.24 1960 |
| | | පුදාමයාය නමින් හඳුන්වන ස්ථාන | පැරණි ගල්කොරි | 2016.03.24 1960 |
| ගාල්ල | 6 | තෙල්වත්ත රන්පත් රජමහා විහාරය | පැරණි ප්‍රතිමා ගෘහ 02, චෛත්‍ය, පොහොය ගෙය, පැරණි ආවාස ගෘහ, ධර්ම ශාලාව, පැරණි බෝධි ප්‍රාකාරය, පැරණි දේවාල ගොඩනැගිලි, පැරණි ශිලා කුලුණු සහිත නටබුන් ස්ථානය විහාර භූමියේ බටහිර ඇති ශිලා කුලුණු සහිත නටබුන් ස්ථානය සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක විසිරි ඇති විහාර භූමිය | 2016.03.09 1957/18 |
| | | ගණේගොඩැල්ල | පැරණි ප්‍රතිමා ගෘහය, චෛත්‍ය, සිරිපතුල් ගල, කිරිගරුඬ බුද්ධ ප්‍රතිමාව, පැරණි සොහොන් කොත ඇතුලු වෙනත් පුරාවිද්‍යාත්මක අවශේෂ විසිරි ඇති භූමි ප්‍රදේශය | 2016.03.09 1957/18 |
| | | පෝරඹවත්ත නොහොත් ටැංකියාවත්ත ඉඩම | ශෛලමය පොකුණ | 2016.03.24 1960 |
| | | පහල කිහිඹිය ශෛලාලයාරාම පුරාණ රජමහා විහාර භූමිය | කටාරම් සහිත ගල්ලෙන | 2016.07.07 1974/16 |
| | | මවුන්ට් කල්වරි | ජපමාල රාජේෂ්වරියගේ ආසන දෙව් මැදුර | 2016.07.07 1974/16 |
| | | ඌරවත්ත ගංගාරාම විහාරය | පැරණි චෛත්‍යය | 2016.07.07 1974/16 |
| මාතර | 08 | හික්ගොඩ ශ්‍රී සුධර්මාරාම විහාර භූමිය | පැරණි චෛත්‍යය සහ ප්‍රතිමා ගෘහය | 2016.03.09 1957/18 |

| | | | | |
|---|---|---|---|---|
| | | උඟුරුබොක්ක | ලන්දේසි යුගයේ ඉදිකරන ලද පැරණි බැම්ම | 2016.03.24<br>1960 |
| | | වේළුවනාරාම පුරාණ විහාර භූමිය | පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය | 2016.07.07<br>1974/16 |
| | | ඇල්ගිරිය රජමහා විහාර භූමිය | ප්‍රතිමා ගෘහයේ ඇති පැරණි සිතුවම් සහ මූර්ති සහිත ඇතුල් ගෘහය | 2016.07.07<br>1974/16 |
| | | ගලගොඩ ඇත්කඳ පුරාණ විහාර භූමිය | කටාරම් සහිත ලෙන සහ විහාර භූමියට බටහිර හා නිරිත දෙසින් වු භූමිවල ඇති ගොඩනැගිලි නටබුන් සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක | 2016.07.07<br>1974/16 |
| | | ගල්කන්ද පුරාණ විහාර භූමිය | පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය | 2016.07.07<br>1974/16 |
| | | මාතර බලකොටු භූමිය | ඕලන්ද රෙපරමාදු දේවස්ථානය | 2016.07.07<br>1974/16 |
| | | වේරගම්පිට රජමහා විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය සහ කොරතොට නාහිමියන්ගේ සොහොන් කොත | 2016.07.07<br>1974/16 |
| ගම්පහ | 10 | මිරිස්වත්ත/ගම්පහ ප්‍රධාන මාර්ගය | බැණ්ඩියමුල්ල සොහොන් කොත | 2016.03.09<br>1957/18 |
| | | ධාතුකන්ද ශ්‍රී ජිනේන්ද්‍රාරාම පුරාණ රජමහා විහාර භූමිය | ගොඩනැගිලි නටබුන් ස්ථානය, ප්‍රාග් ඓතිහාසික ජනාවාස සාධක සහිත ස්ථානය හා පිහිටි ගලේ ඇති පියගැටපෙළ | 2016.03.09<br>1957/18 |
| | | ක්ෂේත්‍රාරාම පුරාණ විහාර භූමිය | ටැම්පිට ප්‍රතිමා ගෘහය හා පොහොය සීමාව | 2016.03.09<br>1957/18 |
| | | පිළිකුත්තුව රජමහා විහාර භූමියේ | පැරණි ධර්මශාලාව | 2016.07.07<br>1974/16 |
| | | මාඉඹුල ගල්ලෙන් විහාර භූමියේ | පැරණි සිතුවම් හා මූර්ති සහිත ලෙන් විහාරය | 2016.07.07<br>1974/16 |
| | | විද්‍යාරවින්ද මහපිරිවෙන් භූමියේ | ටැම්පිට විහාරය | 2016.07.07<br>1974/16 |
| | | ලෙනගම්පල පුරාණ විහාර භූමියේ | කටාරම් සහිත ලෙන් විහාරය | 2016.07.07<br>1974/16 |
| | | විහාරගල මීගල්ල | කටාරම් ලෙන | 2016.07.07<br>1974/16 |
| | | කොස්කඳවල රජමහා විහාර භූමිය | පැරණි ධර්මශාලාව | 2016.07.07<br>1974/16 |
| | | පරෙවිගල | කටාරම් කෙටු ලෙන | 2016.07.07<br>1974/16 |
| කළුතර | 16 | පොල්කොටුව | ශාන්ත ආනා කතෝලික දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | කෙච්චිමලෙයි | මුස්ලිම් දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | දියලගොඩ | ශාන්ත සෙබස්තියන් දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | මග්ගොන | ශාන්ත ෆ්‍රැන්සිස් දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | අළුත්ගම | ශාන්ත මරියා දේවස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | හගම්මැද්ද ශ්‍රී ධර්මගුප්ත පිරිවෙන් භූමිය | පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය | 2016.03.09<br>1957/18 |
| | | පයාගල | ශුද්ධ වු ප්‍රැන්සිස් සර්වියස් පල්ලිය | 2016.03.09<br>1957/18 |

| | | | | |
|---|---|---|---|---|
| | | කපුගොඩ | ශාන්ත විසෙන්ති නිවස්නය (සුසිනෝදය ගොඩනැගිල්ල) | 2016.03.09<br>1957/18 |
| | | කන්දේ විහාර භූමිය | පැරණි සිතුවම් සහිත අටපට්ටම් හැඩැති ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | ධම්මිකාරාම පුරාණ විහාර භූමිය | පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය | 2016.03.09<br>1957/18 |
| | | මග්ගොන | ශාන්ත මරියා දේවාස්ථාන ගොඩනැගිල්ල | 2016.03.09<br>1957/18 |
| | | වරකාගොඩ ගල්ලෙන පුරාණ රජමහා විහාර භූමියට යාබද භූමිය | කටාරම් කෙටූ ගල්ලෙන | 2016.03.09<br>1957/18 |
| | | ගණේගොඩැල්ල පුරාණ රජමහා විහාරය | පැරණි ප්‍රතිමා ගෘහය සහ විහාර භූමියේ ඇති අනෙකුත් පුරාවිද්‍යාත්මක අවශේෂ | 2016.03.09<br>1957/18 |
| | | මරදාන | බේරුවල ප්‍රදීපාගාරය | 2016.03.24<br>1,960 |
| | | පයාගල පොලිස් ස්ථානය | පැරණි ගොඩනැගිල්ල | 2016.03.24<br>1,960 |
| | | වරකාගොඩ ගනේඋඩ පුරාණ රජ මහා විහාර භූමියට යාබඳ | ගනේඋඩවත්ත නමින් හඳුන්වන ඉඩමේ පිහිටි පියගැට සහිත පැරණි ප්‍රවේශ මාර්ගය සහ එම මාර්ගය දෙපස ඇති පැරණි අක්ෂර සහ වෙනත් පුරාවිද්‍යාත්මක සටහන් සහිත පර්වත | 2016.07.07<br>1974/16 |
| කොළඹ | 03 | මෝදර අළුත්මාවත, එළිහවුස් අංක 521/3 ස්ථානය | පැරණි ජල ටැංකි | 2016.03.24<br>1960 |
| | | මරදාන නගරයේ පළමු පටුමග අංක 10 ස්ථානය | කලන්දර් සාහිබ් වලියුල්ලා මුස්ලිම් දේවස්ථාන ගොඩනැගිල්ලේ ඇති සමාධි ගෘහය | 2016.07.07<br>1974/16 |
| | | ශ්‍රී සුධර්මාරාම විහාරය | ප්‍රතිමා ගෘහය | 2016.07.07<br>1974/16 |
| මන්නාරම | 04 | සින්නකුලම් | ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.09<br>1957/18 |
| | | ඉලුප්පකඩවයි පඩවුතුරෙයි | මිනුම් කුළුණ | 2016.03.24<br>1960 |
| | | තලෙයිමන්නාරම | පැරණි ජැටිය | 2016.03.24<br>1960 |
| | | ඌරුමලෛ | පැරණි ප්‍රදීපාගාරය | 2016.03.24<br>1960 |
| මුලතිව් | 31 | කලික්කාඩු | පැරණි ශිලා කුළුණු සහිත කලික්කාඩු නටබුන් ගොඩනැගිලි ස්ථානය | 2016.03.09<br>1957/18 |
| | | පේරාරු | පැරණි ජනාවාස සාධක සහිත ස්ථානය | 2016.03.09<br>1957/18 |
| | | පේරාරු | ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථාන | 2016.03.09<br>1957/18 |
| | | පණ්ඩාරවන්නියාර් | නටබුන් ස්ථානය | 2016.03.09<br>1957/18 |
| | | කුලාමෝට්ටෙයි | ශිලා ප්‍රාකාරය සහ නටබුන් ගොඩැල්ල සහිත කුලාමෝට්ටෙයි නටබුන් ස්ථානය | 2016.03.09<br>1957/18 |
| | | වලඥකරේ | දාගැබ් හා ගොඩනැගිලි නටබුන් සහිත වලඥකරේ නටබුන් ස්ථානය | 2016.03.09<br>1957/18 |

| | | | | |
|---|---|---|---|---|
| | | කරම්බකාඩු සමනන්කුලම | ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථාන | 2016.03.24 1,960 |
| | | මුලතිව් | මුලතිව් ඕලන්ද බලකොටුව | 2016.03.24 1,960 |
| | | පුලුමච්චිනාදකුලම් | දාගැබ සහ ගොඩනැගිලි නටබුන් සහිත පුලුමච්චිනාදකුලම් වැව් රක්ෂිතයේ නටබුන් | 2016.03.24 1,960 |
| | | කුලාම්මුරිප්පු | ගොඩනැගිලි නටබුන් ස්ථානය සහ චෛත්‍ය ගොඩැල්ල | 2016.03.24 1,960 |
| | | මුතියන්කට්ටුව වැව අසළ | ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | තඩ්ඩයාමලෙයි | ගොඩනැගිලි  නටබුන් | 2016.03.24 1,960 |
| | | ඉද්දමඩුව නටබුන් ස්ථානය | ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | තඩ්ඩයාමලෙයි | නටබුන් වු දාගැබ සහ ගොඩනැගිලි අවශේෂ සහිත ගල් පර්වත දෙක (තඩ්ඩයාමලේ නටබුන් ස්ථානය) | 2016.03.24 1,960 |
| | | ගනේෂපුරම් | ශිලා කුළුණ සහ ශිලා පාදම් සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | වෙල්ලම්කුලම් | ආරාම සංකීර්ණයට අයත් වෙල්ලම්කුලම් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | ආලන්කුලම (65  යුධ හමුදා සේනාංක මුලස්ථානය අසල) | ස්තූප නටබුන් | 2016.03.24 1,960 |
| | | කල්විලාන් | ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | උදියකුරුප්පුකුලම් වැව අසළ | ආරාම සංකිර්ණයට අයත් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | කන්නියාර් කෝවිල් නටබුන් නමින් හඳුන්වන ස්ථානය | චෛත්‍ය ගොඩැල්ල, ශිලා කුළුණු සහ ගොඩනැගිලි නටබුන් සහිත බෞද්ධ ආරාම සංකීර්ණයක නටබුන් | 2016.03.24 1,960 |
| | | නෛත්තික්කායිකුලම් | චෛත්‍ය ගොඩැල්ල සහිත නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | ජනකපුර අළුත් පාසල පිටුපස | ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | මුතියංකටට්ටුව යුධ හමුදා පුහුණු පාසල අසළ | පැරණි දාගැබ, ප්‍රතිමාගෘහය සහ අනෙකුත් ගොඩනැගිලි නටබුන් ස්ථාන | 2016.03.24 1,960 |
| | | නයාරු | නයාරු පැරණි දාගැබ | 2016.03.24 1,960 |
| | | කච්චිලාමඩු | පණ්ඩාරවන්නියන් ස්මාරකය | 2016.03.24 1,960 |
| | | පුත්තුවෙඩ්ඩුවාන් | ශිලා කුළුණු සහිත මරදකුලම් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | පුත්තුවෙඩ්ඩුවාන් | ගොඩනැගිලි නටබුන් සහිත පුත්තුවෙඩ්ඩුවාන් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | පලෙයිමුරුගන්ඩි | ගොඩනැගිලි නටබුන් සහිත අම්බලාවිකුලම් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | පලෙයිමුරුගන්ඩි | ගොඩනැගිලි නටබුන් සහිත අම්ලාවි කුලම් නටබුන් ස්ථාන | 2016.03.24 1,960 |
| | | තෙන්නියන්කුලම් | ගොඩනැගිලි නටබුන් සහිත තෙන්නියන්කුලම් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |

| | | | | |
|---|---|---|---|---|
| | | උයිලන්කුලම් | දාගැබ් සහ ගොඩනැගිලි නටබුන් සහිත උයිලන්කුලම් නීරාවී නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | උයිලන්කුලම්-අම්බපෙරුමාල් වැව අසල | ගොඩනැගිලි නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| කිලිනොච්චිය | 08 | මනින්තලේ | මනින්තලේ ශිව කෝවිල් නටබුන් | 2016.03.09 1957/18 |
| | | ගෞතාර්මුනෙයි | ශිව කෝවිල් නටබුන් ස්ථානය | 2016.03.09 1957/18 |
| | | කල්මුනේ | පැරණි මිනුම් කුළුණ | 2016.03.24 1,960 |
| | | උට්ටුපුලම් | නටබුන් වූ ස්තූප ගොඩැල්ල, ගොඩනැගිලි නටබුන් සහ පැරණි ළිඳ සහිත උට්ටුපුලම් නටබුන් ස්ථානය | 2016.03.24 1,960 |
| | | අරිසපුරම් අල්ලිරාණි කොටුව නමින් හඳුන්වන ස්ථානය | නටබුන් ගොඩැලි | 2016.03.24 1,960 |
| | | අක්කරායන් | නටබුන් ගොඩැල්ල | 2016.03.24 1,960 |
| | | ශිවනගර් කෝවිල් භූමිය | චෛත්‍යය ගොඩැල්ල සහ නටබුන් ගොඩනැගිලි | 2016.03.24 1,960 |
| | | පුනරීන් | පුනරීන් ලන්දේසි බලකොටුව | 2016.03.24 1,960 |

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය.**

2015 වර්ෂයේ දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය කරන ලද අතර 2016 වර්ෂයේ දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව විසිරී ඇති පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම හා වාර්තාගත කිරීමේ අරමුණින් යුතුව මෙම ගවේෂණ ව්‍යාපෘතිය 2016.09.01 සිට 2016.10.15 දක්වා ක්‍රියාත්මක කරන ලදී. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාලය මගින් සම්පාදිත මූල්‍ය ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලය විසින් සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 16 ක් ආශ්‍රිතව පුරාවිද්‍යා ස්ථාන 60 ක පමණ ප්‍රමාණයක් හඳුනාගෙන වාර්තාගත කිරීමට හැකි විය.

සේරුනුවර මංගල සෑය ප්‍රමුඛ කොටගත් අනුරාධපුර හා පොළොන්නරු යුගයට අයත් බෞද්ධ ආරාමික නටබුන් සහිත ස්ථාන, ප්‍රාග් ඓතිහාසික ස්ථාන හා පූර්ව ඓතිහාසික යුගයට අයත් මෙගලිතික සුසාන සහිත ස්ථාන, ලෙන් ලිපි, පර්වත ලිපි සහිත ස්ථාන කීපයක් මෙම ගවේෂණයෙන් හඳුනා ගැනීමටත් වාර්තාගත කිරීමටත් හැකි විය. සිරි මංගලපුර ප්‍රදේශයෙන් සොයාගත් පොළොන්නරු යුගයට අයත් ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහය සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් වශයෙන් වැදගත් වේ.






සිරි මංගලපුර ප්‍රදේශයෙන් සොයාගත් ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහය

**දිඹුලාගල විශේෂ ගවේෂණය.**

ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් දීර්ඝ කාලයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු නොවූ දිඹුලාගල ප්‍රදේශය ආශ්‍රිතව 2016 වර්ෂයේ සිට වසර 05 ක් පුරා අදියර 05 කින් යුතුව පුරාවිද්‍යා ගවේෂණයක් සිදුකිරීමට යෝජනා විය. ඒ අනුව දිඹුලාගල පර්වතය ආශ්‍රිත භූමි ප්‍රදේශය කොටස් 05ක් වශයෙන් බෙදා එහි පළමු අදියර වශයෙන් දිඹුලාගල විහාරස්ථානය හා අවට ප්‍රදේශයේ ගවේෂණ කටයුතු මෙම වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම ගවේෂණයෙන් දිඹුලාගල විහාරස්ථානය අවටින් පැරණි ස්මාරක 18 ක් හඳුනාගෙන වාර්තාගත කරන ලදී. එහි දී ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ලෙන් වාසස්ථාන, කටාරම් සහිත ලෙන්, යකඩ නිෂ්පාදන ස්ථාන හා පැරණි ගල් බිඳුම් සාධක සහිත ස්ථාන වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන වාර්තාගත කරන ලදී.



දිඹුලාගල විහාරස්ථානය





කටාරම් ලෙන් - දිඹුලාගල

**පුරාවස්තු විනාශය වැළැක්වීමේ විශේෂ ඒකකය මගින් සිදු කළ ව්‍යාපෘති.**

2016 වර්ෂයට අදාළව මෙම අංශය විසින් උරුමය සුරැකීම පිළිබඳ පොලිස් ඒකක 25 ක පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු සහ පුරාවස්තු විනාශය වැළැක්වීම පිළිබද පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව උතුරුමැද පළාත තුළ තෝරාගත් පාසල් 20 ක පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම සිදු කරන ලදී. මේ අනුව 2016 වර්ෂය තුළ දීප ව්‍යාප්තව දේශන 1683 ක් පවත්වා ඇත. මේ හැර වර්ෂය පුරාම ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වූ පුරාවස්තු විනාශයන් වැළැක්වීම හා ඒ සඳහා නෛතික මැදිහත්වීම මෙම ඒකකයෙන් සිදු කරන ලදී.

**2016 වර්ෂය තුළ සිදුව ඇති පුරාවස්තු විනාශයන් පිළිබද තොරතුරු**

| **පුරාවස්තු විනාශයන්** | **වාර්තා වී ඇති සිද්ධි ගණන** |
|---|---|
| පුරාවස්තු සොරකම | 10 |
| පුරාවස්තු විකෘතිය හා විනාශය | 17 |
| පුරාවස්තු සෙවීමට අනවසර කැණීම් කිරීම | 173 |
| පුරාවස්තු පනතට ගැනෙන වෙනත් වැරදි | 03 |

**චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය**

1. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සියලු ආයතන හා පුද්ගලයන් සතුව පවතින චංචල පුරාවස්තු පිළිබඳ සොයා බලා අධ්‍යයනය කර විධිමත්ව ඒවා වාර්තාගත කිරීම හා පරිගණක දත්ත බැංකුවක් ස්ථාපිත කිරීමයි. මෙහි ප්‍රථම පියවර ලෙස දැනට පුරාවස්තුවල හිමිකාරීත්වය දරණ රාජ්‍ය ආයතන, පූජ්‍ය ස්ථාන හා කෞතුකාගාර පිළිබඳවත් පුද්ගලයන් පිළිබඳවත් සොයාබලා කිසියම් ප්‍රමුඛතා අනුපිළිවෙලකට වාර්තා කිරීම අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව සෑම චංචල පුරාවස්තුවක්ම නියමිත ආකෘති පත්‍රයකට අනුව සැලසුම් සහ ඡායාරූප සහිතව වාර්තාගත කරනු ලැබේ. එමගින් පහත සඳහන් කරුණු තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ.

   1. චංචල පුරාවස්තුවල අනන්‍යතාවය
   2. පුරාවස්තුවලට නීතිමය ආවරණය ලබාදීම
   3. පුරාවස්තුවල ආරක්ෂාව තහවුරු කිරීම
   4. අධ්‍යයනයට පහසු දත්ත එකතුවක් ගොඩනැගීම

මෙම වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයෙන් හා පළාත් කාර්යාලවලින් සිදුකරන ලද චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘති පහතින් සඳහන් වේ.

| **කාර්යාලය** | **ලේඛනගත කළ ස්ථානය** | **වාර්තාගත කළ ප්‍රමාණය** |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | I. රසායනාගාරය<br>II. වරාය කෞතුකාගාරය | 865<br>80 |
| බස්නාහිර කාර්යාලය | ඕලන්ද කෞතුකාගාරය | 50 |
| දකුණු පළාත් කාර්යාලය | ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය | 50 |
| උතුරුමැද පළාත් කාර්යාලය | පොළොන්නරුව පුරාවිද්‍යා කලාප කාර්යාලයේ ගබඩාවේ ඇති පුරාවස්තු | 214 |
| වයඹ පළාත් කාර්යාලය | i නාගොල්ල රජමහා විහාරය<br>ii මැද්දේපොළ රජමහා විහාරය උයන්වත්ත ජන කෞතුකාගාරය<br>iii වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පන්සල්<br>iv නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - පන්සල්<br>v කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස - පන්සල් | 2700 |



ලේඛනගත කරනලද චංචල පුරාවස්තු අතරින් කිහිපයක්


**භූ ගෝලීය දත්ත සැකසුම් ඒකකය (GIS)**

01. මෙම ඒකකය මඟින් 2016 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මධ්‍යම පළාතේ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ගැසට් කර ඇති පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරකයන්හි භූගෝලීය සිතියම සකස් කරන ලදී.


02 ලෝක උරුම නගරයක් වන මහනුවර නගරයේ යාර 400 නියෝගය පනවා ඇති පුරාවිද්‍යා ස්මාරක සඳහා යාර 400 නියෝග සලකුණු කළ සිතියම සකස් කිරීම.

03 මහනුවර දිස්ත්‍රික්කයට අයත් නඩත්තු කලාප දැක්වෙන සිතියම සකස් කිරීම යන ව්‍යාපෘතීන් මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

බදුල්ල දිස්ත්‍රික් සිතියම සැකසීම සඳහා සිදුකරන ලද මූලික ගවේෂණයේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්





ගඟවටකෝරළයේ පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සිතියම





ගඟවටකෝරළයේ පුරාවිද්‍යා කලාප සිතියම

පුරාවිද්‍යා ස්ථානයන්හි භූගෝලීය දත්ත ක්‍රමාංක ලබා ගත් අතර එම දත්ත උපයෝගී කරගනිමින් 2016 වර්ෂයට අදාළව බදුල්ල දිස්ත්‍රික් සිතියම සකස් කර ඇත. එහි ඉදිරි අදියරයන් එළඹෙන වසරවල දී සිදු කිරීමට නියමිත ය.





බදුල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන සිතියම




මහනුවර ලෝක උරුම ප්‍රේරණ කලාප සිතියම

උතුරු පළාතේ සිදුකරන ලද ගවේෂණයේ 16, 17 වන අදියර මෙම වසරේ දී සිදුකර ඇත. ඒ අනුව පසුගිය අදියරයන් හි දත්ත ද උපයෝගි කරගනිමින් උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන සහිත සිතියම් සකස් කිරීම මෙම වසරේ දී සකසා අවසන් කර ඇත.




ගවේෂණයට ලක්කරන ලද උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන සහිත සිතියම

## අන්තර්ජාලයට තොරතුරු ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය

භූ ගෝලීය දත්ත ක්‍රමාංක (GPS ඛණ්ඩාංක) ඡායාරූප හා විස්තර ඇතුළත්ව අන්තර්ජාලයට තොරතුරු ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය මගින් මූලිකව මානව සම්පත් ප්‍රවර්ධනය මෙම වසරේ දී සිදුකළ අතර රුවන්වැලි මහා සෑය සහ ආශ්‍රිත ප්‍රදේශයේ භූ ගෝලීය දත්ත ක්‍රමාංක ලබාගැනීම හා තොරතුරු අන්තර්ජාලයට ඇතුළත් කිරීමේ මූලික කටයුතු සිදුකර ඇත. 2017 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත පුරාවිද්‍යා සමුළුවේ දී මෙහි කටයුතු අවසන් කර වෙබ් පිටුව එළි දැක්වීමට ද අපේක්ෂිත ය.

ඇස්තමේන්තුගත ව්‍යාපෘතීන්ට අමතරව පුරාවස්තු විනාශය වැලැක්වීමේ ඒකකය මගින් ලබාගත් තොරතුරු උපයෝගී කරගනිමින් 2016 වර්ෂයේ පුරාවස්තු විනාශයන් සිදුවීම් සම්බන්ධ සිතියම සැකසීම ආදිය ද මෙම ඒකකය මගින් සිදු කර ඇත.

## පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘති

2016 වසරේ උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අදාළව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නියෝජිත ආයතනයක් විසින් පුරාවිද්‍යා හානි ඇගයුම් සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තාව ලබා දී ඇත.

මීට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ස්ථාන පරීක්ෂාවක් සිදුකර එම නිරීක්ෂණ වාර්තාවෙන් නිදහස් කරන ලද ව්‍යාපෘති පහත සඳහන් පරිදි වේ.

උතුරු පළාත - ව්‍යාපෘති 04

නැගෙනහිර පළාත - ව්‍යාපෘති 09

බස්නාහිර පළාත - ව්‍යාපෘති 08

දකුණු පළාත - ව්‍යාපෘති 10

වයඹ පළාත - ව්‍යාපෘති 07

සබරගමුව පළාත - ව්‍යාපෘති 03

ඌව පළාත - ව්‍යාපෘති 10

මධ්‍යම පළාත - ව්‍යාපෘති 16

උතුරුමැද පළාත - ව්‍යාපෘති 14

ඛනිජ ව්‍යාපෘති සඳහා යෝජිත භූමියේ පෞරාණික සාධක පරීක්ෂාකොට නිර්දේශ ලබාදීම.

2016 ජනවාරි මස සිට 2016 සැප්තැම්බර් දක්වා ඛනිජ හා පාෂාණ නිස්සාරණ සඳහා ලබාදුන් නිර්දේශ සංඛ්‍යාව පහතින් සඳහන් වේ.

| දිස්ත්‍රික්කය | නිර්දේශ සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුරය | 217 |
| අම්පාර | 51 |
| කළුතර | 70 |
| බදුල්ල | 43 |
| කෑගල්ල | 37 |
| කොළඹ | 60 |
| ගම්පහ | 172 |
| ගාල්ල | 86 |
| කුරුණෑගල | 179 |
| ත්‍රිකුණාමලය | 29 |
| පුත්තලම | 42 |
| හම්බන්තොට | 105 |
| වව්නියාව | 08 |
| රත්නපුරය | 112 |

## බස්නාහිර පළාත

**කොළඹ දිස්ත්‍රික් ගවේෂණය - සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2010 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම කොළඹ දිස්ත්‍රික් ගවේෂණ ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද්දේ කොළඹ දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වන දෙහිවල, තිඹිරිගස්යාය, සීතාවක, කැස්බෑව, හෝමාගම, කඩුවෙල, මහරගම, කොලොන්නාව, කෝට්ටේ, රත්මලාන, මොරටුව, පාදුක්ක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දොළහක් ආවරණය වන පරිදි පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරකවල තොරතුරු නම්කර දත්ත ගබඩාවක් සැකසීම හා ඒවා ඉදිරි පුරාවිද්‍යා කටයුතුවල දී අධ්‍යයන සඳහා භාවිතයට ගැනීමේ අරමුණ ඇතිවය.

එහි දී පළමු අදියර යටතේ කොළඹ කොටුව හා පිටකොටුව ආශ්‍රිත ප්‍රදේශය ආවරණය වන පරිදි කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ගවේෂණය කර වාර්තාගතකොට ඇති අතර 2016

වර්ෂයේ දී එහි දිගුවක් ලෙස සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 14 ක් ආශ්‍රිතව මෙම ගවේෂණ ව්‍යාපෘතිය දියත් කරන ලදී.

කොළඹ දිස්ත්‍රික් අවසාන මායිම වන අවිස්සාවේල්ල තල්දූව පාලමේ සිට කොළඹ දෙසට සීතාවක/හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 14 ක් පුරා මෙම ගවේෂණ ව්‍යාපෘතිය මෙහෙයවන ලද අතර එහි දී ලෙන් වාසස්ථාන ඇතුළු, පුරාවිද්‍යා ස්ථාන, පැරණි නිවස, ජනප්‍රවාදවල සඳහන් ස්ථාන රැසක තොරතුරු දත්ත ගොනුවක් වශයෙන් සකසා ගැනීමට එම ව්‍යාපෘතිය මඟින් අවකාශ ලැබී ඇත. තව ද ඉංග්‍රීසි පාලන සමයට අයත් රෝහල් ගොඩනැගිලි, තානායම, අශ්වගාල, වෙඩි බෙහෙත් ගබඩාව දුම්රිය ස්ථානය මෙන් ම තවත් පැරණි නිවාස රාශියක් මෙම ගවේෂණයේ දී වාර්තාගත කිරීමට හැකි විය.

එහි දී වසර සියය ඉක්මවා ඇති පැරණි නිවාස රාශියක් පෞද්ගලික අයිතිකරුවන් වෙනස් කිරීම්වලට බඳුන් කර තිබීම හේතුවෙන් ඒවායේ පැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ඉවත්ව ඇති බව එම ගවේෂණ ඇසුරින් හඳුනා ගන්නා ලදී. තව ද අවිස්සාවේල්ල ''සීතා ලෙන'' පරිශ්‍රයට යන මාවත අවහිර කර පෞද්ගලික ඉඩම් හිමිකරුවන් විසින් එය අත්පත් කරගෙන තිබීම හේතුවෙන් හා එම ලෙන ජනාවාස වී තිබීම හේතුවෙන් නඩත්තු අංශය වෙත එය පිළිසකර කිරීමට යොමුකිරීම මේ ගවේෂණයේ දී සිදු වූ අතුරු ප්‍රතිඵල ලෙස සැළකිය හැකි ය.

01 2016 වර්ෂයේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුන වෙනුවෙන් දෛනික ස්ථාන පරීක්ෂාකිරීම් රාශියක් සිදුකළ අතර, ඒ අතර ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති, අනවසර කැණීම් පරීක්ෂා කිරීම් හා දෛනික ස්ථාන පරීක්ෂා කිරීම් සිදුකර ඇත.

02 කැළණි ගංගාවේ මධ්‍ය නිම්න කලාපයේ දකුණු ඉවුර ගවේෂණය සිදුකරන ලද අතර පූගොඩ සිට බණ්ඩාරවත්ත දක්වා දකුණු ගං ඉවුරේ ඇති ග්‍රාම නිලධාරී වසම් 19 ක් අනාවරණය වන පරිදි බියගම හා දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම ගවේෂණය සිදුකර ඇත.

03 චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වසරේ දී ඕලන්ද කෞතුකාගාරය තුළ ඇති චංචල පුරාවස්තු ලේඛනගතකිරීම් සිදුකරන ලද අතර, එහි දී එම කෞතුකාගාරය තුළ ඇති පුරාවස්තුන්වලින් කොටසක් පමණක් ලේඛනගත කිරීම් කටයුතු සිදුකර ඇත.

## වයඹ පළාත

### හංගමුව රජමහා විහාරය ගවේෂණය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 387 හංගමුව ග්‍රාම නිලධාරී වසමේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. කුරුණෑගල මඩගල ප්‍රධාන මාර්ගයේ කුඹුක්ගැටේ නගරය පසුකර කිලෝමීටර් 2 ක් පමණ පැමිණ, හංගමුව මංසන්ධියෙන් දකුණු දෙසට ඇති අතුරු මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගමන්කළ විට මෙම ස්ථානය හමු වේ.

හංගමුව පුරාවිද්‍යා ස්ථානයේ ඇති පර්වත ආශ්‍රිතව බෑවුම්වල පිහිටි කටාරම් සහිත ලෙන් ක්‍රිස්තු පූර්ව 3 සියවස - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් කාල පරාසයේ දී භික්ෂූන් විසින් භාවිතයට ගෙන ඇත. අනුරාධපුර මධ්‍ය භාගය වනවිට මෙම ලෙන් ආරාම සංකීර්ණ වශයෙන් සංවර්ධනයට පත්ව ඇති

බව ක්‍රිස්තු වර්ෂ 4 - 7 සියවසට අයත් ස්තූප, ප්‍රතිමා ගෘහය, ආවාස, පොකුණු වැනි ගොඩනැගිලි සාධක මගින් හඳුනාගත හැකි ය. අනුරාධපුර පශ්චාත් සමයේ එනම් ක්‍රිස්තු වර්ෂ 8 - 10 සියවසට අයත් සේ සැලකෙන මධ්‍යකාලීන සිංහල අක්ෂරයෙන් ලියන ලද ශිලාලේඛනයක් මෙම පුරාවිද්‍යා භූමියෙන් හමුවන අතර එම යුගයේ දී මෙම විහාරස්ථානය ''හකර වහර'' හෙවත් බොරළු විහාරය නමින් හඳුන්වා ඇත. මෙම විහාරස්ථානයේ මළුවෙහි සිදුකළ කැණීමෙන් ක්‍රිස්තු වර්ෂ 7 වන සියවසට පමණ අයත් ලෝහමය බෝධිසත්ව ප්‍රතිමාවක් හමු වී ඇත. අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට අනුරාධපුර පශ්චාත් සමය දක්වා දීර්ඝකාල පරිච්ඡේදයක් තුළ සංවර්ධනයට පත් මෙම විහාරස්ථානය සියවස් ගණනාවක් පුරා අභාවිතව වල්බිහි වී විනාශයට පත්ව ඇති බව හඳුනාගත හැකි ය.

වර්තමාන විහාර භූමියේ උතුරු දෙසින් ස්තූපයක නටබුන් දක්නට ලැබේ. සෙන්ටිමීටර් 40 ක් පමණ උසැති චතුරස්‍රාකාර වේදිකාවක් මත විශ්කම්භය මීටර් 7 ක් පමණ ද උස මීටර් 2 ක් පමණ ද වන මෙම ගරා වැටුණු ස්තූපය පිහිටා තිබේ. ස්තූපයේ සිට මීටර් 40 ක් පමණ දුරින් නැගෙනහිර දෙසින් නටබුන් වූ ප්‍රතිමා ගෘහයකි. දිග මීටර් 10 ක් ද පළල මීටර් 7 ක් පමණ වන ගොඩනැගිල්ලේ ප්‍රධාන ප්‍රවේශය බටහිර දිශානුගතව පිහිටා ඇත. මෙම ප්‍රතිමා ගෘහයට දකුණු දෙසින් කටාරම් සහිත ලෙනකි. මෙහි ලෙන් විවරයට ප්‍රතිවිරුද්ධ දෙසින් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියූ ලිපි ත්‍රිත්වයකි. එයින් එක් ලිපියක් ක්‍රිස්තු වර්ෂ 8 - 10 සියවසට අයත් වහරල ලිපියකි. එමෙන් ම මෙම පර්වත පෘෂ්ඨයේම ක්‍රිස්තු වර්ෂ 8 - 10 සියවස්වලට අයත් ශිලාලේඛනයක් ද දක්නට ලැබේ.

මෙම කටාරම් ලෙනෙහි බටහිර දෙසින් මීටර් 20 ක් පමණ දුරින් ඕවලාකාර හැඩැති පැරණි පොකුණකි. පොකුණට ඊශාන දෙසින් පොකුණට බැසීමට තැනූ පියගැට පෙළක් පැවති බවට සාධක හමු වේ. වැසි ජලය වෙනත් පොකුණකට ගලායන පරිදි පොකුණ නිර්මාණය කර තිබේ. මෙම පොකුණට බටහිර දෙසින් චතුරශ්‍රාකාර තවත් එවැනි ම පොකුණකි. විහාර භූමියේ තැනින් තැන ශෛලමය මල් ආසනයක්, සිරිපතුල් ගලක්, සඳකඩපහන්, කොරවක්ගල් වැනි පුරාවස්තු විසිරී තිබෙනු දැකිය හැකි ය.

කටාරම් ලෙන ආශ්‍රිතව හමු වූ ක්‍රිස්තු වර්ෂ 5, 6, 7 සියවස්වලට අයත් ශිලාලේඛන සහ ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් මධ්‍යකාලීන අක්ෂරයෙන් ලියන ලද ශිලාලේඛන කිහිපයකි. එයින් 9 - 10 සියවස්වලට අයත් මධ්‍යකාලීන අක්ෂරයෙන් ලියන ලද ලේඛනය Inscriptions of Ceylon (Vol V) Part III මඟින් ප්‍රකාශයට පත්කර ඇත.

**ගුරුගොඩ පුරාවිද්‍යා ස්ථානය ගවේෂණය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 131 ගුරුගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානයෙහි ඇති පුරාවිද්‍යාත්මක නටබුන් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීම අවම කර ගැනීමත් පුරාවිද්‍යාත්මක නටබුන් හඳුනාගැනීමත් යන අරමුණින් ක්‍රියාත්මක කරන ලදී.

කුරුණෑගල - අනුරාධපුර මාර්ගයේ අඹන්පොල ප්‍රධාන නගරයෙන් ඇහැටුවැව මාර්ගයේ කිලෝමීටර් 5ක් පමණ ගමන්කර අතරගල්ල මංසන්ධියෙන් දකුණු දෙසට ඇති අතරගල්ල වැව මාර්ගයේ ගමන්කර අතරගල්ල වැව් බැම්ම මතින් දකුණු දෙසට ඇති මාකේ කොලනිය මාර්ගයේ කිලෝමීටර් 5 ක් පමණ ගමන් කළවිට මෙම ස්ථානය හමු වේ.

ක්‍රිස්තු පූර්ව 900 ත් ක්‍රිස්තු වර්ෂ 1 - 2 සියවස අතර කාල පරිච්ඡේදයේ මෙරට ගොඩනැගුණු සංස්කෘතිය පිළිබඳ තොරතුරු හමුවන්නේ මෙගලිතික සුසාන තුළිනි. ඒ අනුව මී ඔය පදනම්කර ගෙන බිහි වූ මෙගලිතික සුසාන සම්ප්‍රදායත් එයට ආසන්නව පසුකාලීනව අක්කර 5 ක පමණ භූමියක ව්‍යාප්ත වූ විහාරාරාම සංකීර්ණයකින් ද සමන්විත භූමියකි. මෙහි දී ප්‍රතිමා ගෘහ, සන්නිපාන ශාලා, සංඝාවාස, ගබඩා ගෙවල්, පොකුණුවලින් සමන්විත මෙම භූමිය ගවේෂණය කර වාර්තාගත කරන ලදී.

විහාර භූමියේ ස්වභාවික ගල්තලාවක් මත පිහිටි ස්තූපය චතුරශ්‍රාකාර ප්‍රාකාරයකින් වටකොට ඇත. ස්තූප මළුවේ කෙළවර සිට මීටර් 3 ක් පමණ ඇතුළතින් සක්කගල් භාවිතයෙන් කළ වේදිකාවක් මත ස්තූපය නිර්මාණය කර තිබේ. මෙම වේදිකාව දිග මීටර් 16.80 ක් ද පළල මීටර් 3 ක් ද උස සෙන්ටිමීටර් 80 ක් ද වේ. මෙහි මළුව මත ගඩොල් හා මැටි අතුරා පැවති බවට සාධක හමු වේ. ස්තූපයේ ප්‍රවේශ දොරටුව නැගෙනහිර දිශානුගතව පිහිටා ඇති අතර එයට අයත් ගොඩනැගිලි දොරටු අංග වන සඳකඩපහන, කොරවක්ගල් අවට විසිර තිබේ. ස්තූප මළුව මත සිරිපතුල් ගලක්, ඡත්‍රයක් වැනි වෘත්තාකාර නිර්මාණයක් දක්නට ලැබේ. ස්තූපයේ සිට ගිණිකොණ දෙසින් මීටර් 20ක් පමණ දුරින් පිහිටි ගල්තලාවේ දකුණු දෙසින් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියන ලද පේළි තුනකින් යුත් ශිලාලේඛනයකි. එය ක්‍රිස්තු වර්ෂ 5, 7 සියවස්වලට අයත් වහරල ලිපියක් බව හඳුනා ගන්නා ලදී. ගල්තලාවට නැගෙනහිර දෙසින් ගොඩනැගිලි නටබුන් සහිත ස්ථානයකි. ගොඩනැගිල්ලේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව එය උපෝසථඝරයක් විය හැකි ය. දිග මීටර් 12.70 ක් ද පළල මීටර් 8.40 ක් ද වන මෙහි සිට වූ ගල්කණු 12 ක් ද පොළොව මත පතිත වූ ගල්කණු 6 ක් පමණ ද දක්නට ලැබේ. මෙහි ප්‍රවේශ දොරටුව දකුණු දිශානුගතව යොදා තිබේ. විහාර භූමියේ තැනින් තැන ජලය බැසයාමට සැකසූ කාණු, කේතුකාවාට, පොකුණක්, ගලේ කෙටූ පියගැට පෙළ, ගල්කටු සිඳුරු සහිත ස්ථානයක් වැනි සාධක විසිරී තිබෙනු දැකිය හැකි ය.

**විල්පත්තු වනෝද්‍යානයේ වයඹ පළාතට අයත් කලාපය ගවේෂණය**

පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුක්කුලම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි විල්පත්තු වනෝද්‍යානයේ වයඹ පළාතට අයත් කලාපය තුළ විධිමත් පුරාවිද්‍යාත්මක ගවේෂණයක් සිදුකර නොමැති බැවින් මෙම ගවේෂණය 2016.10.17 දින සිට 2016.10.28 දින දක්වා ක්‍රියාත්මක කරන ලදී. පුත්තලම සිට මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 37 ක් පමණ ගමන්කළ විට මෙම වනෝද්‍යානයට ප්‍රවේශ විය හැකි ය.

විල්පත්තු වනෝද්‍යානයේ බටහිර සීමාව වනුයේ මුහුදු වෙරළ තීරයයි. කලා ඔය මෝය සිට මෝදරගංආරු දක්වා වූ මෙම මුහුදු තීරය තුළ කොල්ලන්කනත්ත, පලුගතුරේ, කුදිරමලේ සහ පුත්තලම යන ස්ථාන පිහිටා ඇති අතර භූ විද්‍යාත්මක පර්යේෂණවලට අනුව මයෝසීන හුණුගල්

තට්ටුව මෙම ප්‍රදේශය පුරා විහිදේ. එම හුණුගල් තට්ටුව රතුවැලි පස් තට්ටුවකින් වැසී පවතින අතර මෙය ඉරණමඩු පස් සැකැස්ම ලෙස හඳුන්වයි. මෙහි රතුපස් ස්ථරය තුළින් ප්‍රාග් ඓතිහාසික සාධක හමු වේ. එමෙන් ම පූර්ව ඓතිහාසික යුගය නියෝජනය කෙරෙන පොම්පරිප්පු සුසාන භූමිය අයත් ප්‍රදේශය ද මෙම ගවේෂණ කලාපයට අයත් ය.

විල්පත්තු අභය භූමියට අයත් වයඹ කලාපය තුළ පිහිටි භූමිය ගවේෂණයේ දී පුරාවිද්‍යා ස්ථාන 10 ක් සහ ඒ ආශ්‍රිත ස්මාරක 32 ක් අනාවරණය කරගත හැකි විය. එම ස්ථාන නම්,

(01) කුදිරමලය පුරාවිද්‍යා නටබුන්

(02) කොල්ලන්කනත්ත - පලුගතුරේ දක්වා වෙරළ තීරයේ ජනාවාස සාධක

(03) විල්පත්තු උද්‍යානය තුළ පිහිටි "කුවේණි මාලිගය" යනුවෙන් හඳුන්වන බෞද්ධ ආගමික සංකීර්ණයකට අයත් ගොඩනැගිලි

(04) ගල්ගේ විහාර නටබුන්

(05) විල්පත්තු උද්‍යානය තුළ පිහිටි පූක්කුලම ධීවර ගම්මානයෙහි පුරාවිද්‍යාත්මක සාධක

(06) ගොඩනැගිලි නටබුන් - පල්ලිවාසකුලම්

(07) සුරුවම් ඇළ ආශ්‍රිත පුරාවිද්‍යා නටබුන්

(08) පට්ටිඑළිය ටැම් ලිපිය

(09) පොම්පරිප්පු පූර්ව ඓතිහාසික සුසාන භූමිය

(10) විල්පත්තු උද්‍යානය තුළ පිහිටි වැලිවෙහෙර නටබුන් යන ස්ථාන ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක නටබුන් විසිර පවතී.

### 01 කුදිරමලය පුරාවිද්‍යා නටබුන්

රතු පස් තට්ටුව (Iranamadu Formation) සැකැස්ම සහිත භූමියේ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් පිළිබඳ සාධක හමු විය. එහි දී ශිලා මෙවලම් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා කහඳ සහ තිරුවානා යන පාෂාණ දෙවර්ගයම මේ ආශ්‍රිතව දැකගත හැකි ය. මෙහි දී භාවිත කළ ආයුධ සහ ආයුධ නිෂ්පාදනයේ දී ඉවත දමන ලද කහඳ පතුරු සහ බෝල ගල් කැබලි සුලභව දැකගත හැකි ය.

කුදිරමලේ තුඩුව ආශ්‍රිතව මුහුදට ආසන්නව ඇති මෙම පැරණි ඉදිකිරීම සඳහා බහුල ලෙස ගඩොල් ද ඊට අමතරව හුණුගල් සහ සක්කා ගල් ද භාවිත කර තිබේ. මෙම ගොඩනැගිලි සාධක අතර දිගු පුළුලින් මීටර් 20x20 ප්‍රමාණයේ ගොඩැල්ලකි. මෙය එක් ගොඩනැගිල්ලක් ලෙස පැවතියේ ද ගොඩනැගිලි කිහිපයක් ලෙස පැවතියේ ද යන්න තීරණය කිරීමට අපහසු තරමට මේ මත පසුකාලීනව කළ ඉදිකිරීම් සහ අනවසර කැණීම් නිසා භූමිය විකෘති වී ඇත. මෙම ගොඩැල්ල මත පසුකාලීනව මීටර් 5x5 ප්‍රමාණයේ ගඩොලින් වේදිකාවක් ඉදිකර ඒ මධ්‍යයේ ඉදිකළ අශ්වයෙකුගේ මූර්තියකි. මේ වනවිට එම අශ්ව මූර්තිය විනාශ වී ඇති අතර එහි කොටස් මේ ආශ්‍රීතව දැකගත හැකි ය. මෙම ඉදිකිරීම සඳහා එහි වූ පැරණි ගොඩැල්ලට අයත් ගඩොල් භාවිත කළ බව අනුමාන කළ හැකි ය.

නටබුන් වූ මෙම අශ්ව මූර්තිය ඉදිරියෙන් (දකුණු දිශාවෙන්) ගැඹුර මීටර් 15 ක් පමණ වූ මුහුදු ඉවුරේ හරස්කඩ පරීක්ෂා කිරීමේ දී මතුපිට භූමියේ සිට මීටර් දෙකක් පමණ ආරම්භ වී භූ අභ්‍යන්තරයට දිවෙන ගඩොල් බැම්මක් දැකගත හැකි ය. ඉහතින් විස්තර කළ විනාශ වූ අශ්ව මූර්තිය සහිත ස්ථානයට මීටර් 30 ක් පමණ දකුණු දිශාවෙන් පිහිටි ගොඩැල්ලකි. දිගින් මීටර් 12 ක් ද පළලින් මීටර් 6 ක් ද වූ මෙම ගොඩැල්ලේ උස මීටර් 10 ක් පමණ වේ. ගොඩැල්ලේ උතුරු අර්ධයේ පස සෝදා යාමත් සමඟ මතුපිටට නිරාවරණය වූ ලෝකඩ මූර්තියක් මෙහි දී හමුවිය. ඛාදනය වී ඇති මෙහි දැනට පවතින උස සෙන්ටිමීටර් 14 ක් ද පළල සෙන්ටිමීටර් 16 ක් ද වේ. මෙම ලෝකඩ මූර්තියේ නිර්මාණාත්මක ලක්ෂණ අනුව එය පොළොන්නරු යුගය හා සමකාලීන දේව රූපයක් බව කිව හැකි ය.

කුදිරමලේ තුඩුවෙහි නැගෙනහිර කොටසේ ඉදිකරන ලද මුස්ලිම් සොහොනකි. මෙය මුස්ලිම් ප්‍රභූවරයෙකුට අයත් සොහොනක් වශයෙන් සැලකේ. දිග මීටර් 5.10 ක් පළල මීටර් 1 ක් ද වන මෙහි උස සෙන්ටිමීටර් 45 කි. මතුපිට පෘෂ්ඨය ඕවලාකාර හැඩයකට නිමවා ඇති මෙම ස්මාරකය මේ වනවිට විනාශ වී යමින් පවතී.

මෙම පරිශ්‍රයෙන් රත් මැටි බඳුන් (RW), රත් දුඹුරු බඳුන් (RBW) වාර්තා වන අතර කළු රත් මැටි බඳුන් (BRW) බඳ කැබලි 3 ක් වාර්තා විය. කාලරක්ත මැටි බඳුන් [Black and red Ware (BRW)] සාමාන්‍යයෙන් ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රිස්තු වර්ෂ 2 වන සියවසෙහි අග භාගය දක්වා මෙරට භාවිත වූ බවට සැලකෙන බැවින් හමු වී ඇති එම වර්ගයට අයත් යැයි සිතිය හැකි බඳ කොටස් කැබැල්ල ක්‍රිස්තු වර්ෂ 3 වන සියවස හෝ ඊට පෙර කාලයට අයත් ලෙස සැලකිය හැකි ය.

**02. කොල්ලන්කනත්ත - පලූගතුරේ දක්වා වෙරළ තීරයේ ජනාවාස සාධක**

කොල්ලන්කනත්ත නාවික හමුදා කඳවුර අසලින් මුහුදු වෙරළ සහ ඒ ආශ්‍රිත මීටර් 20 ක් පමණ ගොඩබිම් තීරය ඉලක්ක කර ගනිමින් මෙහි ගවේෂණ කටයුතු ආරම්භ කරන ලදී. කොල්ලන්කනත්ත, පලූගතුරේ සිට කුදිරමලය දක්වා මුහුදු වෙරළ නිරීක්ෂණය කිරීමේ දී ක්‍රම ක්‍රමයෙන් ගොඩබිම උස්වන ස්වරූපයක් දක්නට ලැබුණි. එමෙන් ම කොල්ලන්කනත්ත හා පලූගතුරේ අතර ගොඩබිම ඛාදනය වීම නිසා ප්‍රදේශය බොක්ක හැඩයට නිර්මාණය වී ඇත. තවද මෙම වෙරළ තීරයේ ඉවුරෙහි හරස්කඩ පරීක්ෂා කිරීමේ දී එය වැලි තට්ටුවකින් සහ හුණුගල් ස්ථරයකින් නිර්මාණය වී ඇති බව පැහැදිලි වේ.

මෙම වැලි සහ හුණුගල් තීරය අතර බහුල ලෙස මැටි බඳුන් කැබලි සිර වී ඇති අතර ඉවුරු ඛාදනයත් සමඟ මුහුද දෙසට ගැලවී ගිය හුණුගල් තට්ටු අතරත් මැටි බඳුන් කැබලි සිර වී තිබෙනු දැක ගත හැකි ය.

ලිඛිත සාධකවලට අනුව ලක්දිව මුල් ජනාවාසයක් වන උරුවෙල ග්‍රාමය පිහිටි ප්‍රදේශය ලෙස අනුමාන කරන මෙහි දුටුගැමුණු රජු දවස මුතු හමු වූ බව ද කියවේ. එමෙන් ම සුභ රජු විසින් මෙහි පිහිටි වල්ලි විහාරය තනවන ලදැයි සැලකේ. දිවයිනේ බටහිර වෙරළෙහි පිහිටි මෙම ප්‍රදේශය දීර්ඝ කාලයක සිට ම වෙළඳ කටයුතු උදෙසා වැදගත් විනැයි සිතිය හැකි ය.

කොල්ලන්කනත්ත වෙරළ ආසන්නව මෙරටට ආවේණික ශාකයක් නොවන Baobab වෘක්ෂයක් ඇති අතර එම විදේශිකයින් මෙරටට හඳුන්වා දුන් ශාකයකි. ලංකාව තුළ මෙවැනි ශාක කිහිපයක් හඳුනාගත හැකි ය.

### 03. විල්පත්තු උද්‍යානය

විල්පත්තු උද්‍යානය තුළ පිහිටි "කුවේණි මාලිගය" යනුවෙන් හඳුන්වන බෞද්ධ ආගමික සංකීර්ණයකට අයත් ගොඩනැගිලි වේ. මෙම ගොඩනැගිල්ල වටා නිරීක්ෂණය කිරීමේ දී තවත් නටබුන් වූ ගොඩනැගිලිවලට අයත් සාධක සහිත ස්ථාන 05 ක් සහ දාගැබ් ගොඩනැගිල්ලක් හඳුනාගත හැකි විය. දාගැබ් ගොඩැල්ල ආශ්‍රිතව ඇති මෙහි හමුවන සියලු ම ඉදිකිරීම් බෞද්ධාගමික සංකීර්ණයකට අයත් ගොඩනැගිලි බව හඳුනාගත හැකි ය.

මෙහි වූ මහල් ප්‍රමාණය නිශ්චිතව තීරණය කළ නො හැකි වුව ද බිම් මහලේ ඇති ගල්කණුවල විශාලත්වය අනුව මහල් දෙකකට වැඩි ප්‍රමාණයක් මේ සමග පැවති බව අනුමාන කළ හැකි ය. ගල්කණුවලින් ආවරණය වන භූමි සීමාව තුළ කිසිදු දිශාවකින් මේ සඳහා ප්‍රවේශ දොරටු තිබූ බව හඳුනාගත හැකි සාධක ශේෂව නො පවතී. මෙහි ගෙබිම සෙන්ටිමීටර් 50 ක් පමණ උසැති පස් තට්ටුවකින් පිරී පවතින අතර මේ මත සිදු කරනු ලබන කැණීමක් මගින් විශාල තොරතුරු ප්‍රමාණයක් අනාවරණය කරගත හැකි ය.

ඉහතින් විස්තර කළ ගොඩනැගිල්ල ආසන්නයේ මධ්‍යම ප්‍රමාණයේ නටබුන් වූ දාගැබකි. මෙහි විෂ්කම්භය සෙන්ටිමීටර් 30 ක් වන අතර උස මීටර් 8 ක් පමණ වේ.

### 04. ගල්ගේ විහාර නටබුන්

කලා ඔය සිට මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 07 ක් ගියවිට සුරුවම් හන්දිය හමු වේ. එහි සිට නාඩුවිල මාර්ගයේ කිලෝමීටර් 29 ක් පමණ ගියවිට මෙම ස්ථානය හමු වේ.

තැන තැන දැකගත හැකි ගල්තලා සහ ගල්කුළුවලින් සමන්විත මෙම ස්ථානය විල්පත්තු වනෝද්‍යානය තුළ "ගල්ගේ විහාරය" නමින් ප්‍රකට ය. මෙහි ගල්කුළු ආශ්‍රිතව කටාරම් ලෙන් 05ක් දැකගත හැකි ය. ඉන් එක් කටාරම් ලෙනක ක්‍රිස්තු පූර්ව 1 වන සියවසට අයත් සෙල්ලිපියකි. එම ලිපියෙන් "කඩහලක වැව" යන නම සඳහන්ව තිබේ. මෙම සාධකවලට අමතරව මෙම ස්ථානයේ ගල්කුළක් මත ඉදිකරන ලද දාගැබ් ගොඩැල්ලකි. තවද ගොඩනැගිලි සඳහා ගල් පුවරු වෙන්කර ගැනීමට පැවති ගල් කටු සිදුරු කළ ස්ථානයක් වූ බවට සාධක සපයන කැපුම් සලකුණු සහිත ගල් කුට්ටි මෙම ස්ථානය ඇසුරෙහි දැකගත හැකි ය. තවද මෙම ස්ථානය ආශ්‍රිතව ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඉදි වූ වැවක් සහ පොකුණක් මෙම නටබුන් අතර වේ. සමස්ත නටබුන් පිළිබඳ නිරීක්ෂණය කිරීමේ දී ක්‍රිස්තු පූර්ව 1 වන සියවසට අයත් දියුණු ආරාම සංකීර්ණයක් මෙහි පැවති බව නිගමනය කළ හැකි ය. පිහිටි පෙළොවේ සිට මීටර් 30 ක් පමණ වූ ගල් තලාවක් මත මෙම දාගැබ් ගොඩැල්ලකි. විෂ්කම්භය මීටර් 750 ක් සහ උස සෙන්ටිමීටර 60 ක් පමණ වූ මෙම ගොඩැල්ල මධ්‍යයේ වළක් හාරා ඇත. එම වළ විෂ්කම්භයෙන් සෙන්ටිමීටර 02ක් සහ ගැඹුර සෙන්ටිමීටර 1 1/2 ක් වේ. මෙහි මධ්‍යයෙහි හාරා ඇති වළ පරීක්ෂා කිරීමේ දී ගඩොල් වරි 08ක්

දැක ගත හැකි විය. මේ ආසන්නයේ තිබී දාගැබ් නිර්මාණය සඳහා භාවිත වන මෝල්ඩින් ගඩොල් කැබලි හමු විය. මේ සඳහා ප්‍රවේශය සැලසූ පියගැට පෙළ ඊශාන දිශාවෙන් තිබූ බවට සාධක සපයන සකස් කළ ගල් පඩි කිහිපයක් එම දිශාවෙන් දැක ගත හැකි ය.

**05. විල්පත්තු උද්‍යානය තුළ පිහිටි පූක්කුලම ධීවර ගම්මානයෙහි පුරාවිද්‍යාත්මක සාධක**

එළුවන්කුලම කලාඔය (කෝස්වේ) සිට මන්නාරම දක්වා මාර්ගයේ කිලෝමීටර් 35 ක් ගොස් වම්පසට දිවෙන අතුරු මාර්ගයේ කිලෝමීටර් 03 ක් පමණ ගියවිට මෙම ධීවර ගම්මානය හමු වේ. කුදිරමලේ සිට කිලෝමීටර් 03 ක් පමණ උතුරු දෙසින් පිහිටි පුත්තලම ධීවර ගම්මානය ආශ්‍රිතව සිදු කළ ගවේෂණයේ දී විනාශ වී ගිය පැරණි ගොඩනැගිලි සංකීර්ණයකට අයත් සාධක හඳුනාගත හැකි විය.

මෙහි ඇති ධීවර ගම්මානයට ගිනිකොණ දිශාවෙන් පූක්කුලම පැරණි වැව පිහිටා ඇත. එය ප්‍රමාණයෙන් අක්කර 10 ක් පමණ වේ. මෙම වැව කේන්ද්‍ර කර ගනිමින් අතීතයේ පැවති ජනාවාසයක සාධක වැවට බටහිරින් සහ වයඹ දිශාවෙන් දැකගත හැකි ය.

**06. ගොඩනැගිලි නටබුන් - පල්ලිවාසකුලම්**

කලා ඔයේ සිට මන්නාරම් මාර්ගයේ කිලෝමීටර් 02 ක් පමණ ගියවිට වම්පසින් විල්පත්තු රක්ෂිතය තුළ පිහිටි වෙල් යායක් පුරන්වීම නිසා ඇති වූ පිට්ටනියකි. එම පිට්ටනිය දිගේ බටහිර දෙසට මීටර් 500 ක් පමණ ගියවිට මෙම ගොඩනැගිලි සාධක හමු වේ.

පැරණි ගොඩනැගිල්ලකට අයත් නටබුන් සහිත මෙම ස්ථානයේ සිට වූ ගල්කණු 7 ක් දක්නට ලැබේ. විවිධ උස ප්‍රමාණයන්ගෙන් යුතු මෙම ගල්කණු අතරින් උස ම ගල්කණුවේ උස මීටර් 1 ක් වන අතර පළල සෙන්ටිමීටර් 20 කි. සිට වූ මෙම ගල්කණුවලට අමතරව දිගේලි වූ ගල්කණුවක් ද මේ ආශ්‍රිතව දැකගත හැකි ය. ගල්කණුවල ව්‍යාප්තිය අනුව ගොඩනැගිල්ල දිගින් මීටර් 5 ක් ද පළලින් මීටර් 4.30 ක් ද වේ.

**07. සුරුවම් ඇළ ආශ්‍රිත පුරාවිද්‍යා නටබුන්**

කලාඔය සිට මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 07 ක් පමණ ගියවිට සුරුවමක් හමු වේ. එම සුරුවම අසලින් දකුණට ඇති විල්පත්තු උද්‍යාන මාර්ගයේ කිලෝමීටර් 07 ක් පමණ ගියවිට මාර්ගය හරහා ඇළ මාර්ගයක් ගමන් කරයි. "සුරුවම් ඇළ" නමින් හඳුන්වන එම ඇළ මාර්ගයේ දකුණු දෙසට මීටර් 50 ක් පමණ ගියවිට රක්ෂිතය තුළ පිහිටි මෙම නටබුන් හමු වේ.

එම නටබුන් අතර කවන්ධ පිළිමයක් සහිත නටබුන් වූ ගොඩනැගිල්ලක් දැක ගත හැකි වේ. මෙම ගොඩනැගිල්ල මත ඇති පිළිමය මුල් සන්දර්භයට අයත් බව පැහැදිලි ය. ඒ අනුව මෙය පිළිම ගෙයක නටබුන් බව තහවුරු වෙයි. මේ ආශ්‍රිතව දාගැබ් ගොඩැල්ලක් සහ අත්තාණි කණුවක් ද දැකගත හැකි ය. මෙහි හමුවන සියලූ ම පුරාවිද්‍යා නටබුන් අනුරාධපුර යුගය හා සමකාලීන වේ.

නටබුන් වූ මෙම පැරණි ගොඩනැගිල්ල මධ්‍යයේ ගල්කණුවකට ආධාර කොට තබා ඇති කවන්ධ හිඳි පිළිමයකි. උස සෙන්ටිමීටර් 95 ක් වූ මෙම පිළිමයෙහි දෙදණ අතර පළල සෙන්ටිමීටර් 95 ක් ද දෙවුර අතර පළල සෙන්ටිමීටර් 80 ක් ද වේ. මෙහි එක් බාහුවක් වැලමිට ළඟින් වෙන් වී ඇති අතර අනෙක් බාහුවෙහි මැද කොටස විනාශ වී තිබේ. මෙම පිළිමය අනුරාධපුර යුගයේ නිර්මාණ ලක්ෂණ පිළිබිඹු වන බව පැහැදිලි වේ.

### 08. **පට්ටි එළිය ටැම් ලිපිය**

කලාඔය සිට මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 07 ක් ගියවිට සුරුවමක් හමු වේ. එම සුරුවම අසලින් දකුණට ඇති විල්පත්තු උද්‍යාන මාර්ගයේ කිලෝමීටර් 7.5 ක් පමණ ගියවිට මාර්ගය ආසන්නයේ දකුණු පසින් මෙම ටැම් ලිපිය පිහිටා ඇත.

**අත්තාණි කණුව**

මෙහි උපරිභාගය කැඩී වෙන් වී මෙම ස්ථානයේ ම දක්නට ලැබේ. ඇල වී ඇති මෙහි උස මීටර් 01 කි. පළල සෙන්ටිමීටර් 31 කි. මෙම කණුවෙහි තුන් පැත්තක අක්ෂර කොටා ඇති අතර එක් පසෙක ඉර, හඳ, බලු කපුටු සලකුණු කොටා ඇත. මෙහි දැක්වෙන අක්ෂර අනුව ක්‍රිස්තු වර්ෂ 8-10 සියවස් කාල පරාසයට අයත් බව නිගමනය කළ හැකි ය.

### **09. විල්පත්තු උද්‍යානය තුළ පිහිටි වැලිවෙහෙර නටබුන්**

කලා ඔය (කෝස්වේ සිට) මන්නාරම දක්වා මාර්ගයේ කිලෝමීටර් 02 ක් පමණ ගියවිට පොම්පරිප්පු පුරාණ සුසාන භූමිය හමු වේ. එයට කිලෝමීටර් 02 ක් පමණ නැගෙනහිරින් ඇති නටබුන් වූ දාගැබ් ගොඩැල්ලකි. පොළොව මට්ටමේ සිට අඩි දෙකක් පමණ උසින් තැනූ වේදිකාවක් ගොඩනගා ඒ මත ඉදිකර ඇති මෙම දාගැබ විෂ්කම්භයෙන් මීටර් 20 ක් පමණ වේ. මෙහි මනා ලෙස සකසන ලද ගල් පුවරු භාවිතයෙන් සලපතල මළුව ඉදිකර ජලය බැස යාම සඳහා කාණුවක් ද සකස් කර ඇත. සලපතල මළුවට අයත් ගල් පුවරුවක ශිලාලේඛනයක් දැක ගත හැකි ය. පස්වලින් වැසී දුර්වර්ණව ඇති මෙම ලිපියෙහි අක්ෂර කිහිපයක් පමණක් හඳුනාගත හැකි විය. අක්ෂර රටාව අනුව එය ක්‍රිස්තු වර්ෂ 8 වන සියවසට පමණ අයත් ශිලාලේඛනයකි. මෙම ස්ථානය "වැලිවෙහෙර" නම් වූ බව එහි සඳහන් වේ. (1956 පාලන වාර්තාව)

මහාවංශයට අනුව වැලිවෙහෙර ක්‍රිස්තු වර්ෂ 1 වන සියවසේ දී සුභ රජු විසින් "උරුවෙල්" දනව්වෙහි කරවූවකි. විජයගේ ඇමතිවරයෙකු විසින් අනුරාධපුරයේ සිට යොදුන් 05 ක් (සැතපුම් 40) බටහිරින් "උරුවෙල් දනව්ව" පිහිටවූ බව මහාවංශයේ සඳහන් වේ. ඒ අනුව මෙම ජනපදය කලාඔය මෝය අසල පිහිටා තිබිය යුතුය. වැලිවෙහෙරේ පිහිටීම මෙම තොරතුරු හා ගැලපෙයි. නටබුන් වූ මෙම දාගැබ් ගොඩැල්ලේ සලපතල මළුව මත කුඩා කවන්ධ හිඳි බුද්ධ ප්‍රතිමා දෙකකි. මෙම පිළිමවල නිර්මාණාත්මක ලක්ෂණ අනුරාධපුර අවදිය හා සැසඳි දාගැබ් ගොඩැල්ලේ බටහිර දිශාවෙන් මේ සඳහා ප්‍රවේශ වීමට තිබූ පියගැට පෙළක් දැකගත හැකි ය. එම පියගැට පෙළ අන්තයෙහි කැටයම් රහිත සඳකඩපහණකි. දාගැබ් ගොඩැල්ල මධ්‍යයේ අනවසර කැණීම් වළවල් දෙකක් දැකගත හැකි ය. මෙහි බටහිර දෙසින් වූ වේදිකා කොටස 1978 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණ කටයුතු ආරම්භ කොට පසුව නවතා දමා ඇති බව පෙනී යයි.

1956 දී මෙහි සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කටයුතුවල දී පැරණි රිදී හිල් කාසියක්, කේසර රහිත සිංහ රූපයක්, සතයේ තඹ කාසි දෙකක් සහ බෙහෙවින් දිරාගිය රෝම කාසියක් හමු වී ඇත. (1956 පාලන වාර්තාව) මෙම දාගැබ් ගොඩැල්ල කේන්ද්‍ර කර ගනිමින් ඉදිකරන ලද තවත් ගොඩනැගිලි කිහිපයක නටබුන් මේ ආසන්නයේ දැකගත හැකි ය.

## නැගෙනහිර පළාත

**අම්පාර/මඩකලපුව දිස්ත්‍රික්ක**

**අම්පාර මඩකලපුව දිස්ත්‍රික්කවල ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු**

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි සියලු ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු සිදුකර ඇත. ඒ අනුව

01. අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිතව වාර්තාවන පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන ආරක්ෂාකර ගැනීම හා සංවර්ධන ව්‍යාපෘති සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාදීම.

02. අනවසර කැණීම් හා පුරාවස්තු විනාශයන් පිළිබඳ ස්ථාන පරීක්ෂා කිරීම් හා එවැනි සිදුවීම්වලින් පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සංවිධානය කිරීම යන කටයුතු මේ යටතේ සිදු විය. ඒ අනුව අනවසර කැණීම්, හානි ඇගයුම් හා සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිත ස්ථාන පරීක්ෂාකිරීම් යන කටයුතු මේ යටතේ සිදු විය.

## දකුණු පළාත

**(ගාල්ල/මාතර දිස්ත්‍රික්ක)**

**චංචල පුරාවස්තු ලේඛනගත කිරීම (2 අදියර) ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාල්ල කොටුව සහ 96 ජී චීන කොරටුව ග්‍රාම නිලධාරී වසම්වලට අයත් ගාල්ල කොටුවට ප්‍රවේශ වන පැරණි ඕලන්ද කොටු දොරටුවෙන් දකුණු දිශාවට ගමන් කළවිට සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය පිහිටා ඇත.

ගාල්ල දීර්ඝ කාල පරිච්ඡේදයක දී ප්‍රධාන වෙළඳ නගරයක් වශයෙන් භාවිත වූ අතර පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසීන් විසින් කුළුබඩු හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්කොට ගන්නා ලදී. මේ අනුව දීර්ඝ ඉතිහාසයකට අයත් පුරාවිද්‍යාත්මක සාධක මෙම කෞතුකාගාරයේ ඇති පුරාවස්තූන් තුළින් විද්‍යමාන වේ.

සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පුරාවස්තු සංචිතය පරීක්ෂා කිරීමේ දී එහි සාගරය හා සබඳතා සහිත ජීව විද්‍යාත්මක හා මානව වංශ විද්‍යාත්මක පුරාවස්තු රාශියකින් සමන්විත බව පැහැදිලි ය. වර්තමාන පුරාවිද්‍යාත්මක ස්මාරකයක් ලෙස සැලකෙන ලන්දේසීන්ගේ ගබඩාවක් ලෙස (1671) භාවිතයට ගන්නා ලද විශාල ප්‍රමාණයේ ගොඩනැගිල්ල තුළ පුරාවස්තු තැන්පත් කර ඇති අතර එහි පිහිටි රසායනාගාරය තුළ දී පුරාවස්තු සංරක්ෂණයට භාජනය කර ඇත.

ශ්‍රී ලංකාවේ සිදුකරන ලද දියයට කැණීම් අතර වැදගත් තැනක් ලබාගත් කැණීමක් ලෙස දක්ෂිණ සාගරයේ ගාලු මුහුදේ ගිලුණු ඇවොන්ස්ටාර් නැව හඳුන්වාදිය හැකි ය. එය 1659 කාලයේ පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට අයත් නෞකාවක් වන අතර හදිසියේම මුහුදු බත් වූ මෙම නැව් සම්බන්ධයෙන් පෙර අපර දෙදිග පැවැත්වූ සබඳතා පිළිබඳ වැදගත් සාක්ෂි බොහෝමයක් හඳුනාගෙන ඇත. මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් 2001 දී මෙහි පර්යේෂණ ආරම්භකොට පුරාවස්තු ප්‍රමාණයක් මතුපිටට ගෙන රසායන සංරක්ෂණ මඟින් සුරක්ෂිතකොට මහජන ප්‍රදර්ශනයට තබා ඇත.

මීට අමතරව ගොඩවාය ප්‍රදේශයේ දී සිදුකරන ලද කැණීම් මඟින් හඳුනාගත් පුරාවස්තූන් ද ලේඛනගත කිරීමේ දී හඳුනාගත හැකි විය. ඒ අනුව මෙම ප්‍රදේශය ආශ්‍රිත කැණීම් මඟින් හඳුනාගත් පුරාවස්තු තුළින් පැරණි වරාය හා අන්තර් ජාතික වෙළඳ සබඳතා රාශියක් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකි විය. විවිධ හැඩයේ බඳුන් වර්ග හා ඉන්දු රෝම කාසි විශාල ප්‍රමාණයක් හමු වූ පුරාවස්තු අතර වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ද ගොඩවාය මුහුදේ 2008 දී පමණ පර්යේෂණ ආරම්භ කර ඇති අතර හඳුනාගත් පුරාවස්තු බොහොමයක් සංරක්ෂණයෙන් පසු මහජන ප්‍රදර්ශනයට තබා ඇත.

එමෙන් ම කුඩා රාවණා කෝට්ටේ සහ මහා රාවණා කෝට්ටේ නමින් හැඳින්වෙන කිරින්ද ප්‍රදේශයට ආසන්න මුහුදේ ගිලුණු නැව් සම්බන්ධයෙන් කළ පර්යේෂණවලින් මතුකර ගත් පුරාවස්තු සංචිතයක් ද මෙහි සංරක්ෂණ මට්ටමෙන් ප්‍රදර්ශනයට තබා ඇත. ඉන් සමහරක් ද මෙම ලේඛනගතකළ පුරාවස්තු දත්ත මත හඳුනාගත හැකි ය.

2012 වර්ෂයේ දී නැගෙනහිර පළාත් උප්පුවේලි ප්‍රදේශයේ මුහුද ආශ්‍රිතව සිදුකරන ලද නැවේ කැණීම් කටයුතු සම්බන්ධයෙන් කළ පර්යේෂණවලින් මතුකරගත් පුරාවස්තු සංචිතයක් ද මෙහි සංරක්ෂණ මට්ටමෙන් ප්‍රදර්ශනයට තබා ඇත. ඉන් සමහරක් ද මෙම ලේඛනගතකළ දත්ත මත හඳුනාගත හැකි ය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමුද්‍ර කෞතුකාගාරයේ පුරාවස්තු ලේඛනගත කිරීම මූලික ලෙස 2015 වර්ෂයේ දී සිදුකරන ලද අතර මෙහි දී පුරාවස්තු 31 ක් ලේඛනගත කරන ලදී. 2016 වර්ෂය සඳහා ද 2015 වර්ෂයේ ලේඛනගතකළ ක්‍රමවේදයම භාවිතයට ගන්නා ලදී.

### කෑගල්ල දිස්ත්‍රික්කය

### කෑගල්ල දිස්ත්‍රික්කයේ චංචල පුරාවස්තු ලේඛනගතකිරීම

මෙම ව්‍යාපෘතිය කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගම්මන ග්‍රාමයේ පිහිටි බෙලිගම්මන පොත්ගුල් විහාරයේ ඇති චංචල පුරාවස්තු ප්‍රමාණාත්මකව හඳුනාගැනීම හා වාර්තාගත කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලදී. කොළඹ මහනුවර මාර්ගයේ මාවනැල්ල සිට මහනුවර දෙසට කිලෝමීටරයක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පැමිණිය හැකි ය.

19 වන සියවසේ මුල් කාලපරිච්ඡේදයේ ආරම්භ කරන ලදැයි සැලකෙන මෙම විහාරස්ථානයේ ධර්ම ශාලාව සහ පොත්ගුල මහනුවර යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් සමන්විත ය. මෙම විහාරස්ථානයේ ඇති පුරාවස්තු අතරින් 90%ක් පමණ මහනුවර යුගයේ නිර්මාණාත්මක ලක්ෂණවලින් සමන්විත ය.

මෙම ව්‍යාපෘතිය මගින් බුද්ධ ප්‍රතිමා ඇතුළු පුරාවස්තූන් 127 ක් සහ පුස්කොළ ග්‍රන්ථ 160 ක් පමණ වාර්තාගත කරන ලද අතර මේ අනුව චංචල පුරාවස්තු 287 ක් වාර්තාගත කර ඇත. එයින් මහනුවර යුගයේ නිර්මිත පුරාවස්තු වැඩි ප්‍රමාණයක් ඇති බව හඳුනා ගැනුණි. වාර්තාගත කරන ලද පුරාවස්තු අතරින් නිර්මිත මාධ්‍ය අනුව පහත සඳහන් පරිදි පුරාවස්තු වර්ගීකරණය කරන ලදී.

| **නිර්මිත මාධ්‍ය** | **පුරාවස්තු ප්‍රමාණය** |
|---|---|
| පිත්තල හා තඹ මිශ්‍ර ලෝහ පුරාවස්තු | 68 |
| තඹ ලෝහයෙන් නිර්මිත පුරාවස්තු | 01 |
| සින්ක් මිශ්‍ර ලෝහයෙන් නිර්මිත පුරාවස්තු | 06 |
| ලෝකඩ මාධ්‍යයෙන් නිර්මිත පුරාවස්තු | 03 |
| ලෝකඩ/තඹ/පිත්තල | 01 |
| දාරුමය පුරාවස්තු | 18 |
| ඇත්දළ | 06 |

## චංචල පුරාවස්තු ලේඛනගත කිරීම

**අත්තරගම රජමහා විහාරයේ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම.**

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අත්තරගම රජමහා විහාරය වෙත කටුගස්තොට මැදවල මාර්ගයේ කිලෝමීටර් 7 ක් පමණ ගමන් කළ විට ළඟා විය හැකි ය. 2016.11.01 දින සිට 2016.11.31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වූයේ අවසන් වාර්තාව සකස් කිරීමයි.

මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය කාලය තුළ අපරාධකරුවන් සඳහා වෙන් ව අතහරින ලද ගම යන අර්ථයෙන් ''අත්තරගම'' ග්‍රාම නාමය සැකසී ඇතැයි ජනප්‍රවාදයේ කියවේ. ක්‍රි. ව. 1800 දී පමණ මෙම විහාරය ආසන්නයේ වූ පල්කුඹුර විහාරය සමඟ ඇති වූ ගැටුමකින් පල්කුඹුර වැසියන් මෙම විහාරයේ පැවති නිර්මාණ විනාශ කළ බැවින් අත්තරගම වැසියන් පල්කුඹුරට ගොස් එහි වූ ශිලා කැටයම් මෙහි රැගෙන එන ලද බවට ජනප්‍රවාදගත තොරතුරුවල සඳහන් වේ. නිර්මාණාත්මක ලක්ෂණවලට අනුව අත්තරගම ශිලා නිර්මාණ 19 වන සියවසට අයත් විය හැකි ය. මේ අනුව 2014 වර්ෂයේ දී ලේඛනගත කරන ලද තොරතුරු ඇතුළත් වර්ණ ඡායාරූප සහිත වාර්තාව පිටපත් 4 කින් යුක්තව වාර්තා සැකසීම මෙම ව්‍යාපෘතියෙන් සිදු විය.

## ඌව පළාත

### බදුල්ල දිස්ත්‍රික්කය

### ස්ථාන පරීක්ෂා හා ක්ෂේත්‍ර කටයුතු

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් සියලු ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ක්ෂේත්‍රය පරීක්ෂා කර වාර්තා කර පුරාවිද්‍යා නිර්දේශයන් ලබා දීම, පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන ආරක්ෂිත පියවර සංවිධානය මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා ක්‍රියාත්මක කර ඇත.

ස්ථාන පරීක්ෂා හා ක්ෂේත්‍ර කටයුතු - 2016 ඇස්තමේන්තුවට අනුව බදුල්ල දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත වන පරිදි පහත කාර්යයන් ඉටුකරන ලදී.

- ගල් බිඳුම් හා ඛණිජ කැණීම් නිර්දේශ ලබාදීම
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණය
- අනවසර කැණීම් හා පුරාවස්තු මංකොල්ලකෑම් පිළිබඳ පරීක්ෂාවන් හා වාර්තා සම්පාදනය
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ වාර්තා සම්පාදනය

ස්ථාන පරීක්ෂා හා ක්ෂේත්‍ර කටයුතු - 2016 ඇස්තමේන්තුවට අනුව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්ත වන පරිදි ස්ථාන පරීක්ෂා කිරීම් 359 ක් සිදු කරන ලදී.

- ගල් බිඳුම් හා ඛණිජ කැණීම් නිර්දේශ ලබාදීම - 273
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණ - 22
- අනවසර කැණීම් හා පුරාවස්තු මංකොල්ලකෑම් පිළිබඳ පරීක්ෂා කර වාර්තා සැපයීම - 36
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම - 28

### මොණරාගල දිස්ත්‍රික්කය

රහතන් කන්ද ආරණ්‍ය සේනාසනය ගවේෂණයට අදාළ 2016 වර්ෂයේ ඇස්තමේන්තුව ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද අතර 2016 මැයි මාසයේ සිට පරිපාලන කටයුතු බදුල්ල හා මොණරාගල කාර්යාල දෙක වෙන්ව සිදු කරන ලද බැවින් ගවේෂණ කාර්යය ඉටු කරන ලද්දේ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය මඟිනි.

### රහතන් කන්ද ගවේෂණය

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රහතන්ගම ග්‍රාමයේ රහතන් කන්ද කඳුවැටිය පිහිටා තිබේ.

වැල්ලවාය මොණරාගල මාර්ගයේ බුත්තල නගරය පසුකර මොණරාගල දෙසට කිලෝමීටර් 2ක් පමණ ගමන් කළවිට කරන විට මාර්ගයේ දකුණුපස පිහිටි මෙම විහාර භූමිය හමු වේ. රහතන් කන්ද කඳුවැටිය ආශ්‍රිතව විසිරී ඇති පුරාවිද්‍යාත්මක සාධක හඳුනා ගැනීමත්, වාර්තාගත කිරීමත්, පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ලියාපදිංචි කිරීමත්, ස්මාරකවල ආරක්ෂාව සඳහා පියවර ගැනීමත්, යන අරමුණින් මෙම ගවේෂණය ක්‍රියාත්මක කරන ලදී.

මූලික වශයෙන් භූමිය හඳුනාගෙන පුරාවිද්‍යා වටිනාකම වාර්තාකිරීම මෙන් ම අදාළ භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත ස්මාරකයක් ලෙස ලියාපදිංචි කිරීම හා ස්මාරකවල ඉදිරි ආරක්ෂාව සඳහා පියවර ගැනීම වෙනුවෙන් දත්ත රැස් කිරීම මෙම ගවේෂණයේ අරමුණ විය.

රහතන්කන්ද ආරණ්‍ය සේනාසනය අනුරාධපුර යුගයේ සිට භික්ෂු සංඝයාගේ වාස භූමියක් වශයෙන් සැළකිය හැකි ය. දුටුගැමුණු හා සද්ධාතිස්ස කුමරු අතර පැවති සටන සම්බන්ධව මෙන් ම දුටුගැමුණු කුමරුගේ සංග්‍රාමික මාර්ගය සම්බන්ධව සඳහන් විස්තර අතර බුත්තල හෙවත් ගුත්තහාල සම්බන්ධව නිතර සාහිත්‍යමය මූලාශ්‍ර හා ජනප්‍රවාදයේ තොරතුරු සඳහන් වේ.

''චූලාංගනී පිටි යුද්ධය'' ලෙස මහාවංසයේ දැක්වෙන දුටුගැමුණු කුමරු හා සද්ධාතිස්ස කුමරු අතර ඇති වූ සටනේ දී පැරදුණු දුටුගැමුණු කුමරු පලා ගොස් කප්පකන්ද නදියේ ජවමාලීතොට දක්වා පසුබැස ගිය බවත් කියවේ. දුටුගැමුණු රජුගේ යුධ ගමන් මාර්ගය මෙම රහතන් කන්ද කඳු වැටියට සමාන්තරව ගමන් කළ බවට තොරතුරු ථූප වංශයේ සඳහන් වේ. එහි දී ඒ හල, ගී කිත්ත, කිරගම, නියමුල්ල, මැදගම, උයන්තොට, තුන්ගම් කසටපිටිය යන ස්ථාන පසුකළ බව සඳහන් වේ. ශිලාලේඛන සහිත හා රහිත කටාරම් කෙටූ ලෙන් 22ක් ද, ස්වභාවික ලෙනක් ද, පියගැට පෙළ, ස්තූප ගොඩැලි, නටබුන් ගොඩැල්ල, ස්වභාවික පොකුණ වැනි අනුරාධපුර යුගයට අයත් නිර්මාණාත්මක ලක්ෂණවලින් යුත් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථානයක් වශයෙන් මෙය සැලකිය හැකි ය.

ඒ අනුව මෙම ගවේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. මෙම භූමි භාගය මත පා ගමනින් ගමන් කරමින් ක්ෂේත්‍ර ගවේෂණයක් සිදුකර පුරාවිද්‍යාත්මක සාධක වාර්තාගත කිරීම හා ඡායාරූප ගැනීම, සැලසුම් මඟින් වාර්තාගතකොට අවසාන ශාස්ත්‍රීය වාර්තාව ඉදිරිපත් කිරීම.

2. මෙම ස්මාරක අතර ප්‍රධාන ස්තූපයට අමතරව ඇති නටබුන් ගොඩැලි සහ ස්තූප ගොඩැලි කැණීම්කර හඳුනාගැනීම සංරක්ෂණය සඳහා යොමුකිරීම පුරාවිද්‍යාත්මක ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කිරීම.

## උතුරුමැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

**පැරණි යෝධ ඇළ හා බැම්මට අයත් රක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම - ස්ථානීය ගවේෂණය.**

අනුරාධපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ගවේෂණ අංශය මගින් 2016 වර්ෂයේ දී යෝධ ඇළෙහි සීමිත භූමි ප්‍රදේශයක මෙම ගවේශන ව්‍යාපෘතිය දියත් කරන ලදී. මෙහි අරමුණු වූයේ මහවැලි අධිකාරිය මඟින් කරන ලද ඉල්ලීමකි.

යෝධ ඇළ හා අවට භූමිය පෞරාණික භූමි කොටසක් බැවින් එම භූමියෙහි පදිංචිකරුවන්ට භූමියෙහි නීත්‍යානුකූල අවසරය ලබා දීමට මහවැලි අධිකාරිය මඟින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ එකඟතාවය අපේක්ෂා කරන ලදී.

පැරණි යෝධ ඇළ කලා වැවෙන් ආරම්භ වී අනුරාධපුරයේ තිසා වැවට ජලය ගෙන ඒමට නිර්මාණය කර ඇති අතර කලා වැවෙහි සිට තිසා වැව දක්වා ජලය ගෙන එන ගමන් මාර්ගය අතරතුර දී වැව් බොහෝ ගණනකට දියවර සපයමින් අතීත කෘෂිකර්මාන්තය කෙරෙහි අනඟි මෙහෙයක් ඉටු කර ඇති අතර විවිධ සතුරු ආක්‍රමණ හා ලෙඩ රෝග හේතුවෙන් රජරට වල් බිහි වීමත් සමඟ වාරි මාර්ග සියල්ලම පාහේ අභාවයට ගොස් ඇත.

පසුකාලීනව ඉංග්‍රීසි පාලන සමයේ දී වල් බිහි වී ගිය වාරි කර්මාන්තයන් ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි ඉංග්‍රීසි නිළධාරීන් දැක්වූ උනන්දුව හමුවේ කලා වැව හා ඊට අයත් වාරි අංග ප්‍රතිසංස්කරණය කර ඇත. 1889 දී ඉංග්‍රීසි ජාතික මැණුම් නිළධාරීන් විසින් යෝධ ඇළ යටතෙහි ජලය ලබා ගන්නා ඉඩම් සම්බන්ධයෙන් මැණුමක් සිදුකර ඇත. මෙම මැණුමෙන් සකස් කරන ලද පිඹුර ගවේශනයේ දී වඩාත් උපකාරී විය.

මෙම පිඹුර හා මහවැළි අධිකාරියෙන් ලබා දෙන ලද සැළසුම්වලට අදාළව කෝන්වැව සිට බටුවත්ත දක්වා වූ කිලෝමීටර් 8 ක පමණ භූමි ප්‍රදේශය ඇතුළත් විය. මෙම ගවේශනය මඟින් පැරණි යෝධ ඇළ බැම්ම මත පදිංචිකරුවන්, ඇළ රක්ෂිතයට ආසන්න පදිංචිකරුවන්, ඇළ හා බැම්ම මත අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාත්මකව හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. දීර්ඝ කාලයක් පුරා සිදුකරන ලද මානව ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයක් ලෙස පැරණි යෝධ ඇළ බැම්මෙහි වර්තමානයේ ද විද්‍යමාන වනුයේ සුළු වපසරියක් පමණි. අතීතයේ දී යෝධ ඇළෙන් ඉටු වූ කාර්යය වර්තමානයෙහි නව ජය ගඟෙන් සැපයෙන දියවර මඟින් ඉටු වෙයි.

සීමිත භූමි ප්‍රදේශයක සිදුකරන ලද මෙම ගවේශනයේ දී පැරණි යෝධ ඇළට අයත් පස් බැම්ම සම්පූර්ණයෙන් කඩා ඉවත්කර ඒ මත නිවාස තනා ගනිමින් ද, විටෙක පැරණි බැම්මෙහි පැතිකඩක් පමණක් කපා ඉවත්කර ඒ මත නිවාස සහ පොදු පහසුකම් (වැසිකිළි) සඳහා වූ ඉදිකිරීම් ද ඇළෙහි මධ්‍ය කොටස කේන්ද්‍ර කරගනිමින් ගෙවතු වගාවන් හා ස්ථිර බෝග වගා කර භූමිය සංවර්ධනය කර ඇති ආකාරය ද ගවේශනය තුළින් නිරීක්ෂණය විය. පැරණි ඇළෙහි ජලපහර හැරවීම සඳහා නිර්මාණය කරන ලද සකස් කරන ලද පාෂාණයෙන් ඉදිකර ඇති සොරොව්ව බ්‍රිතාන්‍ය අවධියේ දී නවීකරණයට ලක්වී ඇති ආකාරය හඳුනා ගන්නා ලදී.

ගවේෂණයේ දී ඒකරාශී කරගත් තොරතුරු පදනම් කරගනිමින් පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වශයෙන් බෙහෙවින් වැදගත් ශේෂිත පැරණි යෝධ ඇළ බැම්ම කෙරෙහි මූලික අවධානය යොමු කරමින් නේවාසික කළාපය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීම සුදුසු බව සඳහන්කර පහත සඳහන් යෝජනාවලිය මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.

නව ජය ගඟ නිර්මාණය වීම තුළින් පැරණි යෝධ ඇළ අභාවයට යාම හේතුවෙන් අජීවී භූමි කොටසෙහි නව ජනාවාස ස්ථානගතව ඇත. නේවාසික කළාපය මුළුමනින් ම ඉවත්කර සමස්ථ භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා ආරක්ෂා කිරීමට යෝග්‍ය පරිදි පැරණි ඇළට හා එහි බැම්මට අයත් සාධක වර්තමානයෙහි ඉතිරිව නොමැත. සංවර්ධන කටයුතු ඉටු නො කළ කොටසෙහි පමණක් සාධක ශේෂ වී පවතී. එබැවින් පැරණි ඇළ හා බැම්ම සම්පූර්ණයෙන් ඉතිරිව ඇති කොටස් සඳහා ප්‍රේරක කළාපයක් නම්කිරීමත්, ඇළ බැම්ම හා ඊට අයත් ප්‍රදේශයෙහි නව ඉදිකිරීම් සඳහා අවසර නො දිය යුතු බවට වගකිව යුතු ආයතන දැනුවත් කළ යුතු බවත්, ශේෂිත ස්මාරක සහිත ප්‍රදේශය පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස ගැසට් කිරීම යෝග්‍ය බවත්,

තෝරාගන්නා ලද පැරණි ඇළෙහි ඉතිරි වී ඇති කොටසක් සංරක්ෂණය කර ආරක්ෂා කර ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩ සැළසීමත්, යෝධ ඇළ ගම්මානයේ පදිංචිකරුවන් සඳහා නිත්‍යානුකූල අවසර නොමැති බැවින් එවැන්නක් ලබා දෙන්නේ නම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසර ඇතිව තිර්ණායකයන් හෝ විකල්ප ලබා ගැනීම සුදුසු බවත්, ගවේශනයේ දී හඳුනාගන්නා ලද පැරණි ඇළ හා බැම්මට අයත් භූමිය නිවැරදිව මැණුම් කර සිතියම්ගත කර මායිම් ගල් යෙදීමෙන් අනතුරුව පමණක් ඉඩම් කොටස් නිදහස් කිරීම යෝග්‍ය බවත් යන යෝජනා ඉදිරිපත් කරන ලදී.

**මැද ශාලාව (මැද වාඩිය) ගවේෂණය**

ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය (උතුරුමැද) ගවේශන හා ලේඛනගත කිරීම් අංශය මඟින් 2016 වර්ෂයේ දී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුංගාවිල ග්‍රාම නිලධාරී වසමේ සෝමාවතී වන ජීවී උද්‍යානය තුළ පිහිටි "මැද ශාලාව" පුරාවිද්‍යා ස්ථානය ගවේශනය කරන ලදී.

ප්‍රදේශයට අදාළ පොලිස් ස්ථානය මඟින් කරන ලද දැනුම් දීමකට අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගයකට අනුව මැද ශාලාව නම් වූ මෙම ස්ථානය ගවේශන ආරම්භ කරන ලදී. ගවේශනය කරන ලද වකවානුව වන විටත් නිධන් සොරුන්ගෙන් හා වන සතුන්ගේ ක්‍රියාවන් හේතුවෙන් ස්මාරක දැඩි ලෙස විනාශ වී තිබිණි. මහවැලි නිම්නයෙහි අඩතැන්නට අයත් භූමියෙහි ස්මාරක පිහිටා ඇති බැවින් වාර්ෂික ජල ගැලීම්වලට ද ලක් වී ඇත. මෙම ගවේශනයේ දී මැදශාලාව ස්මාරක පරිශ්‍රයේ වූ ස්තූප දෙකක්, ගොඩනැගිලි දෙකක්, හා විනාශ වී ගිය ස්මාරකයන්ට අයත් පැරණි උළු, ගඩොල් භූමිය පුරා විසිරී තිබූ අතර ඒවායේ නිර්මාණාත්මක ලක්ෂණ අනුව අනුරාධපුර අවධියට අයත් බව හඳුනා ගන්නා ලදී.

ගවේශනය අවසානයෙහි පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

01) සුංගාවිළ සෝමාවතිය අතරෙහි පවතින ස්මාරකයන් සංරක්ෂණය කර ප්‍රදර්ශනය සඳහා සැකසීම

02) සෝමාවතී වනජීවී රක්ෂිතය තුළ පිහිටි පුරාවිද්‍යා ස්මාරක ආරක්ෂාකර ගැනීමේ වැඩපිළිවෙලක් කඩිනමින් සංවිධානය කිරීම එම යෝජනා අතර වේ.

**චේතියගිරි රජමහා විහාරය ස්ථානීය ගවේෂණය**

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 310 පුවරසන් කුලම ග්‍රාම නිළධාරී වසමේ පිහිටි චේතියගිරි විහාරය සහිත භූමිය 2016 වර්ෂයේ දී අනුරාධපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ගවේශන අංශය මඟින් මූලික කරුණු දෙකක් පදනම් කරගනිමින් ගවේශනය කරන ලදී.

01) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද අභ්‍යාසලාභී සංවර්ධන නිළධාරීන්ට පුරාවිද්‍යා ස්මාරක වාර්තාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමත්

02) භූමියෙහි විසිරී ඇති ස්මාරකයන් ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මෙම ගවේෂණයේ අරමුණ විය.

උතුරු දකුණු දිශානුගතව විහිදෙන ගල් තලාව හා ඊට අයත් භූමිය පාදක කරගනිමින් මෙම ස්මාරක සංකීර්ණය අතීතයේ ඉදිකර ඇති බව ස්මාරක විසිරී ඇති ආකාරයෙන් හඳුනාගත හැකි ය. ගල් තලයෙහි නිර්මාණය කරන ලද පියගැට පේළි, ශෛලමය බැමි, උපෝසථඝරයක් යැයි හඳුනාගත හැකි ඉදිකිරීමක්, වෙනත් අවශේෂ ඉදිකිරීම් අක්කර 05 ක පමණ භූමියක් පුරා විසිරී ඇති බව හඳුනා ගන්නා ලදී. මෙයට අමතරව ශෛලමය බැම්වලට අයත් ගල් පුවරුවල සටහන් කරන ලද පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් සටහන් කරන ලද ලේඛන කිහිපයක් ද, අනුරාධපුර අවධියට අයත් නිර්මාණ ලක්ෂණ සහිත ශෛලමය ප්‍රතිමා කොටස් ද මෙම භූමියේ තිබී හඳුනා ගත හැකි විය.

ස්මාරක සහිත භූමියෙහි ම වර්තමාන විහාරස්ථානයට අයත් ඉදිකිරීම් සිදුකර ඇති අතර මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ව නිර්දේශයක් ලබාගෙන නොමැත. මේ හේතුවෙන් ඉපැරණි ස්මාරකයන්හි සන්දර්භය විනාශයට ලක්ව ඇත.

ගවේශණයේ දී හඳුනාගත් කරුණුවලට අදාළව යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ අතර භූමිය ආරක්ෂිත ස්මාරක සහිත භූමියක් ලෙස ගැසට් කිරීමත් ස්ථානය හැඳින්වීමේ නාම පුවරු යෙදීමත්, පැරණි ස්තූපය කැණීම් කර සංරක්ෂණය කිරීම යෝග්‍ය බවටත්, වර්තමාන ඉදිකිරීම් සිදු කිරීමේ දී පුරාවිද්‍යා නිර්දේශය ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවත් විහාරාධිපති දැනුවත් කිරීම සුදුසු බවත්, ස්ථානය ආරක්ෂා කිරීම සඳහා දීමනා රැකවල්කරුවකු යෙදීම යෝග්‍ය බවත් යන යෝජනා ඉදිරිපත් කරන ලදී.

**නාමළු සිංහගිරි විහාරය ගවේෂණය**

2016 වර්ෂයේ දී අනුරාධපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ගවේශන අංශය මඟින් මෙම ගවේශන ව්‍යාපෘතිය සිදුකරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව හා පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් වන කන්දේගම හා වම්බටුවැව ග්‍රාම නිළධාරී වසම්වලට ද අයත්ව නාමළු සිංහගිරි විහාරය හා ඊට අයත් භූමිය පිහිටා ඇත.

විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා භූමිය නිදහස් කිරීම හා මායිම් නිරවුල් කිරීම සඳහා ස්මාරක විසිරී ඇති භූමිය හඳුනාගැනීම මෙම ගවේශනයේ අරමුණ විය. කහල්ල කඳුවැටියට බටහිරින් කඳු බෑවුමෙහි පිහිටා ඇති වනජීවී රක්ෂිත කළාපයට අයත් අක්කර 30 ක පමණ වූ භූමි ප්‍රදේශයක පුරාවිද්‍යා ස්මාරක විසිරී ඇති බව ගවේශනයේ හඳුනාගන්නා ලදී. කඳු බෑවුමෙහි වර්තමාන විහාරස්ථානයට අයත් නව ඉදිකිරීම් සිදුකර ඇති භූමිය පුරාත්, කඳුවැටියේ ආරම්භයේත් අතීත ස්මාරකයන්ට අයත් සාධක විසිරී ඇති ආකාරය හඳුනාගන්නා ලදී.

වර්තමාන විහාරස්ථානය පිහිටි භූමියෙහි ටැම්පිට විහාරයකට අයත් කෙටි ගල් කණු සහිත ස්ථානය, අනුරාධපුර අවධියට අයත් ප්‍රතිමා ගෘහයේ පාදම මත ඉදිකරන ලද මහනුවර අවධියට අයත් බුද්ධ මන්දිරය, ගල් කණු සාධක මඟින් පෙන්නුම් කරන පැරණි ආවාස කුටි 05 කට අයත් නෂ්ටාවශේෂ, පැරණි දාගැබ සහිත ස්ථානයේ ඉදිකර ඇති වර්තමාන දාගැබ, අවශේෂ ස්මාරකයන්ට අයත් පාදම් ගල්, ගල් පුවරු, කැසිකිළි හා වැසිකිළි ගල් ආදී චංචල පුරාවස්තු රාශියක් ද විසිරී ඇති ආකාරය දැකගන්නට ලැබිණි.

කඳුවැටිය ආරම්භයේ ස්වාභාවික ජල උල්පතක් ආශ්‍රය කරගනිමින් අනුරාධපුර අවධියට අයත් ඉදිකිරීම් ලක්ෂණ සහිත සිංහ කැටයමක් සහිත ගල් පිහිල්ලක්, ඊට සම්බන්ධව ඉදිකර ඇති වර්තමානයේ ගරා වැටී ඇති ශෛලමය පුවරු ආධාරයෙන් ඉදිකර ඇති ජල ටැංකියක් මෙන් ම කඳු බෑවුම පුරා තැනින් තැන සක්ක ගලින් කරනලද වර්තමානයේ ගරා වැටී ඇති බැමි කොටස් ද දැක ගත හැකි ය.

මෙම ගවේශනය අවසානයේ දී උක්ත කරුණට අදාළව යෝජනාවලියක් සකස්කරන ලදී.

01) ගවේශනයට ලක්කරන ලද භූමියෙහි ඇති ස්මාරක ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් කිරීම

02) ස්මාරක සහිත භූමිය ආශ්‍රිතව නව ඉදිකිරීම් සිදු කිරීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව.

03) නැගෙනහිරින් පිහිටි කහල්ල කඳුවැටිය පූර්ණ ගවේශණයකට ලක් කිරීම

04) ද්විතීය සන්දර්භයට අයත් පුරාවස්තු කඩිනමින් ලේඛනගතකර වාර්තා කිරීම එම යෝජනා වේ.

# කැණීම් අංශය

## මධ්‍යම පළාත

### මාතලේ දිස්ත්‍රික්කය

**විල්ගමුව සෝණුත්තර රජමහා විහාර භූමියේ පිහිටි පැරණි ස්තූප ගොඩැල්ල කැණීම**

විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෝණුත්තර ග්‍රාම නිලධාරී වසමට අයත් ය. හසලක විල්ගමුව මාර්ගයේ නුගගොල්ල මංසන්ධියේ සිට දකුණු දෙසට කි. මී. 05 ක් පමණ ගමන් කළ විට සෝණුත්තර රජමහා විහාරයට පිවිසිය හැකි ය. මෙම රජමහා විහාරය භූමිය සහ ඒ අවට සිදු කරන ලද ගවේෂණ මගින් පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කරගෙන ඇති අතර මෑතකාලීනව මිණිපේ යෝධ ඇළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගොවි ජනපද බිහි කිරීමේ දී මෙහි පිහිටි පැරණි ස්තූප ගොඩැල්ල ඇතුළු පුරාවිද්‍යාත්මක සාධකවලට හානි සිදු වී ඇත.

විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමට අනුව මෙම ස්තූපය මතුකර සංරක්ෂණය කිරීමේ අරමුණින් 2016 අගෝස්තු මස 19 වන දින මෙම කැණීම ආරම්භ කරන ලදි. ගොඩැල්ල කැණීම සඳහා කාර්තු ක්‍රමවේදය යොදා ගන්නා ලදී. මෙහි දී මීටර් 16.70 x 16.70 ප්‍රමාණයේ සමචතුරශ්‍රාකාර වේදිකාවක් මත විශ්කම්භය මීටර් 30.20 ක් පමණ වූ ස්තූපය මතුකර ගැනීමට හැකි විය. මෙම වේදිකාව තුළ සිරිපතුල් ගල්, මල් ආසනයක්, ස්තූප දෙකක්, යූප ගලක කොටසක් හමු විය. එමෙන් ම මැටි බඳුන් අවශේෂ බහුල වශයෙන් ද පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ගඩොල් ද හමු වූ චංචල පුරාවස්තු අතර වේ. එම සාධක සහ ස්තූපයේ ආකෘතික ලක්ෂණ අනුව අනුරාධපුර පූර්ව භාගයේ දී ඉදි කරන ලද්දක් බව අනුමාන කළ හැකි ය.

### මහනුවර දිස්ත්‍රික්කය

**සිංහපිටිය පුරාවිද්‍යා ස්ථානයේ කැණීම**

උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩගම ග්‍රාම නිලධාරී වසමේ සිංහපිටිය ගමට අයත්ව පිහිවා ඇත. ගම්පොල නගරයේ සිට කි. මී. 2 ක් පමණ දොළොස්බාගේ මාර්ගයෙහි ගමන් කළ විට සිංහපිටිය පුරාවිද්‍යා ස්ථානය මාර්ගයෙහි දකුණු දෙසින් පිහිටා ඇත. මෙම ස්ථානය ගැසට් අංක 100978 යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා ගන්නා ලද ඉඩමකි. ගම්පොල අවධියට අයත් සාධක මෙහි පවතින බවට ඇති ජනප්‍රවාදගත තොරතුරු අනුව ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත 2016 මැයි 04 දින සිට ජූනි 23 දින දක්වා මෙම ස්ථානයේ කැණීම් කටයුතු සිදු කළහ.

සිංහපිටිය පුරාවිද්‍යා ස්ථානය විශාල ප්‍රදේශයක පැතිර පවත්නා බැවින් කාලය සහ පවත්නා සම්පත්වල සීමිත බව සලකා මෙම කැණීම සඳහා භාවිත කරන ලද්දේ අගල් ක්‍රමයයි. ඒ අනුව අගල් 3 ක් කැණීම් කරන ලදි. පළමු අගලෙන් ස්වාභාවික ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස තැන්පත් වූවා යැයි සිතිය හැකි ගල් කුට්ටි විසිරීමක් දැකිය හැකි විය. දෙවන අගලෙන් තරමක් විශාල ගල් කුට්ටි භාවිතයෙන් කළ ප්‍රාකාරයක ලක්ෂණ සහිත ඉදිකිරීමක අවශේෂ හමු වූ අතර තෙවන අගලෙන් බහුල ලෙස උළු කැබලි හා ගඩොල් කැබලි ද මැටි බඳුන් අවශේෂ ද හමු විය.

# දකුණු පළාත

## ගාල්ල දිස්ත්‍රික්කය

### ගාල්ල හිල්ටොප් හෝටලය පිහිටා තිබුණු භූමියෙහි පුරාවිද්‍යා හානි ඇගයුම් කැණීම

කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බණ්ඩාංකගත භූගෝලීය පිහිටීම උ. අ. $6^0$ 4.00′8″ නැ. දේ. $80^0$ 11.43′4″ ය. වර්තමාන ගාලු නගර ශාලාවට අයත් භූමියට පිටුපසින් සාගරයට ඉතා ආසන්නව හිල්ටොප් හෝටලය පිහිටා තිබිණි. එම භූමියෙහි නව හෝටලයක් ඉදි කිරීමට යෝජිත අතර ඒ සඳහා වන පුරාවිද්‍යා නිර්දේශ ලබාදීම වෙනුවෙන් හානි ඇගයුම් කැණීමක් සිදු කරන ලදි.

මෙම භූමියෙහි පර්යේෂණ වළ 4 ක් කැණීම් කරන ලද නමුදු කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයක් හමු නොවී ය.

## හම්බන්තොට දිස්ත්‍රික්කය

### මහගල්වැව මෙගලිතික සුසානය පර්යේෂණ කැණීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියවැව ග්‍රාම නිලධාරී වසමට අයත් ව පිහිටි මහගල්වැව උතුරුපස වැව් තාවුල්ල ආසන්නයේ මෙම මෙගලිතික සුසානය පිහිටා ඇත. ස්ථානයේ බණ්ඩාංකගත භූගෝලීය පිහිටීම උ. අ. $6^0$ 23′37″ නැ. දේ. $81^0$ 02′33″ ය. හම්බන්තොට සිට ගන්නොරුව හරහා සූරියවැව මාර්ගයේ කි. මී. 32 ක් දුර ගෙවා මීගහජඳුර මංසන්ධියට පැමිණ, එතැන් සිට තණමල්විල මාර්ගයේ මීටර් 200ක් පමණ දුරින් හමුවන මීගහජඳුර පාසල අසලින් දකුණට හැරී කි. මී. 3 1/2 ක් පමණ ගියවිට මහගල්වැව වැව් බැම්මට ළඟා විය හැකි ය. වැව් බැම්මේ උතුරු දෙසින් වැව් තාවුල මත සොහොන් භූමිය පිහිටා ඇත.

දකුණු පළාතට අවේණික මෙගලිතික සංස්කෘතියක් තිබේ ද යන්න අධ්‍යයනය කිරීමත්, විද්‍යාත්මක කාලනීර්ණ සඳහා නියැදි ලබා ගැනීමත්, විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කිරීමත් මෙම කැණීමෙහි අරමුණ විය. කැණීමට යෝජිත භූමිය කොටු දැල් සැලසුමකට ඇතුළත් කරන ලද අතර සොහොන් භූමියෙහි මධ්‍ය කොටසෙහි පිහිටුවන ලද දත්ත ලක්ෂ්‍යය පාදක කර ගනිමින් භූමිය කාර්තු 4 කට වෙන් කරනු ලැබී ය. මෙම භූමිය තුළ සොහොන් ස්මාරක 19 කට අදාළ සාධක නිරීක්ෂණය කරන ලද අතර එම සොහොන් සඳහා වෙන් වෙන් වශයෙන් අංක ලබා දෙන ලදි. ඉන් ප්‍රධාන වශයෙන් කැණීම් කරන ලද්දේ අංක 10 හා 13 සොහොන් වේ.

මෙම සොහොන් එකකට එකක් සමාන්තරව සහ රේඛීයව ඉදිකර ඇත. සිස්ට් ක්‍රමයට සොහොන් ඉදිකර ඇතත් වළ ක්‍රමය භාවිත කළ සෙහොන් ද වේ. මෙහි පියන්ගල සහිත සොහොන් ස්මාරක දක්නට ඇත්තේ දෙකක් පමණි.

සුසාන ද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා වූ විශාල බරණි සහ කුඩා මැටි බඳුන් මෙම කැණීමේ දී හමු වූ අතර මේවා රක්ත වර්ණ සහ කාල රක්ත වර්ණ යන වර්ගවලට අයත් වේ. සුසාන ද්‍රව්‍ය තැන්පත් කළ බඳුන් තුළින් විවිධ වර්ගවලට අයත් පබළු 44 ක් සහ ලෝහ කැබලි කිහිපයක් ද හමු වී ඇත. ද්විතියික ලෙස තැන්පත් කරන ලද පිළිස්සුණු මානව අස්ථි කොටස් ද හමු වූ අතර මේවා කාබන් 14 කාලනීර්ණයට බඳුන් කරන ලදි. මෙහි දී අංක 13 සොහොනෙහි සංසිද්ධි අංක 12 ලෙස

අංකනය කරන ලද මැටි බඳුන තුළ හා අංක 13 සොහොනට පිටින් හුදකලාව තැන්පත් කර තිබූ මැටි බඳුන තුළ වූ පිළිස්සී ගිය මානව අස්ථි කොටස් ක්‍රි. පූ. 4-2 සියවස්වලට අයත් බව තහවුරු වී ඇත.

**සිතුල්පව්ව රජමහා විහාර භූමියෙහි පුරාවිද්‍යා හානි ඇගයුම් කැණීම**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - තිස්සමහාරාම ග්‍රාම නිලධාරී වසම - රණකෙළිය බණ්ඩාංකගත භූගෝලීය පිහිටීම උ. අ. $6^{0}\ 23'$ නැ. දේ. $81^{0}\ 26'$ ය. යාල ජාතික වනෝද්‍යානයට අයත් බිම් කොටසක පිහිටි සිතුල්පව්ව පුරාවිද්‍යා රක්‍ෂිතය තුළ මෙම විහාරස්ථානය පිහිටා ඇත. තිස්සමහාරාම - කිරින්ද මාර්ගයෙහි සැ. 3 ක් පමණ ගමන් කළවිට හමුවන යෝධ කණ්ඩිය වැව පසු කළ සැනින් වම් අත දෙසට දිවෙන මාර්ගයේ සැ. 18 ක් පමණ දුරින් මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය. පැරණි ආරාම සංකීර්ණයක් වූ මෙම භූමියෙහි නව ධර්මශාලාවක් ඉදි කිරීම සඳහා සුදුසු භූමියක් තෝරා ගැනීමත් එමගින් පුරාවිද්‍යාත්මක වශයෙන් සිදුවන බලපෑම තක්සේරු කිරීමත් සඳහා මෙම කැණීම සිදු කරන ලදි.

යෝජිත භූමිය මධ්‍ය ලක්‍ෂ්‍යය වශයෙන් තෝරාගෙන සමස්ත භූමිය කාර්තු හතරකට බෙදා වෙන් කිරීමෙන් අනතුරුව සමස්ත භූමිය නියෝජනය වන පරිදි පර්යේෂණ වළ 9 ක් කැණීම් කරනු ලැබී ය. මෙම කැණීම් කටයුතු සිදු කරනු ලැබූයේ අදියර දෙකක් යටතේ වේ. පළමු අදියරේ දී කැණීම් කළ පර්යේෂණ වළවල් 5 න් වළවල් තුනක පුරාවිද්‍යාත්මක සාධක හමු වූ බැවින් දෙවන අදියර යටතේ භූමියේ උතුරු දෙසට වන්නට වූ බිම්කඩෙහි තවදුරටත් පර්යේෂණ වළවල් 4 ක් කැණීම් කිරීමට තීරණය විය. එම දෙවන අදියරෙහි සිදු කරන ලද කැණීම් මගින් පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් සාධක අනාවරණය නොවී ය.

## වයඹ පළාත

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**රාජාංගනය හත්ථිකුච්ඡි පුරාවිද්‍යා ස්ථානය**

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මයිලෑව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉතා පැරණි ස්ථානයකි. මෙහි භූගෝලීය පිහිටීම උ. අ. 8.06151 නැ. දේ. 80.24620 අතරය. කුරුණෑගල සිට අනුරාධපුර දක්වා දිවෙන අංක 57 මාර්ගයේ (ඇල්ල පාර) කිලෝමීටර 72 ක් පමණ පැමිණ ගල්කල්ල හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 3.5 ක් පමණ ගමන් කළ විට මෙම හත්ථිකුච්ඡි පුරාවිද්‍යා ස්ථානයට ළඟා විය හැකි ය. මෙම ස්ථානයේ ඇති ස්මාරක අතරින් පර්වතය මත ඇති ඉර හඳ නො පෙනෙන පොකුණ නමින් හැඳින්වෙන ස්වාභාවික ගල් කෙමිය අසළ ඇති ගොඩනැගිල්ලෙහි වාස්තුවිද්‍යාත්මක සාධක හඳුනාගෙන සංරක්‍ෂණය කිරීමේ අරමුණින් කැණීම් සිදු කරන ලදි.

මෙහි කැණීම් 2016 මැයි 9 වන දින ආරම්භ කෙරිණි. ගොඩනැගිල්ලෙහි වාස්තුවිද්‍යාත්මක සැලැස්ම කැණීම මගින් අනාවරණය කරගත හැකි විය. පුළුස්සන ලද ගඩොල් මැටි මිශ්‍ර වැලි බදාමයකින් බැඳ කපරාරු කර ඉදි කර තිබූ මෙම ගොඩනැගිල්ලෙහි ගෙබිම පස් පුරවා ගොම මැටි ගා නිමාවට පත් කර තිබිණ. ගොඩනැගිල්ලෙහි උතුරු බිත්තියට සම්බන්ධව ගල් කණු දෙකක් විය.

ගොඩනැගිල්ලට ඉදිරිපසින් පිහිටි ගෙමිදුල නැගෙනහිර අන්තයෙන් සහ දකුණු අන්තයෙන් අඩක් වන සේ කළුගල් බැමි බැඳ මට්ටම් කර කළුගල් සහ ගඩොල් අතුරා තිබුණු බවට අනුමාන කළ හැකි ලක්‍ෂණ දැකිය හැකි ය. ගොඩනැගිල්ලෙහි දොරටුවට අයත් උළුවස්ස, ගල් කණු දෙක ද උතුරු දිශානුගතව පිහිටා ඇති ස්වාභාවික පර්වතය අසල තැන්පත් කර තිබිණ.

## ඌව පළාත

**මොණරාගල දිස්ත්‍රික්කය**

**මොණරාගල නක්කල ථේරප්පහුව රජමහා විහාරයේ පරීක්‍ෂණ කැණීම**

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ථේරප්පහුව ග්‍රාම නිලධාරී වසමට අයත් නක්කල ගමෙහි පිහිටි පැරණි ස්ථානයකි. මෙහි භූගෝලීය පිහිටීම උ. අ. $6^0$ 52′39.8″ නැ. දේ. $81^0$ 17′16.4″. මොණරාගල බිබිල මාර්ගයේ පිහිටි නක්කල නගරයේ සිට වමට ඇති මාර්ගයේ මීටර් 100 ක් පමණ ගමන් කළ විට නැවත වම් අතට දිවෙන මාර්ගයක් හමු වේ. එහි මීටර් 500ක් පමණ ගමන් කළ විට හමුවන දකුණු දෙසට ඇති මාර්ගයේ මීටර් 800 ක් පමණ දුරින් කඳු පාමුළ පිහිටි ථේරප්පහුව රජමහා විහාරයට පිවිසිය හැකි ය.

අක්කර 03 ක් පමණ ප්‍රදේශයක පැතිරුණු පැරණි ඉදිකිරීම් සාධක සහිත මෙම විහාර භූමියෙහි නව ස්තූපයක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස විහාරාධිපති ස්වාමීන් වහන්සේ සහ ප්‍රදේශවාසීන් විසින් කරන ලද ඉල්ලීමට අනුව මෙම පරීක්‍ෂණ කැණීම 2016 වසරේ අප්‍රේල් මස දී සිදු කරනු ලැබී ය. කොටු සැලසුමකට අනුව බෙදා ගන්නා ලද භූමියෙහි කැණීම් අගල් දෙකක් සහ මීටර් 1x1 ප්‍රමාණයේ පර්යේෂණ වළ කිහිපයක් කැණීම් කරන ලදි.

මෙම කැණීමෙන් කළුගල් පාදම සහිත ගඩොල් බැමි, කළුගල් බැමි, ගල්කණු සාධක, ගොඩනැගිල්ලක බිත්ති කඩා වැටීමෙන් විසිරී තැන්පත් වූ ගඩොල් ස්ථරයක සාධක, මුරගල් හා කොරවක්ගල් සහිත පඩිපෙළ අවසන්වන ඉහළ කෙළවර ශෛලමය යටලිපතක් යන ඉදිකිරීම් සාධක අනාවරණය විය. යකඩ ඇණ, මැටි කොතක උඩ කොටසක්, පබළුවක්, කුඩා මැටි භාණ්ඩයක් මෙහි දී හමු වූ සාධක අතර වේ. මෙම භූමියෙහි ස්මාරක සම්පූර්ණයෙන් පාදා ගැනීමේ ක්‍රියාවලියක් සිදු නො කළ බැවින් නිශ්චිත කාලනිර්ණයක් ලබා දිය නො හැකි නමුත් බැම්වල ඉදිකිරීම් ලක්‍ෂණ අනුව අනුරාධපුර අවධියට අයත් වන බව අනුමාන කළ හැකි ය.

**මානාභරණ රජමහා විහාරයේ නැගෙනහිර ප්‍රාකාර බැම්ම කැණීම**

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මානාභරණ 123 F ග්‍රාම නිලධාරී වසමට අයත් මානාභරණ රජමහා විහාරයේ පැරණි ප්‍රාකාර බැම්ම භූගෝලීය පිහිටීම උ. අ. $6^0$ 921-6.923″ /නැ. දේ. $81^0$ 549,81.551″ ය. මොණරාගල මඩකලපුව ප්‍රධාන මාර්ගයේ සියඹලාණ්ඩුව මංසන්ධියේ සිට කි. මී. 1 ක් දුරින් පිහිටි අතුරු මාර්ගයේ කි. මී. 3 ක් පමණ ගමන් කළ විට මෙම විහාරය පිහිටා ඇත.

මෙහි කලු ගලින් නිම කළ ප්‍රාකාරයේ පළමු අදියරේ කැණීම් කටයුතු 2015 වසරේ දී සිදු කළ අතර එහි දෙවන අදියර මෙම වසරේ සිදුකරන ලදී. මෙහි අරමුණ වූයේ එහි වාස්තුවිද්‍යාත්මක ව්‍යුහය හඳුනා ගැනීමත් එය සංරක්ෂණය සඳහා යොමු කිරීමත් ය. 2016-10-26 දින සිට 2016-12-31 දින දක්වා කැණීම් සිදු කළහ.

ප්‍රාකාරයේ ගරාවැටී තිබූ සාධකවල විසිරීම අනුව මතුපිටින් එහි මධ්‍යයේ සිට මීටර් 1.5 ක් බැගින් දෙපසට මීටර් 3 ක් පළලට කැණීම සිදු කරනු ලැබී ය. බැම්මේ සමහර ස්ථානවල ගරා වැටුණු සාධක මීටර් 3 කට වඩා පළලට විසිරී තිබුණි. එවැනි ස්ථානවල පළල වැඩි කොට අතර ඒ අනුව උපරිම පළල මීටර් 3.8 ක් පමණ වේ. ගැඹුර සෙ. මී. 50 ක අවමයකින් සහ මී. 2.10 ක උපරිමයකින් යුතු ව කැණීම් කරන ලදී. ප්‍රාකාරයේ දිග මී. 54 ක් විය.

මෙහි දී පාදම්ගල්, පැතිගල්, කට්ටගල්, කුඤ්ඤගල් හා පිරවුමට යොදාගත් බදාම කොටස් ද බැම්මේ සෝදාපාළු තැන්පතු ද මතුකර ගන්නා ලදි.

## සබරගමුව පළාත

### රත්නපුර දිස්ත්‍රික්කය

### ඇඹිලිපිටිය උඩගම ස්තූප කැණීම

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උඩගම ග්‍රාම නිලධාරී වසමට අයත් ය. මෙහි භූගෝලීය පිහිටීම උ. අ. $6^0 20'11.5''$ /නැ. දේ. $80^0 50'44.4''$ වශයෙනි. කොළඹ-ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයේ ඇඹිලිපිටිය නගරයට කි. මී. 1 කට පමණ පෙර හමුවන උඩගම මංසන්ධියෙහි සූරියකන්ද දෙසට දිවෙන මාර්ගයේ වම්පසින් මෙම ස්තූපය පිහිටා ඇත.

මෙම ස්තූපය පිහිටි භූමිය හරහා ඇඹිලිපිටිය නගරය දක්වා දිවෙන යෝජිත විකල්ප මාර්ගය ඉදි කිරීමේ දී සිදුවිය හැකි බලපෑම තක්සේරු කිරීම හා හානිය වැළැක්වීමේ මූලික අරමුණින් මෙම කැණීම සිදු කරන ලදි. කැණීමෙන් අනතුරුව මෙම ස්තූපය සංරක්ෂණය කොට මහජන ප්‍රදර්ශනය සඳහා යොමු කිරීම මෙහි අරමුණු විය. ඒ අනුව 2016-07-28 දින සිට 2016-10-04 වන දින දක්වා මෙහි කැණීම් සිදු කරන ලදි.

මෙම ස්තූප ගොඩැල්ල කැණීම සඳහා භාවිත කරන ලද්දේ කාර්තු ක්‍රමයයි. මෙම ස්තූපයේ ඉදිකිරීම් ස්වභාවය සහ අත්තිවාරම් ස්වභාවය පැහැදිලි කර ගැනීම සඳහා උතුරු-නැගෙනහිර කාර්තුවේ රේඛාවෙන් උතුරු දෙසට මධ්‍ය කේන්ද්‍රය දක්වා යෙදීමට කටයුතු කරන ලදි. එහි අරමුණු වූයේ ස්තූපයේ මූලික ඉදිකිරීම් හඳුනා ගැනීම, ස්ථරායනය හඳුනා ගැනීම, පිහිටි පොළොව සමග ස්තූපයේ සම්බන්ධතාවය හඳුනා ගැනීමයි. ඒ අනුව මීටර් 1 ක් පමණ පළලින් යුතු අගල අවශ්‍යතාවය මත පිහිටි පොළොව දක්වා කැණීම් කරන ලදි. අනතුරුව එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශාවෙහි කාර්තු ඉවත් කරන ලද්දේ ස්ථර කැණීම් ක්‍රමවේදය පදනම් කර ගනිමිනි. ස්මාරකයේ උස් ස්ථානයේ සිට පහළට කැණීම් කටයුතු මෙහෙයවන ලද අතර මධ්‍ය කොටසට වන්නට නිධන් සොරුන් විසින් විනාශ කර තිබිණ.

කැණීමේ දී අනාවරණය වූ පරිදි පළමුව ස්තූපය ඉදිකරන සීමාව හඳුනාගෙන ඊට බාහිරින් ප්‍රාකාර බැම්ම ඉදිකිරීම පළමුව සිදු කර ඇත. එහි අත්තිවාරම සඳහා කළුගල් පුවරු අතුරා ඒ මත ගඩොල් වරි 8 කට ආසන්න ප්‍රමාණයකින් ප්‍රාකාර බැම්ම ඉදි කර ඇත. එම ගල් පුවරු ගිලා බැසීම වැළැක්වීම සඳහා පළමුව කුඹුරු මැට්ට මත බොරළු පස් මිශ්‍රණයක් අතුරා ඇත. ස්තූපය ඉදි කරන සීමාවට ආසන්නයේ වැඩි ඝනකමකින් යුතුව බොරළු මිශ්‍රණය අතුරා තිබේ. අනතුරුව එම බොරළු මිශ්‍රණය මත හතරැස් අඩිතලාමක් ගඩොල් පමණක් භාවිතයෙන් ඉදි කර එය නැවත බොරළු, තිරුවානා, වැලි, මැටි මිශ්‍රණයකින් පුරවා ඇත. එම අඩිතාලම මත නැවත අටපට්ටම් වේදිකාවක් ගඩොල් වරි තුනකින් නිම කර පේසා වළලු තුනක් සකසා ඇත. ගර්භයට අයත් සාධක විශාල ප්‍රමාණයක් විනාශ වී ඇති බැවින් ඒ පිළිබඳ පැහැදිලි අදහසක් ලබා ගැනීම දුෂ්කර වේ.

ස්තූප මලුවට පිවිසීම සඳහා දකුණු දෙසින් පිවිසුම් මගක් සකස් කර ඇත. මෙය අවධි දෙකක ලක්ෂණ පෙන්නුම් කරයි. ප්‍රාකාර බැම්ම හා ස්තූපයේ ඉදිකිරීම්වලින් පසුව අවසන් අවස්ථාවක් ලෙස පිවිසුම් පඩිපෙළ ඉදි කර තිබේ. එහි යොදා ඇති පඩි 02 ස්තූපයේ ප්‍රතිසංස්කරණ අවස්ථාවක දී මුල් ඉදිකිරීම මත නැවත යොදා ඇති බව අනුමාන කළ හැකි ය.

මෙම කැණීමේ දී මැටි භාජන අවශේෂ, උළු කැබලි, යකඩ කැබලි, ඕලන්ද සහ බ්‍රිතාන්‍ය කාසි යන චංචල පුරාවස්තු ද හමු විය. නූතන මානව ක්‍රියාකාරකම් මගින් හානි සිදුවීම නිසා මෙම ස්මාරකයට නිශ්චිත කාලනීර්ණයක් ලබා දීම අපහසු වේ.



උඩගම ස්තූපය කැණීමෙන් අනතුරුව

**ඇඹිලිපිටිය වෙහෙරගොඩැල්ල ස්තූප කැණීම**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදලංගල ග්‍රාම නිලධාරී වසමේ මෙම ස්තූපය පිහිටා ඇත. ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගයේ පදලංගල මංසන්ධියෙන් වමට හැරී සූරියවැව මාර්ගයේ කි. මී. 2 ක් පමණ ගමන් කළවිට මෙම වෙහෙරගොඩැල්ල විහාරස්ථානයට පැමිණිය හැකි ය.

විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම අනුව මෙහි පිහිටි පැරණි ස්තූපය සංරක්ෂණය කිරීමේ අරමුණින් කැණීම් කරන ලද අතර 2016 ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා මෙම ව්‍යාපෘතිය සිදු කළහ.

මෙම ස්තූප ගොඩැල්ල කැණීම සඳහා යොදා ගනු ලැබූයේ කාර්තු ක්‍රමයයි. ගොඩැල්ල කාර්තු 4 කට බෙදීමෙන් අනතුරුව මධ්‍ය ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දිශාවට මීටර් 3 ක් පළල පර්යේෂණ අගලක් සලකුණු කර ස්තූපයේ මූලික හැඩය හඳුනා ගැනීම සඳහා කැණීමට බඳුන් කෙරිණ. එහි දී ස්තූපයේ පේසා වළලුවල සිට ඉහළට වූ කොටස් සියල්ලම පහේ ගරාවැටීමට ලක්ව ඇති බව අනාවරණය විය. පර්යේෂණ වළ කැණීමෙන් අනතුරුව එකිනෙකට ප්‍රතිවිරුද්ධ කාර්තු පිළිවෙලින් කැණීම් කර පාදා ගන්නා ලදි.

මෙම කැණීමෙන් අනාවරණය වූ පරිදි මෙම ස්තූපය ඉදි කිරීමේ දී අත්තිවාරම ගිලා බැසීම වැළැක්වීම සඳහා පිහිටි පොළොව මත වූ බුරුල් පස් තට්ටුව මීටරයකට අඩු ප්‍රමාණයක් ඉවත් කර ඊට ගුැවල් සහ පස් තට්ටු මාරුවෙන් මාරුවට යොදා ඇත. අනතුරුව ඒ මත සක්ක ගල් තට්ටුවක් අතුරා ස්තූපයේ වේදිකාව සකස් කර ඇත. වේදිකාව සකස් කිරීමේ දී එහි මුහුණත ශක්තිමත්ව ගඩොලින් බැඳ අභ්‍යන්තරය තද මැටි බදාම සහ විශාල ප්‍රමාණයේ ගඩොල් භාවිත කර පුරවා ඇත. ස්තූපය ඉදිකර ඇත්තේ ඒ මත ය. වේදිකාවෙන් ඉහළ කොටස විශාල වශයෙන් විනාශ වී ඇති නිසා මෙහි පේසාවක් සහ උපරිභාගය පිළිබඳ අදහසක් ලබා ගැනීම අපහසු වේ. වේදිකා මළුවෙහි ස්ථාන කිහිපයක මල් ආසන රැඳවීමට ගඩොල් කොටස් කඩා ඒ මත එතරම් හැඩ නො කළ ගල් කණු පිහිටුවා තිබුණි.


ස්තූපය මධ්‍යයේ දක්නට ඇති අනවසර කැණීම් වළෙහි පිරවුම ඉවත් කිරීමේ දී දැඩි ලෙස විනාශයට පත්ව තිබුණු ධාතු ගර්භයේ සාධක හමු විය. ගඩොල් භාවිත කර චතුරශ්‍රාකාරව ඉදි කර තිබූ මෙහි හුණු බදාම කොටස් ද ශේෂව තිබිණ. මේ තුළ මහාමේරුව ලෙස සිතිය හැකි ශෛලමය නිර්මාණයක් ද විය. ස්තූපයෙන් පිටත ඡත්‍ර කිහිපයක් ද දක්නට ලැබේ.



ඇඹිලිපිටිය වෙහෙරගොඩැල්ල ස්තූපය කැණීමෙන් පසුව



මහාමේරුගල




ඇඹිලිපිටිය වෙහෙරගොඩැල්ල ස්තූපය සැලසුම්

## නැගෙනහිර පළාත

**අම්පාර දිස්ත්‍රික්කය**

**අම්පාර ගොනාගොල්ල පුංචි සීගිරිය ස්තූපය කැණීම**

උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොත්මලේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුංචි සීගිරිය යනුවෙන් ව්‍යවහාරයේ පවතින විහාරස්ථානය. මෙහි භූගෝලීය පිහිටීම උ. අ. $7^0$ 24′54.75″/ නැ. දේ. $81^0$ 39′18.12″ ය. මෙම ස්ථානය අම්පාර නගරයේ සිට මහනුවර මාර්ගයේ කි. මී. 16 ක් පමණ විත් 28 සැතපුම් කණුව අසළ පිහිටි මංසන්ධිය හමු වේ. එතැන් සිට දකුණට ඇති මාර්ගයේ කි. මී. 5 ක් පමණ දුරින් ඇති කොත්මලේ ජනපදයට මායිම්ව දකුණු පසින් මෙම විහාරස්ථානය පිහිටා ඇත.

ප්‍රාග් ඓතිහාසික සහ ඓතිහාසික අවධිවලට අයත් සාධක විශාල වශයෙන් විසිරුණු භූමි භාගයකි. දාගැබ, ගොඩැගිලි සාධක, ප්‍රාකාර බැම්ම, කටාරම් කෙටූ ලෙන්, ප්‍රාථමික ලෙන් සිතුවම්, ඓතිහාසික සිතුවම් සහ සෙල්ලිපි ඇතුළු පුරාවිද්‍යාත්මක සාධක විසිරී පවතී. මෙම භූමියෙහි වූ පැරණි දාගැබ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතු කොටගෙන විනාශ වී තිබුණු අතර එහි ව්‍යුහය හඳුනාගෙන සංරක්ෂණය කිරීමේ අරමුණින් මෙම කැණීම 2016 ජූනි/ජූලි කාලය තුළ සිදු කරන ලදි. මේ සඳහා අගල් සහ කාර්තු ක්‍රමවේදය යොදා ගන්නා ලදී.

මෙම කැණීමෙන් අනාවරණය වූ පරිදි දාගැබේ පාදම උතුරු පසින් පිහිටි ගල මත ආරම්භ කර ඇති අතර අනිත් පැතිවල පිහිටි ගල පොළොව අභ්‍යන්තරයට දිවෙන බැවින් පස් මත පාදම ආරම්භ කර ඇත. ඒ අනුව මී. 10.4 විෂ්කම්භයකින් යුතුව විවිධ ප්‍රමාණයේ සකස් නො කරන ලද කළුගල් යොදා රවුමට පාදම සකස් කර පතුරු ගල් යෙදීමෙන් සම මට්ටමට ගෙන ඇත. අනතුරුව ගඩොල් යොදා ගෙන දාගැබ ආරම්භ කර ඇති අතර පේසාව නිර්මාණය කර ඇත්තේ මෝල්ඩින් ගඩොල් යෙදීමෙනි. පේසාවේ උස මී. 1.25 ක් ද, පළල 12.85 ක් ද වේ. කැඩී විනාශ වී ඇති ගර්භය දැනට සෙ. මී. 80 ක ක පමණ උසකින් යුක්තව ශේෂ වී තිබේ. මෙහි විෂ්කම්භය මී. 4.9 කි.

ගර්භයේ හා පේසාවේ ගඩොල් වරි එකිනෙකට සම්බන්ධ වී තිබිය යුතු වුවත් මෙම කැණීමේ දී අනාවරණය වූයේ ගර්භය සහ පේසාව යන දෙක වෙන වෙනම බැඳි ඇති බවයි. ගර්භයේ ගඩොල්වලට පේසාවේ ගඩොල් හේත්තු කර කුස්තුර එක පේළියට සිටින සේ බැඳ ඇත. එසේ සිදු කර ඇත්තේ අවධි දෙකක දී ඉදිකළ නිසා ද නො එසේ නම් යොදා ගත් තාක්ෂණ ක්‍රමවේදය නිසා ද යන්න පැහැදිලි නැත. එසේම ගඩොල් බැම්මට එලා ඇති රටාව ද ගර්භයට වඩා පේසාවේ වෙනස් වේ. මෙම කැණීමෙන් කාසි, මැටි බඳුන් කොටස්, දිරා ගිය යකඩ ඇණයක් සහ පබළුවක් යනාදී පුරාකෘති හමු විය.

මෙම දාගැබෙහි නිර්මාණ ලක්ෂණ හා සිරිපතුල් සහිත මල් ආසන ස්ථානය අවට පවතින ශිලා ලේඛන ආදී සාධක අනුව අනුරාධපුර අවධියට අයත් ස්මාරකයක් බව අනුමාන කළ හැකි විය.

# වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශය

## මධ්‍යම පළාත

### මාතලේ දිස්ත්‍රික්කය

### මීවලපතහ දාගැබ සංරක්ෂණය

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීවලපතහ ශ්‍රී චෛත්‍යවර්ධනාරාමය ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. කුරුණෑගල දඹුල්ල මාර්ගයේ ගලේවල නගරය පසුකර කි.මී. 8 ක් ගියවිට හමුවන ප්‍රියන්ත හෝටලය අසළින් වමට ඇති බොරළු පාරේ කි.මී. 2 1/2 ක් ගමන් කිරිමෙන් මෙම විහාරස්ථානය ට පිවිසිය හැකිය. මෙම ස්ථානය ක්‍රි.ව. 6-9 සියවස් තුළ දී ඉදිකරන ලද පබ්බතාරාම සංකිර්ණයක් ලෙස හඳුනාගෙන ඇත.

2015 වර්ෂයේ කැණීම් කර පාදාගත් දාගැබ බැතිමතුන් උදෙසා වන්දනාමාන කිරිමට සුදුසු පරිදි සංරක්ෂණය කිරිම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ. කැණීමට අනුව විශ්කම්භය අඩි 36 හා උස අඩි 4 ක් වන දැගැබ මතු කරගන්නා ලදි. පවතින සාධක මත 2016 වර්ෂයේ දි සංරක්ෂණය ආරම්භ කරන ලදි. මෙහි දි මූලික වශයෙන්ම දාගැබ මධ්‍ය ලක්ෂය සළකුණු කර ඒ මත බාර් එකක් සිටුවා ලක්ෂය ස්ථාවර කරන ලදි. දෙවනුව 1, 2, 3, 4 වරි සඳහා මානව ක්‍රියාකාරකම් මත කිසිදු හානියක් සිදු නොවී පැවැතියෙන් කුස්තුර පොයින්ට් කිරිම පමණක් සිදු කරන ලදි. 5, 6 වන ගඩොල් වරි පැවැතියත් එහි තැනින් තැන ගඩොල් ගැලවී ඉවත් ව පැවැති හෙයින් අලුත් ගඩොල් යොදා සැකසීම සිදුවිය. පළමු පේසා වළල්ල 7, 8, 9 වරි තුළින් හඳුනාගැනිමට හැකිවිය. ශේෂිත සාධක පදනම් කොටගෙන නව ගඩොල් බැමි ගලවා බැඳ පේසා වළල්ල සැකසීම සිදුවිය. මෝල්ඩින් ගල්වලින් සමන්විතව පැවැති 10 වන වරියේ අඩු තැන් පිරවීමට එලෙස සැකසු ජේතවන ගඩොල් ඔළු ගලට තබා බැඳීම සිදුවිය. 11 හා 12 වන වරි ද මෙපරිදිම සකස් කරන ලදී. දෙවන පේසා වළල්ල 13, 14, හා 15 වන වරිවලින් නිරූපනය විය. මෙයද ශේෂිත සාධක පදනම් කරගෙන සැකසීම සිදුවිය. 16 වන වරිය මෝල්ඩින් ගල් තබා සැකසු මුත් එවන් ගල් 11 ක් පමණ පැවැති බැවින් බඩගලට ගඩොල් තුනක ආතතියක් දැක්වෙන පරිදි අලවා පීරි ගා සකස් කර ගැනිම සිදුවිය. පසුව සකස් කර ගත් මෝල්ඩින්  ගල් තබා දැගැබ වට සකස් කර ගන්නා ලදි. අනතුරුව නැවත ජේතවන ගඩොල් ඔළු අතට තබා බැඳීම මගින් ගර්භය පිරීම ආරම්භ විය. එහිද ඉංජිනේරු ගඩොල් එක මත එක වරි හතරක් බැඳීම සිදුවිය. ඉන්පසු මුහුණත කඩතොළු කර ගඩොල් මගින් ගර්භය සැකසීම ආරම්භ විය. දාගැබ බැඳීමෙන් පසු එහි මස්තකයේ වූ ගඩොල් කුස්තුර පොයින්ට් කිරිම සිදුවිය. දාගැබ සංරක්ෂණයෙන් පසු විශ්කම්භය අඩි 36 ක් වුවත් උස අඩි 10 ක් විය.

### මහනුවර දිස්ත්‍රික්කය

### වේඩරුව කිරි විහාරය සංරක්ෂණය

මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේඩරුව කිරි විහාරය, වේඩරුව නම් ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර මහියංගන මාර්ගයේ මොරගහමුල හංදියෙන් දකුණට ඇති වික්ටෝරියා වේල්ල දෙසට යන මාර්ගයේ කි.මී. 4ක් පමණ ගොස් වමට ඇති අතුරු මාර්ගයේ කි.මී. 10 ක් පමණ ගියවිට මෙම ස්ථානයට ලඟාවිය හැකිය.

විහාරයේ ආරම්භය නරේන්ද්‍රසිංහ රජු කළ සිදු වී ඇත. දුටුගැමුණු හා 1 වන පරාක්‍රමබාහු රජ දවස මේ සඳහා පදනම වැටී ඇත. කිරි ආහාර පිදීම සහ මැටි පාත්තර විශාල ප්‍රමාණයක් හමුවීමෙන් කිරි විහාරය නමින් ව්‍යවහාර කර ඇති මෙම විහාරයේ පිහිටුවා ඇති පැරණි විහාරය, චෛත්‍ය, බෝධිය සහ සෙසු පෞරාණික අවශේෂ ඓතිහාසික කරුණු සනාථ කිරිමට සාධක සපයයි. කාලයාගේ ඇවෑමෙන් දිරායාමට ලක් වු ස්මාරකය සංරක්ෂණය කර ආයු කාලය වැඩිකර මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මෙහි දී වහළය සංරක්‍ෂණය කිරිම, දැව කුලුණු, කොට බිත්ති සහ ගෙබිම පිවිසුම් දොරටුව සංරක්‍ෂණය කිරිම ආදිය සිදු කරන ලදී. වසර 100 වඩා පැරණි විහාරය කාලයාගේ ඇවෑමෙන් දිරායාම සහ පුරාවිද්‍යා නොවන මැදිහත්වීම නිසා වෙනස් වී තිබිණි. යතාවත් කර මුල්කාලීන ගොඩනැගිල්ල නැවැත අනාවරණය කර සංරක්‍ෂණය කරන ලදි.

**සගම විහාර සංරක්‍ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර සිට අම්පිටිය හරහා ඇති මාර්ගයේ ඇතුල්ගම හන්දිය දක්වා පැමිණ දකුණු පසට ඇති ඇතුල්ගම මාර්ගයේ කි.මී. 2ක් පමණ ගිය පසු ස්ථානයට ලඟා විය හැකි ය. සගම පුරාණ ප්‍රතිමා ගෘහය බෝ මුල් පැතිරීම හේතුවෙන් පුපුරා බිත්ති ගැලවීම වැළැක්වීම හා ස්මාරකය අනාගතය වෙත සුරක්ෂිත කිරීමට කටයුතු යෙදීම ආදිය මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ.

මහනුවර යුගයේ බිතු සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය සංරක්‍ෂණයට භාජනය කෙරුණු අතර මෙම ප්‍රතිමා ගෘහය ආසන්නයේ ගම්පොළ යුගය නියෝජනය කරන බිතු සිතුවම් සහිත ප්‍රතිමා ගෘහයක් ඇත. ඉපැරණි බෝධියට සකස් කරන ලද ගලින් කරන ලද පැරණි බෝධි මාලකයක් ද දක්නට ඇත. තත් යුගය නියෝජනය කරන ආවාස ගෘහයක් ද මෙම ස්ථානය ආශ්‍රිතව පිහිටා ඇත.

ඒ අනුව, සගම විහාරගෙහි පිටුපස විවෘත කොටසේ බිම පුපුරා ගිලා බැස පිපිරීම් දක්නට ලැබීම හේතුවෙන් එයට පිළියම් වශයෙන් පිටුපස සහ වම් පස අඩි 1 1/2 x 2 x 2 ප්‍රමාණයේ අගලක් කැපීම හා අත්තිවාරම සවිගැන්වෙන සේ වැර පැන්නුම් සහිතව අඩි 1 x 1 ප්‍රමාණයට කොන්ක්‍රීට් තලාදයක් යෙදීම සිදු කෙරිණ. මේ අනුව අත්තිවාරම පහළට බැසීම වළකින අතර අත්තිවාරම දෙසට බෝ මුල් පැතිරීම වැළැක්වීම සිදු වේ. විහාර ගේ වහල දිරාපත්ව තිබූ පරාල, රීප්ප පහක් ගලවා ඉවත් කළ අතර ඒ වෙනුවට විශේෂ පංතියේ දැව යොදා පරාල සහ යොදා තිබුණු කිතුල් රීප්පම යෙදීමට කටයුතු කෙරිණ. එමෙන්ම වහලය සම්පූර්ණයෙන් ගලවා උළු ශුද්ධ කොට වැසීම කැඩී තිබුණු උළුවලට අලුතින් උළු යෙදීම කුමේර ගලවා අලුතින් මුදුන් උළු තබා කුමේර බැඳීම සිදු කෙරිණ. ප්‍රතිමා ගෘහයේ සිවිලිම ගැලවී ඉහළට එසවී තිබුණු අතර එය සිවිලිම මතුපිටින් රීප්ප, ඇණ යොදා සවි කිරීම ද සිදු කෙරිණ. කොන්ක්‍රීට් තලාඳ නොයෙදූ කොටසෙහි කිරි මැටි පුරවා බෝ මුල්, පිළිම ගේ දෙසට පැතිරීම වැළැක්වීමට ද කටයුතු කෙරිණ.

**ලංකාතිලක විහාරගේ පිළිම ගේ වහල සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හියාරාපිටිය ග්‍රාමයෙහි මෙම රජමහ විහාරය පිහිටා ඇත. පිළිමතලාව නගරයේ සිට දවුලගල මාර්ගයේ කි.මී. 4 ක් පැමිණ ලංකාතිලක හන්දියෙන් වමට ඇති මාර්ගයේ මීටර් 750 ක් පමණ ගමන් කළ යුතු වේ.

ක්‍රි.ව. 1344 ගම්පොළ රාජධානියේ රජ කළ iv වන බුවනෙකබාහු රාජ්‍ය සමයේ සේනාධිලංකාර ඇමති විසින් මෙම ගොඩනැගිල්ල ඉදි කර ඇත. විනාශ වී ඇති පිළිමගේ වහලය සංරක්ෂණය කර අනාගත පරපුර වෙනුවෙන් ස්මාරකය සුරක්ෂිත කිරීම මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වේ. දැඩි ලෙස අබලන් තත්වයේ පැවති පිළිමගේ වහල අදියර කිහිපයක් යටතේ සංරක්ෂණ කෙරිණි. මහල් කීපයකින් යුක්ත වහලයේ ඉහළ කොටසේ උළු ඉවත් කර දිරා ගිය දැව කොටස් වෙනුවට අලුත් දැව යොදා ඉහළ කොටස සඳහා පෙති උළු ද පහළ කොටස සඳහා සිංහල කොකු උළු ද සෙවිලි කර කුමේර දැමීම සිදු කරන ලදී.

දෙවන වහල කොටසේ උළු ඉවත් කර දිරා ගිය දැව කොටස් වෙනුවට අලුත් දැව ද රීප්ප සම්පූර්ණ ප්‍රමාණය ම අලුතින් යොදා, පෙති උළු සෙවිලි කර කුමේර දැමීම සිදු කරන ලදී. තෙවන වහළ කොටස පල තුනකින් යුක් වූ අතර එම කොටස් වෙන වෙන ම සංරක්ෂණය කරන ලදී. ඒ අනුව මෙම වහල කොටසේ දැරා ගිය පැරණි සිංහල උළු ඉවත් කර, දිරා ගිය දැව කොටස් වෙනුවට අලුත් දැව යොදා, සිංහල කොකු උළු සෙවිලි කර කුමේර දැමීම සිදු කරන ලදී.

විහාර ගේ ඉදිරිපස තොරණට ඉහළින් ඇති වහල කොටසේ සංරක්ෂණ කටයුතු සිදු කරන්නට යෙදුණි. මෙහි දී පැරණි උළු ඉවත් කර දිරා ගිය දැව කොටස් වෙනුවට අලුත් දැව යොදා, ඉහළ කොටස සඳහා පෙති උළු ද පහළ කොටස සඳහා සිංහල කොකු උළු ද සෙවිලි කර කුමේර දැමීම සිදු කරන ලදී. වහල සංරක්ෂණයේ දී ඉහළ වහලය සහ දෙවන වහල කොටස සඳහා වඩිම්බු උළු ඇල්ලීම සිදු කරන ලදී.

**මහනුවර උල්පැන්ගේ සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවටකෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙය මහනුවර දළදා මාලිගා පරිශ්‍රයට දකුණු දෙසින් පත්තිරිප්පුවට ආසන්නව දළදා වීදියට මුහුණලා ස්ථානගත වී ඇත. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය කාලය තුළ 1798-1815 එනම් 1806 දී පමණ රාජකීයයන් ගේ ස්නාන කාර්යය සඳහා මෙම ස්මාරකය ඉදිකර ඇත. මහනුවර උල්පැන්ගේ ස්මාරකයේ හායන තත්ත්ව සඳහා මැදිහත් වී සමස්ථ ස්මාරකය සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙහි දී උල්පැන්ගේ වහලය සංරක්ෂණය කිරීම කටයුතු විධිමත් කරන ලදි. වහලයේ උතුරු, නැගෙනහිර, බටහිර දිශාවල පරාල දැඩිව හායනය වී පැවති බැවින් නැවත යෙදීම සිදු කරන ලදි. යටලී රාමුව, අට්ට වහල ආශ්‍රිත දැව තල සංරක්ෂණය කරන ලදි. ඒ අනුව නැවත දැව යොදා ගනිමින් දැව වහලය 2016.06.03 දින වන විට අවසන් කරන ලදි. පසුව වහලෙහි සිවිලිම ගැසීම, දැව වෝටර්බේස් කිරීම උළු සෙවිලි කිරීම ආරම්භ කිරීම මෙම වර්ෂය තුළ දී සිදු කරන ලදි.

## උතුරුමැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

#### නාවාගල ස්තූපය සංරක්ෂණය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉපැරණි නාවාගල ස්තූපයේ සංරක්ෂණ කටයුතු සඳහා මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කැණීම් තුළින් ලත් දත්ත පදනම් කර ගනිමින් ස්තූපය නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය මේ යටතේ සිදුකරන ලදී.

කැණීම් කිරීම්වල දී ඇති වී තිබූ ස්තූප මුදුනත සිට ගර්භය දක්වා වූ කුහරය වැසීම මුලින් සිදු කරන ලදී. පසුව පළමු පේසාව සංරක්ෂණයේ දී එහි ගිලා බැස ගිය තැන් සහ ගරා වැටුණු තැන් මැනවින් අධීක්ෂණය කරමින් නියමිත මට්ටමක් සහිත ස්ථාන කිහිපයක් තෝරා ගෙන එම ස්ථාන පදනම් කරගෙන පළමු  පේසාවේ බොරදම් වරිය සංරක්ෂණය කිරීම ආරම්භ කරන ලදී. දෙවන පේසාව වට ප්‍රමාණය අඩි 220 කි. මධ්‍ය කොටසේ ගඩොල් වරි 05 ක් තිබූ අතර එහි උස අඟල් 15 කි. අවසන හමු වන බොරදම් වරියේ උස අඟල් 10 කි. දෙවන පේසාව ද කුස්තුර අවම වන සේ සිමෙන්තිඃ හුණුඃවැලි 1:2:10 මිශ්‍රණය යොදාගනිමින් සංරක්ෂණය කර ඇත. ගර්භය ඉදි කිරීමේ දී ගර්භයේ මුහුණතට හැකි සෑමවිටම ඉපැරණි ගඩොල් යොදමින් ඉදි කිරීම් කර ඇත. කුස්තුර අවම මට්ටමෙන් තබා සිමෙන්තිඃහුනුඃවැලි 1:2:10 මිශ්‍රණය බදාම යොදා ගනිමින් මෙම ඉදිකිරීම් කරන ලදී. ගර්භය මධ්‍ය සෑම විට ම බොල් නොවන සේ ස්තර ශක්තිමත් වන අයුරින් ගඩොල් අතුරමින් ඒ මත බදාම ස්තරයක් දමමින් පිරවුම සිදු කරන  ලදි. ස්තූප ගර්භයේ දකුණු දිශානුගතව කැණීම් මගින් සොයා ගනු ලැබූ විවිධ සංවර්ධිත අවධි පෙන්නුම් කිරීම සඳහා පැතිකඩක් නිර්මාණය කරන ලදි. එහි මුල් නිර්මාණවලට කිසිදු හානියක් නොවන සේ මෙම පැතිකඩ නිර්මාණය කළ අතර කුස්තුර පුරවා සවිමත් කරන  ලදි. අනුමාන සාධක හා ලැබුණු පුරාකෘති අධ්‍යයනයෙන් අනාවරණය වූ තොරතුරු අනුව හතරැස්කොටුව, දේවතාකොටුව සහ කොත්කැරැල්ල නැවත ගඩොලින් බැඳීම සිදු කරන ලදී. සංරක්ෂණ යෝජනාවලියට අනුව ගර්භය දක්වා කපරාරු කිරීම ද ශ්වේත වර්ණ ආලේප කිරීම ද සිදු කරන ලදී.

## සබරගමුව පළාත

### කෑගල්ල දිස්ත්‍රික්කය

#### තෝලංගමුව ධර්මශාලාව සංරක්ෂණය

කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා  ඇත. ධර්ම ශාලාවෙහි වහලය හා බිත්ති සඳහා සිදුව පැවති හානි නිසා ස්මාරකයේ පැවැත්ම සුරක්ෂිත කිරීමට සංරක්ෂණය කිරීම මූලික අරමුණ වේ. ඒ අනුව තෝලංගමුව ධර්මශාලාවේ සංරක්ෂණ කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කළ අතර සංරක්ෂණ කාර්යය අවසානයේ  ධර්මශාලාවේ වහලය, බිත්ති හා ගෙබිම යන කොටස් සංරක්ෂණය කර ආරක්ෂා කරන ලදී.

**රත්නපුර දිස්ත්‍රික්කය**

**මඩුවන්වෙල වලව්ව සංරක්ෂණය.**

රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ පිහිටි මඩුවන්වෙල වලව්ව සංරක්ෂණය කිරීමේ කාර්යය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ මඩුවන්වෙල වලව්වේ පිහිටි බිත්ති කපරාරුව, බිම් තහවුරු කිරීම, තොරණ සහ ගල් උලුවස්ස සංරක්ෂණය කිරීම යන වැඩ කොටස් ඉටු කරන ලදී.

## නැගෙනහිර පළාත

**අම්පාර දිස්ත්‍රික්කය**

**දීඝවාපිය දාගැබ සංරක්ෂණය**

අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි දීඝවාපිය දාගැබ සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. දාගැබෙහි ගර්භය සංරක්ෂණ කටයුතු හා තෙවන පේසාවේ සංරක්ෂණ කටයුතු ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී. මේ සඳහා සංරක්ෂණ පාදාගැනීම් මගින් හඳුනාගත් කොටස් කිහිපයක් පමණක් සංරක්ෂණය කිරීම සිදු කරන ලදි.

## බස්නාහිර පළාත

**කලුතර දිස්ත්‍රික්කය**

**බොලොස්ගම වැලිකන්ද ශ්‍රී සුනන්දාරාමය සංරක්ෂණය**

කලුතර දිස්ත්‍රික්කයේ දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි බොලොස්සගම වැලිකන්ද ශ්‍රී සුනන්දාරාම විහාරයේ පිළිමගෙය සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ පිළිමගෙයට අයත් වහලය බිත්ති හා ගෙබිම සංරක්ෂණය කරන ලදි.

## වයඹ පළාත

**පුත්තලම දිස්ත්‍රික්කය**

**මුරුක්කුවටවන විහාරයේ ස්තූප ගොඩැල්ල සංරක්ෂණය**

පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ පිහිටි මුරුක්කුවටවන විහාරයේ ස්තූප ගොඩැල්ල සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ස්තූප ගොඩැල්ල පාදාගෙන සංරක්ෂණය කිරීමේ කටයුතු සඳහා මූලික අවධානය යොමු කරන ලදි.

මෙහි සියලු කටයුතු සඳහා විහාරස්ථාන දයක සභාව විසින් ද්‍රව්‍ය හා මූල්‍ය සම්පත් ලබා දීම සිදු කර ඇත. ඒ අනුව බොහෝසේ විනාශයට පත්ව තිබූ ස්තූප ගොඩැල්ල අවම මැදිහත් වීමක් යටතේ තහවුරු කිරීම සිදුකරන ලදි.

## උතුරු පළාත

**යාපනය දිස්ත්‍රික්කය**

**යාපනය ඕලන්ද කොටුව සංරක්ෂණය.**

යාපනය දිස්ත්‍රික්කයේ යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි යාපනය ඕලන්ද කොටුව සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ වැඩ බිම අංක 11, 12 සහ වැඩ බිම අංක 13 යටතේ අට්ටාලයේ හායනික ස්ථාන සංරක්ෂණය කිරීම් සිදු කරන ලදි. එසේම වැඩබිම් අංක 14 යටතේ බැම්මේ සංරක්ෂණ කටයුතු ද ප්‍රවේශ මාර්ගයේ කටයුතු ඉටු කරන ලදී.

## රසායන සංරක්ෂණ අංශය

## බිතුසිතුවම් සංරක්ෂණය

## බස්නාහිර පළාත

**ගම්පහ දිස්ත්‍රික්කය**

**කොස්කඳවල රජමහා විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොස්කඳවල ග්‍රාමසේවා වසමේ පිහිටි මෙම විහාරය කොළඹ නුවර මාර්ගයේ යක්කල හංදියෙන් දකුණට වූ 231 කිරිඳිවැල මාර්ගයේ කි.මී. 03 ක් පමණ ගිය පසු හමුවේ. ගල් තලාවක් වියන ලෙස යොදා ගනිමින් නිර්මාණය කර ඇති මෙම විහාරයෙහි ප්‍රධාන පිළිමගෙය, අනුරාධපුර මුල් කාලයේ සිදු කරන ලද්දක් බව සඳහන් වේ. ප්‍රධාන සැතපෙන පිළිමයක්, සමාධි පිළිම දෙකක් හා දේව රූප දෙකකින් සමන්විත මෙම විහාරයේ ගල් තලාව මත අඳින ලද වියන් සිතුවම් වේ.

මෙම සිතුවම්වල ආධාරකය සක්ක බිත්ති වන අතර මේ සඳහා වැලි මැටි යොදාගෙන තිබුණි. වියන් සිතුවම් නිර්මාණය සඳහා ගල් පෘෂ්ඨය මත හුණු වැලි මැටි මිශ්‍ර බදාමයක් යොදාගෙන තිබුණි. බදාම ස්ථර දෙකකි. පළමු ස්ථරය වැලි මැටි ස්ථරයකි. දෙවන ස්ථරය හුණු වැලි ස්ථරයකි. හුණුවලින් සකසනලද මෘදු පෘෂ්ඨයෙහි වර්ණ තැවරීමට පහසුවන පරිදි සියුම් ලෙස සකසා තිබුණි. මෙහි කලු, රතු, කහ, කොළ, සුදු, දුඹුරු සහ නිල් වර්ණ සංකලනයන් දක්නට ලැබේ.

මෙම විහාරයේ ස්ථාන කිහිපයක ආධාරකය දක්වා දිවෙන කුඩා ගර්ථ සහිත බිත්ති දැකගත හැකි වූ අතර එහි වැඩී තිබූ ශාකයක මුල් අධාරකය හරහා සිතුවම් පෘෂ්ඨය මත පැතිරී ඇති අකාරය විෂ්ණු දේව ප්‍රතිමාව අසල දැකගත හැකි විය. ජලය අවශෝෂණය වීම නිසා විෂ්ණු දේව ප්‍රතිමාව වටා බදාම ස්ථර බොල්වී තිබුණි. තවද තැන් කිහිපයක බොල්වීම නිසා අධාරකයෙන් බදාම ස්ථරය වෙන්වීම සහ සමහර ස්ථානවල බදාම ස්ථරය ගැලවී ඉවත් වී යාම ද නිරීක්ෂණය විය. බදාම ස්ථරයේ පිපිරීම් කිහිපයක් ද සුළු වශයෙන් දැකගත හැකි විය. සිතුවම් පතුරු ලෙස ගැලවී යාම, වියන් සිතුවම්හි තැන් කිහිපයක (සුළං කවුළු අසල) වර්ණ ඉවත් වී යාම සහ ඔත් පිළිමයෙහි පහත කොටසෙහි තැන් කිහිපයක වර්ණ ස්ථරය කුඩු වශයෙන් ගැලවී යාම සහ මූර්තිවල තැන් කිහිපයක වර්ණ ස්ථරය දුර්වල වීම ද මෙහි දී දක්නට ලැබුණු හායන තත්වයන් විය.

උක්ත හායන තත්වයන්ට අවශ්‍ය නිසි පිළියම් යොදා සංරක්ෂණ කටයුතු සාර්ථකව අවසන් කරන ලදී.

**කොස්සින්න රජමහා විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොස්සින්න ග්‍රාම නිලධාරි වසමට අයත් කොස්සින්න රජ මහා විහාරය, කොළඹ මහනුවර මාර්ගයේ කඩවත නගරයට පැමිණ ගණේමුල්ල මාර්ගයේ ගමන් කළ පසු කොස්සින්න හන්දියෙන් දකුණට හැරී කොස්සින්න මාර්ගයේ කි.මී. එකක් ගිය පසු හමුවේ. මෙය හයවන පරාක්‍රමබාහු රජ දවස ඉදිකරන ලද විහාරයකි.

මෙම විහාරයෙහි සිතුවම් සහිත බිත්තිවල ආධාරකය සුළු වශයෙන් හානි වී ඇති අයුරු දක්නට ලැබුණි. තවද බදාම සහිත ස්ථරයේ, වර්ණ දරන ස්ථරයේ සහ වර්ණ ස්ථරයෙහි ද හායන

තත්වයන් හඳුනාගත හැකි විය. මීට අදාළ නිසි පිළියම් යොදා මෙම විහාරයෙහි සංරක්ෂණ කටයුතු සාර්ථකව අවසන් කරන ලදී.

**වැලිපිල්ලෑව රජ මහා විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්දලියද්ද පාළුව-නැගෙනහිර ග්‍රාමනිලධාරී වසමට අයත් වැලිපිල්ලෑව රජ මහා විහාරය, කොළඹ මහනුවර මාර්ගයේ කඩවත නගරයට පැමිණ ගණේමුල්ල අංක 223 මාර්ගයේ ගමන් කළ පසු පොකුණ හංදිය අසල පිහිටා තිබේ.

මෙම විහාරයේ මහනුවර සාම්ප්‍රදායික ලක්ෂණයන්ගෙන් සමන්විත හිටි පිළිම හතරක් සහ සමාධි පිළිමයක් මූර්තිමත් කර තිබූ අතර වියන නෙළුම් මල් මෝස්තරවලින් සමන්විත වේ. මකර තොරණෙහි හා බුද්ධ ප්‍රතිමාවල ලැකර් ආලේප කර නවීකරණය කර තිබුණි.

මෙම විහාරයෙහි සිතුවම්වල ආධාරකය ලෙස යොදාගෙන ඇත්තේ කබොක් ගල් ය. මෙහි බදාම ස්ථර දෙකකි. පළමු ස්ථරය මැටි හා වැලි මිශ්‍රිතය. දෙවන ස්ථරය වැලි හා හුණු යොදාගෙන තිබුණි. වර්ණ දරණ ස්ථරය, සිහින්ව අඹරාගත් වැලි හුණු බදාමයකින් යුක්තය. වර්ණ ස්ථරය ප්‍රධාන වශයෙන් රතු, කහ, කොළ, කළු, සුදු සහ නිල් වර්ණ යොදා ගනිමින් වර්ණ ගන්වා තිබුණි.

බිතුසිතුවම්වල හා මූර්තිවල හායන ගැටළු විමසීමේ දී මෙම විහාරයෙහි සිතුවම් සහිත බිත්තිවල ආධාරකයේ හානි සුළු වශයෙන් දක්නට ලැබුණි. බදාම ස්ථර ගැලවී යාම, බදාම ස්ථර අතර බන්ධනය අඩු වීම, බදාම අංශු අතර බොල්වීම, බදාම ස්ථරය පිපිරීම යන හායන තත්වයන් දක්නට ලැබුණු අතර වර්ණ දරණු ලබන ස්ථරයේ ද සියුම් පිපිරීම්, බදාම ස්ථරය ගැලවීම ද දක්නට ලැබුණි. වර්ණ ස්ථරයේ ද වර්ණ පතුරු වශයෙන් ගැලවී යාම, කුඩු වශයෙන් ඉවත් වීම, වර්ණ අවපැහැ වීම, කෘමි ගෙවල්, වර්ණ ඉවත් වී යාම, මකුළු දැල්, කුණු දූවිලි තැන්පත් වීම යන හායන තත්වයන් හඳුනාගත හැකි විය. මෙලෙස හඳුනා ගත් තත්වයන්ට රසායනික පිළියම් යොදා මෙහි සංරක්ෂණ කටයුතු සාර්ථකව නිම කරන ලදී.

## මධ්‍යම පළාත

**මහනුවර දිස්ත්‍රික්කය**

**දෙගල්දොරුව රජමහා විහාරය**

මහනුවර සම්ප්‍රදායේ පැරණි බිතුසිතුවම් දක්නට ලැබෙන දෙගල්දොරුව රජමහා විහාරය, මහනුවර දිස්ත්‍රික්කයේ මැණික්හින්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිරිමල්වත්ත පල්ලේගම ග්‍රාමයේ පිහිටා තිබුණි.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ, ලංකා ඉතිහාසයේ පැවති විවිධ යුගයන්ට අයත් (අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර ආදී.) පැරණි සිතුවම් ශෛලීන් නියෝජනය වන පරිදි තෝරාගත් විශේෂ ස්ථාන රැසක් ඡායාරූප වාර්තාගත කිරීම යටතේ මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදී. මෙහි දී දෙපාර්තමේන්තු ඡායාරූප අංශයේ මූලිකත්වයෙන් සහ අනෙකුත් අංශවල දායකත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් මෙම කාර්යය සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළ අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ අතර එහි

පළමු අදියර යටතේ මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති සහිත දෙගල්දොරුව ලෙන් විහාරය ඡායාරූප වාර්තාගත කිරීම සිදු කරන ලදී.

දෙගල්දොරුව ලෙන් විහාරයේ බිත්ති හා සිවිලිමෙහි සිතුවම් පිහිටි මතුපිට ඒකාකාරි ස්වරූපයක් නොගත් බැවින් ඡායාරූප ගැනීම මහත් අසීරු කාර්යයක් විය. පළමුව සිතුවම් පිහිටි ස්ථරය මතුපිට තිබූ දූවිලි අංශු හා මකුණු දැල් ඉතා සියුම් ලෙස හා සුපරික්ෂාකාරීව යාන්ත්‍රිකව පිරිසිදු කිරීම සිදු කරන ලදී. අනතුරුව විහාරගෙයි මැණීම් කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව බිම් සැලැස්ම (Ground Plan) ඉදිරි පෙනුම (Front Elevation) පැති පෙනුම (Side Elevation) හරස්කඩ පෙනුම (Cross Section) සඳහා අවශ්‍ය වන මිනුම් සියල්ල ලබා ගන්නා ලදී. එහි දෙවන අදියර වශයෙන් බිත්ති සියල්ල කොටු කොළ මතට (Draft Sheet) මිණුම් සහිතව දළ රූප සටහන් ලෙස ලබා ගෙන (Graphic Documantation) එහි සිතුවම් දළ රූප සටහන් මඟින් ඇඳීම සිදු කරන ලදී. මෙහි දී ලිඛිත වාර්තාකරණය සිදු විය. ඡායාරූප ගැනීම ආරම්භ කිරීමට ප්‍රථම සිතුවම් සහිත බිත්ති කොටු ක්‍රමයට (Grid System) බෙදා වෙන් කරන ලදී. ඉන් අනතුරුව වමේ සිට දකුණට ගමන් කරන පරිදි වෙන් කර ගත් කොටු නියෝජනය වන ලෙස ඡායාරූප ගැනීම ආරම්භ කරන ලදී. බිත්ති සිවිලිම හා පිළිම සහිත මූර්ති සියල්ල ද මේ ආකාරයෙන් ඡායාරූප ලබා ගත් අතර ඒවා සියල්ලටම අංක ලබා දෙන ලදී. එම අංක බිත්තිවල ඇඳගත් දළ රූප සටහන් මත සළකුණු කිරීම සිදු විය. ලබා ගත් ඡායාරූප සියල්ල පිළිවෙලින් හා ක්‍රමානුකූලව පරිගණක ගත කිරීම සිදු කළ අතර එහි දී ඒවා නැවත අංකනය කර (Rename) වර්ගීකරණය කිරීම සිදු කෙරිණි. අවසාන වශයෙන් නැවත අංක කළ ඡායාරූප සියල්ල එකතු කර මෘදුකාංග භාවිත කර (Software) පරිගණකය ආශ්‍රයෙන් සම්පූර්ණ සිතුවම් සහිත අධිවිභේදන බලයෙන් යුතු (High Resolution) ඡායාරූපයක් නිර්මාණය කරගන්නා ලදී. මෙහි තිබුණු විශේෂත්වය වනුයේ සිතුවමේ පැවති ඉතා සියුම් දත්තයත් පවා උක්ත ආකාරයෙන් ඡායාරූපයට හසුකර ගැනීම හේතුවෙන් ඉතා පැහැදිලි ව දැක ගත හැකි වීමයි. ඉහත සඳහන් පරිදි දෙගල්දොරුව විහාරයේ සිතුවම් සියල්ල ඡායාරූප වාර්තාගත කිරීම සිදු කරන ලදී.

## දකුණු පළාත

### ගාල්ල දිස්ත්‍රික්කය

### හික්කඩුව තොටගමුව සුභද්‍රාරාම පුරාණ විහාරස්ථානය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් තොටගමුව සුභද්‍රාරාම පුරාණ විහාරස්ථානය මහනුවර සම්ප්‍රදායේ දක්ෂිණ ශෛලියට අයත් සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ.

මෙහි දක්නට ලැබුණු හායන තත්වයන් ලෙස සිතුවම් ස්ථරය මත මකුළු දැල් හා දූවිලි අංශු පැවතීම ඇඩිව දක්නට ලැබිණි. දීර්ඝ කාලයක් තුළ දූවිලි අංශු තැන්පත් වී වැසි කාලයේ දී වාතයේ තෙතමනය උරා ගනිමින් ඝන වීම වර්ණ ස්ථර මත අවපැහැ ගැන්වීම සඳහා හේතු වෙයි. සිතුවම් සහිත බිත්ති උස්වීම නිසා මකුළුවන්ගේ ගහනය ව්‍යාප්ත වී මකුළු දැල් බැඳ තිබුණි. එමගින් දුර්වල වූ සිතුවම් ස්ථරය පතුරු ගැලවීම සීඝ්‍ර වී තිබූ ආකාරය විද්‍යාමාන විය. සියුම් බුරුසු ආධාරයෙන් මකුණු දැල් හා දූවිලි අංශු ඉවත් කෙරිණි (Mechanical cleaning on the paint layer). ඝණ වූ දූවිලි

අංශු ඉවත් කිරීම සඳහා පිරිසිදු ජලය හා පුළුන් භාවිතය සිදු කෙරිණි. ඉහළ සිතුවම් ස්ථරයේ දිලීරයන්ගේ වර්ධනය සීමා කිරීම සඳහා Folicur ew 250- 5% ප්‍රතිශතයකින් යුතුව ඉසින ලදී (spray). පසුව පිරිසිදු ජලය භාවිතයෙන් සිතුවම් ස්ථරය පිරිසිදු කර ගැණිනි. විහාරය සමුද්‍රාසන්නව පිහිටා තිබීමත් 2004 වර්ෂයේ සුනාමි ආපදාව නිසා මුහුදු ජලය විහාරය තුළ රැඳී තිබීමත්, සිතුවම් ස්ථරය මත ලවණ තැන්පත් වීම සඳහා හේතු විය. ලවණ සුළඟ හා මුසුව විහාරය තුළට ගමන් කර සිතුවම් මත වූ දූවිලි අංශු මත තැන්පත්ව සිතුවම් ස්ථරය විනාශ කර තිබූ ආකාරය දක්නට ලැබුණි. එමගින් සිතුවම් ස්ථරයේ වර්ණ වෙනස්වීම ද විද්‍යමාන විය. පහළ සිතුවම් ස්ථරයේ අධික ලෙස ලවණ දරා ගැනීම් නිසා සිතුවම් ස්ථරය 90% පමණ විනාශ වී තිබූ අතර ලවණ ඉවත් කිරීම සඳහා පුළුන් (cotton) හා සියුම් කඩදාසි (toilet paper) පිරිසිදු ජලය සමඟ එක්කොට පල්පයක් සදා පසුව ලවණ සහිත සිතුවම් ස්ථරය මත එය අතුරා විනාඩි 20 පමණ තිබීමට හැර බාහිර තෙරපුම් බලයක් ලබා දෙමින් ජලය නැවත උරා ගැනීමට සලස්වා පල්පය ඉවත්කර නැවත පිරිසිදු ජලය යොදා කිහිපවරක් සෝදා පෙරා ගන්නා ලදී. එසේ පිරිසිදු කරගත් කඩදාසි පල්පය (paper pulp) නැවත එම ස්ථානයේ ම විනාඩි 15 ක් පමණ අතුරා පෙර පරිදි ම ඉවත් කර සෝදා පිරිසිදු කර ගැණින. ඉහත ආකාරයෙන් සිතුවම් ස්ථරයේ එක් ස්ථානයක් මත දෙවරක් පල්පය යොදා ලවණ ඉවත් වූ බිත්තිවල පහළ සිතුවම් ස්ථරයේ ලවණ ඉවත් කිරීම සිදු කරන ලදී. පහළ ම සිතුවම් ස්ථරයේ දිලීර තැන්පත් වීම බෙහෙවින් දක්නට ලැබුණි. විහාරයේ ටයිල් අතුරා නිම කර තිබීම මේ සඳහා ප්‍රභල හේතුවක් විය හැකි ය. පුස් හා දිලීර ඉවත් කිරීම සඳහා (Folicur EW-250 ) 10% ප්‍රතිශතයකින් යුක්තව සිතුවම් ස්ථරය වෙත ඉසීම (spray) සිදුකර මඳ වේලාවකින් පසුව සියුම් බුරුසු ආධාරයෙන් බාහිර තෙරපුම් බලයක් යොදා පිරිසිදු ජලය ආධාරයෙන් පුලුන් (cotton) යොදා ගනිමින් පිරිසිදු කර ගැණිනි. සියලු හායන කාරක හේතුවෙන් වර්ණ ස්ථරයේ සිතුවම් පතුරු ලෙස ඉවත්වීම දක්නට ලැබුණි. බන්ධන දුර්වල වී වර්ණ ස්ථරය, වර්ණ දරන ස්ථරයෙන් ඉවත්වීම මගින් මෙය සීඝ්‍ර වේ. එම නිසා දුර්වල වූ වර්ණ ස්ථරය වෙත 20% Ethyl  alcohol කුඩා සිලින්ජර ආධාරයෙන් එන්නත් කර විසිරුම් කාරකයක් ලෙස යොදා ගැණින. මඳ වේලාවකට පසු 5% කෙමික්‍රිල් ද්‍රාවණය එන්නත් කර මද බාහිර තෙරපුම් බලයක් යොදා ගැලවී ගිය සිතුවම් පතුරු තහවුරු කරන ලදී. ඇතැම් ස්ථානයන්හි වර්ණ දරන ස්ථරය ගැලවී ඉවත් වී යාම හේතුවෙන් වර්ණ ස්ථරයේ ගැඹුරු පලුදු (Deep lacunae) ඇති වී තිබූ අයුරු දක්නට ලැබිණි. මානව ක්‍රියාකාරකම් හා විවිධ හායන කාරකයන් හේතුවෙන් මකර තොරණ සහිත ඉදිරිපස බිත්තියේ මූර්ති කොටස් ගැලවී ඉවත් වී තිබුණි. එහි ඇතැම් ස්ථාන ආධාරකය දක්වා ඉවත් වී තිබුණි. නිසි පරිදි අවශ්‍ය සංරක්ෂණ පිළිවෙත් අනුගමනය කර සංරක්ෂණ කටයුතු නිමා කරන ලදී.

## හම්බන්තොට දිස්ත්‍රික්කය

### මාතර දිස්ත්‍රික්කය

### ගල්කන්ද පුරාණ විහාරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට ගල්කන්ද පුරාණ විහාරය අයත් වේ. මාතර දික්වැල්ල ප්‍රධාන මාර්ගයේ මාතර සිට සැතපුම් 12 ක් පමණ ඉදිරියට ගමන් කරන විට හමුවන හුන්නදෙනිය හන්දියෙන් වමට හැරී ආරුපන මාර්ගයේ සැතපුම් 1 ක් පමණ ඉදිරියට ගමන් කරන විට දකුණු දිශානුගතව පිහිටි ගල්කන්ද විහාර මාර්ගය ඔස්සේ මීටර් 500 පමණ දුරින් වම්පසින් වූ කඳු මුදුනක මෙම විහාරය පිහිටා ඇත. මෙය මහනුවර සම්ප්‍රධායේ දක්ෂිණ ශෛලියට අයත් සිතුවම් හා මූර්තිවලින් සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් විවිධ හායන තත්වයන් සඳහා රසායන සංරක්ෂණ ප්‍රතිකර්ම සිදු කරන ලදී. වර්ණ ස්ථරය මත තිබූ මකුළු දැල් (Spider webs) හා දූවිලි අංශු සියුම් කෙඳි සහිත බුරුසු ආධාරයෙන් ඉවත් කිරීම (Mechanical cleaning on the paint layer) සිදු කරන ලදී. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ගැලවී ඉවත් වී තිබුණු මකර තොරණෙහි පහළ මූර්තිවල කොටස්වල (Missing Parts of the stucco) දුර්වල වූ බදාම ස්ථරය ඉවත් කර සංරක්ෂණ බදාමය උපයෝගී කර ගනිමින් තහවුරු කිරීම හා සිතුවම් සහිත බිත්තියේ පහළ සිට අඩි 10ක් පමණ ඉහළින් තිබූ සිතුවම් සහිත බිත්තියේ බදාම ස්ථරය හා ආධාරකය අතර බන්ධනය දුර්වල වීමෙන් ඉදිරියට නෙරා තිබූ ස්ථාන පිළිසකර කිරීම මගින් හායන තත්වයන්ට නිසි පිළියම් යොදා සංරක්ෂණ කටයුතු සිදුකර අවසන් කරන ලදී.

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික්කය

### යක්ගිරිලෙන පුරාණ රජමහා විහාරය - බිතුසිතුවම් හා මූර්ති සංරක්ෂණ වාර්තාව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් යක්ගිරිලෙන පුරාණ රජමහා විහාරය, කොළඹ කුරුණෑගල හරහා දඹුල්ල මාර්ගයේ මුත්තෙට්ටුගල දුම්රිපල අසලින් වමට හැරී ගනේවත්ත මාර්ගයේ කී.මී. 11 ක් පමණ දුරින් පිහිටි වැල්ලව නගරය පසුකර රංගම හංදියෙන් ගෝනගම මහාමාර්ගයේ කි.මී. 8 ක් පමණ පසු කල පසු කල්විට මංසන්දියෙන් වමට වූ මාර්ගයෙන් කි.මී. 3 ක් පමණ ගිය විට හමුවේ.

වලගම්බා රජු කාලයේ කර වූ බව සඳහන් මෙම ලෙන් විහාරයේ මහනුවර යුගයට අයත් බිතුසිතුවම් හා මූර්ති දැකගත හැකි ය.

මීට වසර කිහිපයකට පෙර සොරුන් විසින් විනාශ කරන ලද සැතපෙන පිළිමය හා මකර තොරණ සහිත සමාධි පිළිමය රසායන සංරක්ෂණ අංශය මඟින් සංරක්ෂණය කර තිබුණි.

සිතුවම් සහිත බිත්ති බොල් වී තිබූ ස්ථාන අවශ්‍ය රසායන ද්‍රව්‍ය යොදා ශක්තිමත් කිරීම, සිතුවම් මත තැන්පත් වී තිබූ අපද්‍රව්‍ය සියුම් පින්සල් උපයෝගි කරගෙන පිරිසිදු කිරීම, ප්ලාස්ටරයේ ගැලවී ගිය කොටස් සුදුසු බදාම සකස් කර නැවත සංරක්ෂණය කිරීම මෙහි දී සිදු කරන ලදී. වේයන්

විසින් හානි කළ ස්ථාන පිරවීම සඳහා වැලි, මැටි, හුණු (3:2:1) අනුපාතයට P. V. A. දියර සමඟ මිශ්‍ර කර යොදා ගන්නා ලදී. අලුතෙන් සකස් කරන තැන් කිහිපයක් සුදුසු වර්ණ යොදා සංරක්ෂණය කිරීම ද මෙහි දී සිදු කරන ලදී.

**තඹරවිට විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් තඹරවිට විහාරය, කුරුණෑගල පුත්තලම මාර්ගයේ නිකවැරටිය නගරය පසුකර කි.මී. 4 ක් පමණ දුරින් හමුවන නැබඩාව වැව හංදියෙන් රස්නායකපුර මාර්ගයේ කි.මී. 6 ක් පමණ පසු කළ පසු නෙලුම්ගල හංදියෙන් දකුණට හැරී ගුරු පාර ඔස්සේ කි.මී.3 ක් ගමන් කළ විට දකුණු පසින් පිහිටා ඇත.

විශාල ගල් තලාවක් මත දිගින් අඩි 39ක් හා පළල අඩි 18 ක් හා උස අඩි 08 ක් පමණ සිටින සේ කොටස් හතරකින් යුක්තව මෙම විහාරය ඉදි කර ඇත. ඇතුළු වන විට හේවිසි මණ්ඩපය ද ඉන්පසු මකර තොරණ සහිත කොටස ද ඉන්පසු පිළිමගෙය ද පිළිමගෙය වටා පිටත මාලය ද වශයෙන් නිමකර තිබේ. මෙහි මූර්ති මහනුවර යුගයට අයත් වන අතර ඉන් පසුව වසර 75 කට පමණ ඉහත නැවත සිතුවම් නවීකරණය කර තිබුණි. මෙහි වහලය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කර පෙති උළු සෙවිලි කර ඇත.

මෙම විහාරයේ පිහිටි පිළිමය පාද දෙක පමණක් ඉතිරි වන්නට නිදන් සොරුන් විසින් කඩා විනාශ කර තිබුණි. වම් පස පිහිටි පිළිමයේ රැස් වළල්ල වම් පැත්ත සම්පූර්ණයෙන් කඩා වැටී තිබූ අතර එහි පහතට යොමු වූ අත සම්පූර්ණයෙන් ම හායනය වී තිබුණි. සමන් දේව රූපයේ සහ විශ්ණු දේව රූපයත් අත් දෙක සම්පූර්ණයෙන් ම කඩා වැටී තිබූ අතර දොරටු පාල රූප දෙකෙහි හා මකර තොරණෙහි තැන් තැන්වලින් කැඩී ගිය කොටස් ද විය. දැව සිවිලිමේ සිතුවම් මත අපද්‍රව්‍ය තැන්පත් වීම නිසා සිතුවම් හා මූර්ති පැහැදිලිව දැක ගැනීමට නො හැකි විය. විහාරයේ ආධාරකය හා බදාම ස්ථරය අතර බොල් වීම් බහුල වශයෙන් දැක ගැනීමට තිබූ අතර පිටත මාලයේ සිතුවම් සියල්ල හායනය වී තිබුණි. මෙම විහාරයේ සිතුවම් හා මූර්ති හායනය වීමට ප්‍රධාන හේතුව වශයෙන් පෙනී යන්නේ විහාරය වන්දනා මාන කිරීමට භාවිතා නොකොට පාලුවට දමා තිබුණු නිසා වවුලන් විශාල වශයෙන් විහාරය තුළ රැඳී සිටීම මෙම තත්වයට හේතු සාධක වන්නට ඇත.

ප්‍රථමයෙන් විහාරයේ රැඳී සිටි වවුලන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කෘමිනාශක යොදා සිතුවම් හා මූර්ති මත තිබූ මකුළු දැල් හා වවුලන්ගේ අපද්‍රව්‍ය ඉවත් කර විහාරය පිරිසිදු කරන ලදී. සොරුන් විසින් විනාශ කරන ලද සමාධි පිළිමයේ කොටස් කිහිපයක් සවිකර අඩුපාඩු සුදුසු බදාම යොදා පුරවා සංරක්ෂණය කර හිටි පිළිමයේ රැස් වලල්ල ප්‍රතිඡ්කීයකරණය කර, විෂ්ණු රූපයේ හා සමන් දේව රූපයෙහි කැඩී ගිය දැත් නැවත සකස් කර සංරක්ෂණය කිරීම ද සිදු කරන ලදී. බොල් වී තිබුණු ස්ථානවලට සුදුසු රසායන ද්‍රව්‍ය යොදා ශක්තිමත් කිරීම මෙන් ම සමාධි පිළිමයේ හා දේව රූපවල අලුතෙන් සැදූ තැන්වලට සුදුසු වර්ණ යොදා ප්‍රතිඡ්කීයකරණය කර මෙහි සංරක්ෂණ කටයුතු සාර්ථකව නිම කරන ලදී.

**වෙලව රඹුක්කන විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වෙලව රඹුක්කන විහාරය, කුරුණෑගල- පුත්තලම මාර්ගයේ අවුලේගම පසුකර කි.මී. 2 ක් පමණ දුරින් පිහිටි රඹුකන හන්දියෙන් වමට ඇති මාර්ගයෙන් කි.මී. 1 ක් පමණ ගොස් වෙලව හන්දියෙන් වමට හැරී ඇළ වේල්ල දිගේ කි.මී. භාගයක් පමණ ගිය විට වම් පසින් හමුවේ. කුඩා ගල් තලාවක් මත දිගින් අඩි 15 ක් පමණ ද, පළලින් අඩි 10 ක් පමණ ප්‍රමාණයට ඉදිකර තිබුණි. මෙම විහාරයේ ඇතුළත සිතුවම් හා මූර්ති නුවර සම්ප්‍රදායට අයත් යැයි සිතිය හැකි ය. විහාරය ඇතුළත අඩි 5ක් පමණ උස ප්‍රධාන සමාධි පිළිමය ද, දෙපසින් හිටි පිළිම දෙකක් හා දේව රූප දෙකක් නිර්මාණය කර තිබේ. වැසි කාලයේ තෙමීම හේතුවෙන් සිතුවම් හා මූර්ති විශාල වශයෙන් හායනය වීමට හේතු වී තිබුණි.

දැනට වසර දෙකකට පමණ පෙර මෙම විහාරයේ වහලය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කර තිබුණි. සිතුවම් හා මූර්තිවල කිසිදු සංරක්ෂණයක් කර නො තිබූ අතර, ආධාරකයෙහි පිට පැත්ත දෙපාර්තමේන්තුව මඟින් හුණු, වැලි කපරාදු කර සංරක්ෂණය කර තිබුණි.

ආධාරකයෙන් වෙන් වී ඉදිරියට නෙරා තිබුණු පිළිමය, පපුව ප්‍රදේශයෙන් අඟල් දෙකක් පමණට කඩා වානේ පටියක් ඇතුල් කර පිළිම වහන්සේ ආධාරකයට සම්බන්ද කර, සමාධි පිළිම වහන්සේගේ හා එහි ආසනයෙහි කැඩී ගිය කොටස් සුදුසු බදාම යොදා ගැලවී ගිය රැස් වළල්ල සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය බදාම ස්ථර ඇලවීම යන කාර්යයන් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී. හිටි පිළිමවල හා මූර්තිවල ගැලවී තිබූ අත් කිහිපයක් නැවත සකස් කර, බොල් වී තිබුණු ස්ථාන සුදුසු රසායන ද්‍රව්‍ය යොදා ශක්තිමත් කර මෙහි සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

## උතුරු මැද පළාත

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**ගල්ලෙන රජමහා විහාරය**

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 472 ගල්නෑව තුලාන ග්‍රාමනිලධාරි වසමේ පිහිටි ගල්ලෙන රජ මහා විහාරය, කුරුණෑගල සිට පාදෙනිය-අනුරාධපුර පාරේ තඹුත්තේගම රැජිණ හංදියෙන් දකුණු දෙසට ඇති ජය මාවතේ කිලෝ මීටර් 30ක් පමණ ගිය පසු හමුවන ගල්නෑව නගරයේ බස්නැවතුම් පොළ අසලින් ඇති පාරේ කිලෝ මීටර් 1ක් පමණ දුරින් පිහිටි ගල්නෑව වැව අසල පිහිටා ඇත.

මෙම විහාරයේ මහනුවර අවධියේ සිතුවම් සහ මූර්ති දක්නට ලැබේ. කටාරම් කොටන ලද ලෙන් විහාරයක් වන මෙම ලෙන තුළ බුද්ධ ප්‍රතිමා සහ දේව ප්‍රතිමා ඉදිකර ඇත. නිල්, කහ, රතු, සුදු යන වර්ණ හතර පමණක් උපයෝගි කරගෙන ඇති අතර තීරුවලට බෙදා සිතුවම් ඇඳ තිබූ අතර මේ වන විට සිතුවම්වලින් 75% ක ප්‍රමාණයක් විනාශ වී තිබුණි. ගර්භ ගෘහයේ පිවිසුම් දොරටුවට දකුණු පස බිත්තියේ සැලකිය යුතු සිතුවම් ප්‍රමාණයක් ආරක්ෂිතව ඉතිරිව තිබුණි. මූර්තිවල බදාම ස්ථරය පොල් කොහු මිශ්‍ර වැලි මැටි බදාමයක් වන අතර බිත්තිවල බදාමය සඳහා ද මෙම වැලි මැටි බදාමය යොදා ගෙන තිබිණි. ඊට අමතරව එයට සිහින්ව අඹරන ලද වැලි මකුල්ල මැටි හෝ හුණු මිශ්‍ර කර ඇත. වර්ණ ලබන ස්ථරය හුණු හෝ මකුල්ල මැටිවලින් සකසා ඇත.

මෙහි හායන ගැටලු රාශියක් දක්නට ලැබුණි. වෙස්සන්තර මූර්තියේ කන්, නහය සහ දකුණු අත වැලමිට ළඟින් සහ වම් අත පහල කොටස කැඩී ගොස් තිබුණි. ක්‍රිෂ්ණාජිනා මූර්තියේ හිස, කඳ කොටසින් ඉවත්ව තිබූ අතර දොරටුපාල රූපවල කොටස් ගැලවී කැබලි කිහිපයකට කැඩී බදාම ස්ථර ගැලවී ගොස් තිබුණි. බිත්තිවල වේයන්ගේ හානිය ද දැඩිව දක්නට තිබුණි. වර්ණ ස්ථරය 80% පමණ විනාශයට පත්ව තිබූ මෙහි කුඩා පිපුරුම් ද බහුලව දක්නට ලැබුණි. පසු කාලීනව පළුදු වූ ස්ථාන මැටිවලින් පුරවා තිබුණි. මෙසේ විවිධ විනාශයන්ට ලක්වූ සිතුවම් හා මූර්ති මැනවින් සංරක්ෂණය කර ව්‍යාපෘතිය නිම කරන ලදී.

**ගෝනමරියාව ටැම්පිට විහාරය**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මැදවච්චිය මැතිවරණ කොට්ඨාසයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ගෝනමරියාව ටැම්පිට විහාරයේ සිතුවම් සංරක්ෂණය පිළිබඳ ව විස්තර පහත පරිදි වේ. අනුරාධපුරයේ සිට යාපනය මාර්ගයේ මැදවච්චිය නගරයට පැමිණ එයින් දකුණට හැරී කැබිතිගොල්ලෑව මාර්ගයේ කි.මී. 25 පමණ පසුකර ගමන් කළවිට මාර්ගයේ වම් පසින් මෙම ගෝනමරියාව ටැම්පිට විහාරය හමු වේ.

පිළිමගෙයක් වන මෙය ටැම්පිට විහාරයකි. ගල්කණු මත සකස් කරන ලද දැව රාමුවක් මත දැව ලෑලි අතුරා ඒ මත වරිච්චි බිත්ති ඉදිකර එහි සිතුවම් නිර්මාණය කර තිබූණු අතර ප්‍රධාන සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ ඒ වටා බිත්තිවල හිටි බුද්ධ ප්‍රතිමා සහ දේව ප්‍රතිමා නිර්මාණය කර තිබුණි. වහලය එල හතරකින් යුතු වන අතර ඉදිරි කොටසේ වහලය එල දෙකක් ලෙස සකස් කර තිබූ මෙහි මුල් අවස්ථාවේ සිංහල උළු සෙවිලි කර තිබී ඇති අතර පසුකාලීනව රට උළු යොදා සකස් කර ඇත. ඉදිරියට එක් වන කොටසට පමණක් පිගන් ගඩොල් අතුරා තිබුණි.

මෙම මූර්ති බොහෝ දුරට ආරක්ෂා වී තිබූණු අතර මේවායෙහි වර්ණ ස්ථරය පමණක් විනාශයට ලක්ව තිබුණි. ප්‍රතිමා කීපයක අත්වල ඇඟිලි සහ අත් ගැලවී ගොස් තිබිණ. මේ සඳහා අවශ්‍ය පිළියම් යොදන ලදී.

**මහ ඇළගමුව ලෙන් විහාරය**

උතුරු පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 64 දරන මහ ඇලගමුව වසමේ මහ ඇළගමුව ලෙන් විහාරය පිළිබඳ ව රසායන සංරක්ෂණ වාර්තාව පහත පරිදි වේ. දඹුල්ලේ සිට අනුරාධපුරය දෙසට යන විට කැකිරාව නගරය හමු වීමට කිලෝමීටර දෙකකට කලින් මහ ඇළගමුව හමු වේ. එතැනින් දකුණු දෙසට කිලෝමීටර එකක් පමණ ගිය පසු විහාරය හමු වේ.

මෙම විහාරයේ ප්‍රධාන හායන ගැටලුවක් ලෙස සඳහන් කළ හැක්කේ වියන් සිතුවම් මත පහන් දැලි තැන්පත් වීමයි. පහන් දැලි ඒවායෙහි තැන්පත් වීමට ප්‍රධාන හේතුව වී තිබුණේ වන්දනාමාන කටයුතුවලට පැමිනෙණ බැතිමතුන් විහාරගෙය තුළ හඳුන් කූරු දැල්වීමයි. මෙයින් වියනේ තිබූ සිතුවම්වලට ප්‍රධන බලපෑමක් වී තිබුණි. වියන් සිතුවම් හි වැඩි වශයෙන් පහන් දැලි තැන්පත් වී තිබුණේ සිවිලිමේ උළුවස්ස දෙසට වන්නට ඉහල කොටසේ තිබූ සිතුවම්වල ය. මූර්තිවල කුණු දූවිලි තැන්පත් වීම් දක්නට තිබුණු අතර මූර්තිවල සුළු ලෙස කැඩී ගිය ස්ථාන දක්නට ලැබුණි. විහාරය තුළ වේයන්ගේ හානිය ද දක්නට ලැබුණි. මෙම විහාරයේ වියන් සිතුවම් කුඩු ලෙස ගැලවී

ගොස් තිබුණු ස්ථාන සහ සිතුවම් පතුරු ගැලවී යන ස්ථාන ද දක්නට තිබුණි. මෙසේ හඳුනාගත් හායන ගැටලුවලට පිලියම් යොදා මෙහි සංරක්ෂණ කටයුතු අවසන් කරන ලදී.

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**නාගලකන්ද ශෛලමය බුද්ධ ප්‍රතිමා සංස්කරණය**

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමගිපුර 57 ග්‍රාමසේවා වසමට අයත් නාගලකන්ද පුරාණ විහාරය, කොළඹ පොළොන්නරු මාර්ගයේ මින්නේරි නගරයට නුදුරින් පිහිටි වෘත්තීය පුහුණු ආයතනයට ඉදිරියෙන් වූ මාර්ගයේ කි.මී. 1 1/2 පමණ වනෝද්‍යානයෙහි ඇතුළට ගිය පසු මෙම ස්ථානයට ළඟා විය හැකි ය.

මෙහි පාෂාණමය ප්‍රතිමා දෙකක් දක්නට ලැබේ. ඉන් එක් පිළිමයක් චතුරස්‍රාකාර පිළිමගෙයි ගර්භ ගෘහය තුළ පිහිටි සෙ.මී. 347 ක පමණ උසින් යුත් අවසාදිත හුණු ගල් පාෂාණයෙන් නෙලන ලද හිටි පිළිමයක් වන අතර කොටස් කිහිපයක් කැඩී විනාශ වී ගොස් නැවත සංරක්ෂණය කර තිබුණි. එහි වම් කණට වඩා දකුණු කන හායනය වී තිබූ අතර දෙඅත් හා දකුණු වැලමිට කොටස් ගැලවී ගොස් තිබුණි. එම කොටස් ගැලවී ගිය ස්ථානයේ අඟල් 2" පමණ ගැඹුරු කුඩා සිදුරු 03ක් දැකගත හැකි අතර වම් අත්ලෙහි පහලින් නෙලා තිබුණු සිවුරු පොටෙහි කොටස් ද ගැලවී විනාශ වී ගොස් තිබුණි. එම කොටසෙහි ද අඟල් 2" පමණ ගැඹුරු සිදුරු දැකගත හැකි විය. අනෙක් පිළිමය චතුරස්‍රාකාර පිළිමගෙයි ගර්භ ගෘහයේ පිටුපස බිත්තියට ආසන්නව පිහිටි සෙ.මී. 262 පමණ උසැති හුණුගල් අවසාදිත පාෂාණයෙන් නෙලා තිබුණු හිටි බුද්ධ ප්‍රතිමාවකි. එහි සිරස, ගෙල ප්‍රදේශයෙන් ඉවත් වී ගොස් නැවත සංරක්ෂණයට භාජනය වී තිබුණි. වම් අතෙහි උරහිසට මදක් පහලින් කැඩී ඉවත්ව ගොස් තිබුණු අතර දකුණු අතෙහි අල්ල කොටස ද කැඩී ඉවත් වී තිබූ අතර පිළිමයේ පහත කොටස් කිහිපයක් හා පාද දෙකෙහි පිටුපස කොටස් ද සංරක්ෂණය කර තිබුණි. මෙම පිළිමය ඉදිරියේ අවපැහැ ගැන්වී තිබූ සිරිපතුල් ගලක් ද විය. එය ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මාණය කර තිබුණි.

මෙම පිළිම දෙකෙහිම පියවි ඇසින් දැකගත හැකි දිලීර හා ඇල්ගී හටගෙන තිබූ අතර ලයිකන සුළු වශයෙන් හටගෙන තිබුණි. මෙම පිළිම තද කළු පැහැයෙන් යුක්ත වීම නිසා එහි සෞන්දර්යාත්මක පෙනුමට බාධාවක්ව පැවතුණි. මේ සඳහා ටිෂූ කඩදාසි (Toilet Paper) කුඩා කැබලිවලට කඩා, සදාගන්නා ලද ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ජලීය ද්‍රාවණය සමඟ මිශ්‍ර කර පල්පයක් සදා එම පල්පය පිළිම හා ආසන මත අතුරා පොලිතින් ආවරණයක් කර පැය කිහිපයක් තැබූ අතර අතුරා තිබූ පල්පය වියලෙන්නට නොදී ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ජලීය ද්‍රාවණය ජල ඉසිනයක් ආධාරයෙන් ඒ මත ඉසින ලදී. මෙම ක්‍රියාවලිය දෙවතාවක් පමණ සිදු කළ අතර ඉන්පසු පල්පය ඉවත් කිරීමෙන් පසු පිළිමය මත තදින් බන්ධනය වී තිබූ කලු පැහැති දිලීර විශේෂ පහසුවෙන් ඉවත්ව යන තත්වයට පත්ව තිබූ අතර ඒවා මෘදු බුරුසු හා ජලය අධාරයෙන් සියුම් ලෙස ඉවත් කරන ලදී. මේ අයුරින් හායන තත්වයන් සඳහා අවශ්‍ය පිළියම් යොදා සංරක්ෂණ කටයුතු නිමා කරන ලදී.

**ගල් විහාරය**

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ගල් විහාරය, මහා පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) විසින් ඉදිකළ උත්තරාරාමය ලෙස හඳුනාගෙන ඇත.

ග්‍රැනයිට් ගල් පෘෂ්ඨය ආධාර කරගෙන නෙලන ලද සමාධි ප්‍රතිමා දෙකක් හිටි පිළිමයක් සහ පිරිනිවන් මංචකය දැක්වෙන පිළිමයක් මෙම ගල්විහාර පරිශ්‍රයෙහි ඇත.

මෙම පිළිම අවට ඇති දූවිලි, සුළඟ මගින් මෙම පිළිම මත තැන්පත් වී තිබුණි. තවද පක්ෂීන් හා රිලවුන් නිරන්තරයෙන් එම ස්ථානයේ ගැවසෙන බැවින් එම සතුන්ගේ අපද්‍රව්‍ය විශාල ලෙස තැන්පත් වී ක්ෂුද්‍ර ජීවීන්ගේ ග්‍රහනයට ලක්ව තිබුණි. මෙම හායන තත්වයන් සඳහා සුදුසු ප්‍රතිකර්ම යෙදීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී.

## පුරාවස්තු සංරක්ෂණය

## උතුරු මැද පළාත

**මැදිරිගිරිය පුරාවස්තු සංරක්ෂණය**

මැදිරිගිරිය පුරාවිද්‍යා ස්ථානය උතුරුමැද පලාත පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුලන්කඩවල ග්‍රමසේවා වසමේ පිහිටා ඇත.

පළමු වන පිළිමගෙය ආසන 03 ක් මත සිටින සෙ.මී.250 පමණ උස හිටි පිළිම 03 කි. මෙම පිළිමවල කොටස් කැඩී යාම් පිපිරුම් ක්ෂය වීම් දැකගත හැකි ය. මෙම හිටි පිළිමය දෙපස උස සෙ.මී. 122 පමණ සමාධි පිළිම දෙකකි. තවද පිළිමගෙය තුළ ගල් කණුවකට හේත්තු කරනලද හිස සහ දෙ අත් ගැලවී ගිය පිළිමයක් සහ ගැලවී ගිය පිළිමයක දෙපා සහිත කොටසක් ද වේ. මෙම පිළිම සියල්ලම හුණුගල් අවසාදිත පාෂාණයෙන් නිර්මාණය කර තිබුණි. දෙවන පිළිමගෙය තුළ උස සෙ.මී. 75 ක් වන සමාධි පිළිමයක් සහ සෙ.මී. 51 ක් උසැති කුඩා සමාධි පිළිම දෙකක් දැකිය හැකි ය. සිරස කැඩී ගිය පිළිම 03 කි. එම පිළිම ඉදිරිපස යන්ත්‍ර ගලක් දක්නට ලැබේ. මෙම පිළිමගෙයි තිබුණු පිළිම ද හුණුගල් අවසාදිත පාෂාණයෙන් නිර්මාණය කර තිබුණි. ඊට අමතරව ඇල්ගී සහ දිලීර විශේෂ මෙම පිළිම ගෙවල් තුළ වූ පිළිම හා ඒවා තබා ඇති ආසන මත දැක ගත හැකි විය. මෙහි තිබූ අත්තාණි කණු මත ද දිලීර, ඇල්ගී සහ ලයිකන විශේෂ වර්ධනය වී තිබුණි.

වටදාගෙය පිවිසුම ඉදිරියෙන් වම්පස වූ පුන්කලසෙහි ආසනයේ කැඩී සෙලවෙමින් තිබූ කොටසක් සහ පිපිරීගිය ස්ථාන සිව් දිසානුගතව තබා තිබුණි සමාධි පිළිමය සහ එම ආසනවල කැඩීගිය ස්ථාන, පිපිරීගිය ස්ථාන කිහිපයක් දැකගත හැකි විය. මේවා හුණුගල් අවසාදිත පාෂාණයෙන් නිර්මාණය කර තිබුණි. පිපුරුම් හා ඉරි තැලී ගිය ස්ථාන කුණු දූවිලි අපද්‍රව්‍ය තැන්පත් වීම හා කුඩා පැළෑටි ඒ මත වැඩී පිපිරී තිබෙන තත්වය වැඩි වීමට ඉඩ තිබුණු බැවින් ප්‍රතිකර්ම සිදු කිරීම අවශ්‍ය වේ. අවශ්‍ය සංරක්ෂණ කටයුතු ක්‍රියාවට නැංවිණි.

## අභිලේඛන හා නාණකවිද්‍යා අංශය

අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් 2016 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය.

01. ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය.
02. ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය.
03. කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය.
04. අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය.
05. ඓතිහාසික අභිලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය.

**01.ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය**

2016 වර්ෂයේ දී අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් ශිලාලේඛන 84 ක් පිටපත් කර ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ. මේ සඳහා වැය කිරීම් රුපියල් 605,650.00 කි.

### බස්නාහිර පළාත

2016 වර්ෂයේ දී අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් බස්නාහිර පළාතේ ශිලාලේඛන එකක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4339 | 2016.06.02 | පුවරු | ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලැපිටිමුල්ල ග්‍රාම සේවා නිලධාරි වසමේ මංගල අභයසිංහ මහතාගේ ඉඩමෙන් හමු වී දැනට සපුගහතම්මිට බෝධියංගන විහාරස්ථානයේ තැන්පත් කර ඇත. | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 1-2 සියවස් | ලජ්ජිතිස්ස රජතුමා විසින් පබ්බත (ආරාම) දෙකකට සිව්පසය වෙනුවෙන් සරිබ නම් ආස්ථානය නියත කර දීම |

### මධ්‍යම පළාත

2016 වර්ෂයේ දී අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් මධ්‍යම පළාතේ ශිලාලේඛන 04 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4337 | 2016.04.23 | ගිරි | මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මාරතුගොඩ ග්‍රාම සේවා නිලධාරි වසමේ මාරතුගොඩ "විදුමිණ" පිරිවෙන් විහාරස්ථානයේ බුදු මැදුර අසල. | | | | |
| 4342 | 2016.06.11 | ගිරි | මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ | පරිවර්තිත බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 05-06 සියවස් | වහරල ලිපියකි |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | බුලාගල ග්‍රාම සේවා නිලධාරි වසමේ බුලාගල රංදෙණිය රජ මහා විහාරයේ බෝධීන් වහන්සේ පිහිටි ස්ථානයට දකුණු පසින් ඇති ගල්තලාවේ පසෙකින් දක්නට ඇති දෙවන ගිරි ලිපිය | | | | |
| 4350 | 2016.06.16 | ගිරි | මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ රත්මල්කඩුව ග්‍රාම සේවා නිලධාරි වසමේ එඬේරගල ආරණ්‍ය සේනාසනයේ නාම පුවරුවට වම්පසින් බිම පිහිටා ඇති කුඩාගලේ | | | | |
| 4351 | 2016.06.17 | ගිරි | ඉහත සේනාසනයේ නාම පුවරුවට වම්පසින් ඇතුළට පිහිටි පොකුණේ ඉස්මත්තේ පිහිටි ගලේ | | | | |

## දකුණු පළාත

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් දකුණු පළාතේ ශිලාලේඛන 03 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4320 | 2016.01.26 | ටැම් | මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහල අපරැක්ක ග්‍රාම සේවා නිලධාරී වසමේ පල්ලෙ අපරැක්ක මුත්තෙට්ටුවත්ත එම්.කේ ජිනදාස මහතාගේ නිවස පිටුපස. | | | | |
| | | | | | | | |
| 4338 | | තඹ සන්නස | දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මොරවක කෝරලයේ පනාකඩුව නම් ගමේ බෝගහදෙණිය නම් කුඹුරෙන් | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 11 සියවස් | විජයබාහු රජගේ තඹ සන්නස |
| 4399 | 2016.10.22 | පුවරු | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 97/A වැලිවත්ත ග්‍රාමසේවා නිලධාරී වසමේ ඇංග්ලිකන් දේවස්ථානයේ පැරණි සුසාන භූමියේ (රිචඩ් පතිරණ අනුස්මරණ මහජන පුස්තකාලය අසල ලිපි 75 කි). | | | | |

## උතුරු පළාත

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් උතුරු පළාතෙන් ශිලාලේඛන 02 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4340 | 2016.06.06 | ටැම් | වවුනියාව දිස්ත්‍රික්කයේ වෙන්කලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 207-B පෙරියකට්ටු ග්‍රාම සේවා නිලධාරී වසමේ ගනේෂපුරම්-වව්නියාව මන්නාරම පාරේ ගනේෂපුරම් S.T.F හමුදා කඳවුර පසුකර එනවිට ගනේෂපුරම් හන්දියෙන් හැරී ටික දුරක් යන විට හමුවන පෞද්ගලික ඉඩමක බිම වැටී ඇති ටැම් ලිපිය | | | | |
| 4341 | 2016.06.09 | ටැම් | වවුනියාවේ දිස්ත්‍රික්කයේ සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආඩියාපුලියන්කුලම ග්‍රාම සේවා නිලධාරී වසමේ මැණික්ෆාම් යුධ හමුදා කෘෂිකාර්මික ව්‍යාපෘතිය යටතේ සෙට්ටිකුලම් හි මැණික්ෆාම් කඳවුරේ බෝධීන් වහන්සේ පිහිටුවා ඇති භූමියේ සිටුවා ඇත. | | | | |

## සබරගමුව පලාත

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් උතුරු පලාතෙන් ශිලාලේඛන 01 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4352 | 2016.06.23 | ගිරි | කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 73-ඒ වෙහෙරගොඩ ග්‍රාම සේවා නිලධාරී වසමේ වෙහෙරගොඩ අංක 130 දරන නිවස පිටුපස මීටර් 130 දරන නිවස පිටුපස මීටර් 100 ක් පමණ දුරින් පිහිටි ගල් තලාවේ | | | | |

## වයඹ පළාත

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් වයඹ පළාතෙන් ශිලාලේඛන 09 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4343 | 2016.06.13 | ටැම් | වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පඩුවස්නුවර ග්‍රාම සේවා නිලධාරී වසමේ පඩුවස්නුවර කෞතුකාගාරය ඉදිරිපිට සිටුවා ඇති ටැම් ලිපිය | | | | |
| 4344 | 2016.06.14 | ටැම් | එම | | | | |
| 4345 | 2016.06.15 | ටැම් | එම | | | | |
| 4346 | 2016.06.16 | ටැම් | එම | | | | |
| 4347 | 2016.06.17 | ටැම් | එම | | | | |
| 4348 | 2016.06.18 | ටැම් | එම | | | | |
| 4349 | 2016.06.19 | ටැම් | එම | | | | |
| 4353 | 2016.04.27 | තඹ සන්නස | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තම්මැන්නාව ග්‍රාම සේවා නිලධාරී වසමේ ගල්ලෙන් පුරාණ විහාරය | නූතන සිංහල | නූතන සිංහල | ක්‍රිස්තු වර්ෂ 1768 සියවස් | |
| 4390 | 2016.09.21 | ටැම් | කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 167, ඉපලෝගම ග්‍රාම සේවා නිලධාරී වසමේ ශ්‍රී බොධිරුක්ඛාරාමය (ඉපලෝගම) ටැම්පිට විහරය අසල | | | | |

## නැගෙනහිර පළාත.

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් නැගෙනහිර පලාතෙන් ශිලාලේඛන 17 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4321 | 2016.02.06 | ගිරි | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්ලාරු ග්‍රාම නිලධාරී වසමේ මාවිල්ආරු ජලාශයට පිවිසෙන මර්ගයේ දකුණු පසින් හමුවන ගම්මානයට ජලය රැගෙන යන සොරොව්ව අසළින් ගොස් එම ජලාශය අවසානයේ සිට එරණියන්මලෙයි රක්ෂිතයට ඇතුල්වී 12 km ගිය පසු එරණියන්මලෙයි පුරාවිද්‍යා ස්ථානය හමු වේ එහි ඇති ප්‍රධාන පර්වතයට පහල ඇති ගල්තලාවේ පඩිපෙලට වම් පසින් ඇති ශිලාලේඛන | | | | |
| 4322 | 2016.02.06 | ගිරි | එම | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | | |
| 4323 | 2016.02.07 | ගිරි | එම | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4324 | 2016.02.07 | ගිරි | එම | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-3 සියවස් | |
| 4325 | 2016.02.08 | ගිරි | එම ප්‍රධාන පර්වතය මුදුනේ පඩිපෙලට වම් පසින් | | | | |
| 4326 | 2016.02.13 | පුවරු | අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණුවතුර බුබුල ග්‍රාම නිලධාරී වසමේ ජේ.ඒ මිල්ටන් ජයසිංහ සහ වයි.බී සෝමපාල යන මහත්වරුන්ගේ නිදන්වල, වැලිඅලයාය යන ලිපිනයේ පිහිටි හේන්යායේ පැලට පිටුපසින් 25m පමණ යනවිට හමුවන විනාශ වී ගිය වැව් බැම්මේ දකුණු පසින් ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | | | |
| 4354 | 2016.07.01 | ලෙන් | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර්ප්‍රාදේශීය ලේකම් කෙට්ඨාසයේ මුතූර් ග්‍රාම සේවා නිලධරී වසමේ පච්චනූර් ගල්කන්ද කෙළෙවර ලෙනේ පිහිටි ලිපිය | | | | |
| 4355 | 2016.07.02 | ලෙන් | එම ස්ථානයේ පහළින් කන්ද බෑවුම් ඇති ලෙන් ලිපිය | | | | |
| 4356 | 2016.07.14 | පුවරු | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර  මුතූර් ග්‍රාම සේවා නිලධරී වසමේ බමුණුවිලයාය පඩකට්ටුව නම් ස්ථානයේ ඉදිකර ඇති පැරණි කෝවිල් භූමියට දකුණු පස පිහිටි එක් ගල් කණුවක | | | | |
| 4357 | 2016.07.08 | ලෙන් | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරුගල් ප්‍රාදේශීය ලේකම්  කොට්ඨාසයේ ඊච්චිලම්පත්තු ග්‍රාම සේවා නිලධාරී වසමේ ඊච්චිලම්පත්තු නම් පුරාවිද්‍යා ස්ථානයේ මුලින් ම හමුවන ලෙනේ | | | | |
| 4358 | 2016.07.08 | ලෙන් | එම ලෙනේ ම පහතින් ඇති ලිපිය | | | | |
| 4359 | 2016.07.13 | ගිරි | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ  215 ඊ කාවන්තිස්සපුර ග්‍රාම සේවා නිලධාරී වසමේ සේරුවිල කාවන්තිස්සපුර ශ්‍රී සුමේධාකර වන සෙනසුනේ ඇති ස්තූපයට වම්පසින් පිහිටි ගල්තලාවේ ඇති ගිරි ලිපිය | | | | |
| 4360 | 2016.07.18 | ගිරි | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ  ලිංගපුරම් ග්‍රාම සේවා නිලධාරී වසමේ කිලිවෙඩ්ඩි ලිංගපුරම් සරස්වතී විද්‍යාලය අසල ගුරු පාරේ යන විට පැරණි පොකුණක් සහිත ස්ථානයේ ඉහලින් ඇති ගල්තලාව් උඩට පිහිටි ගිරි ලිපිය | | | | |
| 4361 | 2016.07.19 | ගිරි | එම ස්ථානයට උඩ පිහිටි ගිරි ලිපියට පහතින් ඇති ලිපිය | | | | |
| 4362 | 2016.07.20 | ගිරි | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ  215 සේරුවිල ග්‍රාම සේවා නිලධාරී වසමේ සේරුවිල ජේ.ඒ රාජා සුනිල්  මහතාගේ ගොඩ ඉඩමේ පිහිටි බිම පෙරළා ඇති ගල් කට්ටියේ ශිලාලිපිය | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4400 | 2016.11.23 | ගඩොල් | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 217 දෙහිවත්ත ග්‍රාම සේවා නිලධාරී වසමේ දෙහිවත්ත සිරිවඩ්ඩන රජ මහාවිහාරයේ කැණීමෙන් හමු වූ ගඩොල්වල අක්ෂර | | | | |

<u>උතුරු මැද පලාත.</u>

2016 වර්ෂයේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් උතුරු මැද පලාතෙන් ශිලාලේඛන 47 ක් පිටපත් කර ඇත.

| ලියාපදිංචි අංකය | පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 4327 | 2016.03.08 | ගිරි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දකාඩු ගොවිපලේ සිට කිලෝ මීටර් 01 ක් පමණ යන විට හමුවන ගල් පර්වතයේ පොකුණට ඉහළින් ඇති ගල්තලාවේ කුඩා ගිරි ලිපිය | | | | |
| 4328 | 2016.03.09 | පුවරු | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 135 පුලත්තිගම ග්‍රාම සේවා නිලධාරී වසමේ පුලස්තිගම BOP 400 ශාඛ්‍ය බිම්බාරාමයේ පුවරු ලිපිය, විහාරයේ ශබ්ද විකාශන යන්ත්‍රය සවි කර ඇති කුලුනට යටින් දූනට තැන්පත් කර ඇත | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | | |
| 4329 | 2016.03.11 | ගිරි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282, මහින්දාගම ග්‍රාම සේවා නිලධාරී වසමේ කවුඩාගල විහාර සංකීර්ණය සහිත භූමියේ ගරා වැටුණු ස්තූපය ඉදිරිපිට ඇති ගිරි ලිපිය | | | | |
| 4330 | 2016.03.25 | ටැම් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 230, මල්දෙණිය ග්‍රාම සේවා නිලධාරී වසමේ ශ්‍රී ධම්මරක්ඛිත විවේක සේනාසනයේ ටැම් ලිපිය | | | | |
| 4331 | 2016.03.30 | ලෙන් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282, මහින්දාගම ග්‍රාම සේවා නිලධාරී වසමේ කවුඩාගල ආරණ්‍ය සේනාසනයේ අඩි 80 ක් පමණ දිග ලෙනේ ශිලාලේඛනය | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-1 සියවස් | |
| 4332 | 2016.04.03 | ලෙන් | එම ස්ථානයේ අඩි 80 ක් දිග ලෙනට ඉහළින් පර්වතය මධ්‍යයට වන්නට ඇති ලෙනේ ලිපිය | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2 සියවස් | |
| 4333 | 2016.04.03 | ලෙන් | එම ස්ථානයේ මධ්‍ය ගල් ලෙනට ඉහළින් ආසන්නයේ පිහිටි ලෙන් දෙකේ උඩ ලෙනේ පිහිටි ශිලාලේඛනය | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-1 සියවස් | |
| 4334 | 2016.04.23 | ලෙන් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282, මහින්දාගම ග්‍රාම සේවා නිලධාරී වසමේ පන්සල්ගල කුරුළුබැද්ද පන්සලට වම් පසින් ඇති මාර්ගයේ කිලෝමීටර් 1 පමණ යන විට | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ගම්මානය කෙළවරේ වමට ඇති මාර්ගයේ යනවිට හමුවන පුරාවිද්‍යා ස්ථානයේ ලෙනේ වම්පස කෙළෙවර ලිපිය | | | | |
| 4335 | 2016.04.05 | ලෙන් | එම | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-1 සියවස් | |
| 4336 | 2016.04.05 | ලෙන් | එම | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-1 සියවස් | |
| 4363 | 2016.07.14 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 11 උදුරුවැව නාවාගස්වැව ග්‍රාම සේවා නිලධාරී වසමේ ගරා වැටුණු ස්තූපයට මීටර් 05 ක් පමණ බැවුමට වන්නට ගිණිකොණ දෙසින් ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-3 සියවස් | |
| 4364 | 2016.07.14 | ගිරි | එම ස්ථානයේ ම ගරා වැටුණු ස්තූපය අසල දකුණුපසින් ඇති පළමුවන ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4365 | 2016.07.14 | ගිරි | එම ස්ථානයේ ම ගරා වැටුණු ස්තූපය අසල දකුණුපසින් ඇති දෙවන ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4366 | 2016.07.14 | ගිරි | එම ස්ථානයේ ම නටබුන් වූ ස්තූපය බෑවුමේ ඇති ලිපියට 10 මීටර් පමණ බටහිරින් ඇති ගල්තලාවේ ගල්කුටියට ඉදිරිපස බාදනය වූ ගල්තලාවේ ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4367 | 2016.07.14 | ගිරි | එම ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4368 | 2016.07.14 | ගිරි | එම ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4369 | 2016.07.15 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝගහවැව ග්‍රාම සේවා නිලධාරී වසමේ බොරළුකන්ද අරුණගම පුරාවිද්‍යා ස්ථානය ආරණ්‍ය සේනාසනයට යන අඩි පාරේ මීටර්100 ක් නැගෙනහිර දෙසට යන විට නිදන්හොරු විසින් කැඩූ ස්තූපයට ඊශාන දෙසින් නැගෙනහිර දෙසින් ගල්කෙමිය අසල ඇති ලිපිය | | | | |
| 4370 | 2016.07.15 | ගිරි | එම ස්ථානයේ ම අංක 01 ලිපියට 5 මීටර් පමණ උතුරු දෙසින් | | | | |
| 4371 | 2016.07.16 | ටැම් | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 05 තුලාන ග්‍රාම සේවා නිලධාරී වසමේ බුද්ධංගල රජ මහා විහාරයේ විහාරයට ඇතුළු වන පියගැට පෙළ අසල ඇති අඹගහ යට ඇති ලිපිය | | | | |
| 4372 | 2016.07.16 | ටැම් | එම ස්ථානයේ ම | | | | |
| 4373 | 2016.07.16 | | එම ස්ථානයේ ම | | | | |
| 4374 | 2016.07.16 | ගිරි | එම ස්ථානයේ විහාර භූමියේ කඳු මුදුනේ ඇති ලෙන් විහාරයට බටහිර දෙසින් ඇති ගල් පොකුණට දකුණුපසින් ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-3 සියවස් | |
| 4375 | 2016.07.16 | ටැම් | එම ස්ථානයේ ම කඳු මුදුනේ ඇති මෑතක දී ඉදි කරන ලද ලෙන් | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විහාරයේ උතුරු දෙසට වන්නට ඇති පැරණි දේවාලය ලෙස ඉදිකරන ලද ගොඩනැගිල්ලේ උළුවස්සට දකුණු පසින් තැන්පත් කර ඇත | | | | |
| 4376 | 2016.07.19 | | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 බිසෝකොටුව ග්‍රාම සේවා නිලධාරී වසමේ පදවිය පුරාවිද්‍යා ස්ථානයේ ස්තූපයට (නටබුන්) පිවිසෙන දකුණු දොරටුවේ පියගැටපෙළේ දකුණුපස මුරගලෙහි වූ ලිපිය | | | | |
| 4377 | 2016.07.19 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 14 තුලාන පදවිය ග්‍රාම සේවා නිලධාරී වසමේ ගල්වල වෙහෙරගල නමින් හඳුන්වන ගමෙහි නටබුන් ඇති ස්තූපයට දකුණු පස ඇති ගල්වැටියේ නැගෙනහිර දෙසින් ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 5-6 සියවස් | |
| 4378 | 2016.07.19 | ගිරි | එම ස්ථානයේ ම ගල්තලාවේ දකුණු කෙළවර ඇති ලිපිය | | | | |
| 4379 | 2016.07.20 | පුවරු | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 14 බෝගහවැව ග්‍රාම සේවා නිලධාරී වසමේ අලුත්හල්මිල්ලෑව විහාර භූමියේ නටබුන්ව ගිය පිළිමගෙය සේ හඳුන්වන ගොඩනැගිල්ලේ දොරටුව ඉදිරිපිට තැන්පත් කර ඇත | | | | |
| 4380 | 2016.07.21 | පුවරු | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 බිසෝකොටුව ග්‍රාම සේවා නිලධාරී වසමේ පදවිය ආයුර්වේද රෝහල ඉදිරිපිට ඇති පුරාවිද්‍යාත්මක රක්ෂිත භූමියේ 100 m ක් පමණ ඉදිරිපිට තැන්පත් කර ඇත | | | | |
| 4381 | 2016.07.19 | පුවරු | අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 624 මයිලගස්වැව ග්‍රාම සේවා නිලධාරී වසමේ මානික්කුලම සඳගල්පාය රජමහා විහාරයේ පොකුණ අසල පියගැටපෙලට දකුණුපසින් පළමු පඩිය හා හත්වන පඩිය අසල | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 2-1 සියවස් | |
| 4382 | 2016.07.28 | පුවරු | එම ස්ථානයේ | | | | |
| 4383 | 2016.07.29 | ටැම් | එම ස්ථානයේ බෝ මළුවේ සිටුවා ඇති ටැම් ලිපිය | | | | |
| 4384 | 2016.07.28 | | එම ස්ථානයේ ස්තූපයේ වැලි මළුවේ අරලිය ගස් අතර ඇති ලිපිය | | | | |
| 4385 | 2016.07.29 | | එම ස්ථානයේ බටහිර අන්තයේ සලපතල මළුවේ | | | | |
| 4386 | 2016.07.30 | ගිරි | එම ස්ථානයේ ආවාස ගෙය පිටුපසින් ඇති ගල්තලාවේ ඇති ලිපිය | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස් | |
| 4387 | 2016.08.12 | ලෙන් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුම්බනාච්චිය පුරාවිද්‍යා ස්ථානයේ | | | | |
| 4388 | 2016.08.13 | ටැම් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155 ඇතුමල්පිටිය ග්‍රාම සේවා නිලධාරී වසමේ පොළොන්නරුව අංක 02 ශිව දේවාලයේ ඇතුලු වන විට වම් | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | පසින් බිම වැටී ඇති උළුවස්සේ ලිපිය | | | | |
| 4389 | 2016.08.14 | පුවරු | එම ස්ථානයේ ම අලුතින් කැණීම් කළ ස්ථානයේ (පඩි පෙලක් වැනි) පුවරු කැබලි පහෙන් හතර වැනි කණුවේ ලිපිය | | | | |
| 4391 | 2016.10.03 | ගිරි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෝමාවතිය වනජීවී රක්ෂිත ප්‍රදේශයේ මැදිරිගිරිය වනජීවී කලාපයේ දේවාලේපොත්ත නම් ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස් | |
| 4392 | 2016.10.03 | ගිරි | ඉහත ස්ථානයේ අනෙක් ලිපිය | | | | |
| 4393 | 2016.10.06 | ගිරි | ඉහත වනජීවී කලාපයේ එයාර් පෝර්ට්ගල නම් ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3-4 සියවස් | |
| 4394 | 2016.10.12 | ගිරි | ඉහත වනජීවී කලාපයේ වීරසුරංගල නම් ස්ථානයේ | | | | |
| 4395 | 2016.10.14 | ගිරි | ඉහත මැදිරිගිරිය වනජීවී කලාපයේ හල්මිල්ලෑව ගම්මානයේ ගමට පහළින් ඇති රක්ෂිතයේ තෙලඹුගල නම් ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | |
| 4396 | 2016.10.15 | ගිරි | එම ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3-4 සියවස් | |
| 4397 | 2016.10.16 | ගිරි | එම ස්ථානයේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3-4 සියවස් | |
| 4398 | 2016.10.22 | ගිරි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදිරිගිරිය වනජීවී කලාපයේ නෙළුම්විලගල නම් ස්ථානයේ | | | | |
| 4401 | 2016.11.25 | ගිරි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 234 වෙහෙරගල ග්‍රාම සේවා නිලධාරී වසමේ වෙහෙරගල මහසෙන් රජ මහ විහාරයේ අළුතෙන් ඉදිකරන ලද සණ්ටාර කුළුන පොකුණ සහ පිළිමගෙය අතර ගල්තලාවේ | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස් | |
| 4402 | 2016.11.26 | ගිරි | එම ස්ථානයේ පොකුණට වම් පසින් ඇති කුඩා පහන් වැටට මීටර් 04 ක් පමණ වම් පසින් ඇති ගල්තලාවේ | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 5-6 සියවස් | |

**02. ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය**

2016 වර්ෂයේ ඉහත ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 22 ක් සඳහා පරිවර්තන නාම පුවරු සවි කර ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**පරිවර්තන නාම පුවරු යෙදූ ස්ථාන**

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ස්ථානය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| බස්නාහිර | ගම්පහ | අත්තනගල්ල | වාරණ රජමහා විහාර ගිරි ලිපිය | 1 |
| මධ්‍යම | මහනුවර | මැදදුම්බර | බඹරගල රජමහා විහාර ලෙන් ලිපිය | 1 |
| | මහනුවර | උඩහේවාහැට | මාදන්වල විහාර ටැම් ලිපිය | 1 |
| | මහනුවර | යටිනුවර | වේගිරිය දේවාල ගිරි ලිපිය | 1 |
| දකුණ | හම්බන්තොට | තංගල්ල | කහදාව රජමහා විහාර ගිරි ලිපිය | 1 |
| | හම්බන්තොට | තිස්සමහාරාම | නිමලව වෙහෙරකෙම ගිරි ලිපිය | 1 |
| | හම්බන්තොට | තිස්සමහාරාම | මදුනාගල ආරණ්‍ය සේනාසන ගිරි ලිපිය | 1 |
| වයඹ | කුරුණෑගල | පොල්පිතිගම | හංගමුව රජමහා විහාර ගිරි ලිපිය | 1 |
| | කුරුණෑගල | පියුම්ගල්ල | කදිරාගල රජමහා විහාර ගිරි ලිපිය | 1 |
| | කුරුණෑගල | වාරියපොළ | බයව ටැම් ලිපිය | 1 |
| | කුරුණෑගල | ගනේවත්ත | ගනේවත්ත ගනේවිහාර ලෙන් ලිපිය අංක 1 | 1 |
| උතුරු මැද | අනුරාධපුර | ම.නු.ප | දක්ඛිණ ස්තූප පුවරු ලිපි | 1 |
| | පොළොන්නරුව | දිඹුලාගල | දිඹුලාගල නාමල් පොකුණ ලෙන් ලිපිය | 1 |
| | පොළොන්නරුව | හිඟුරක්ගොඩ | මින්නේරිය ටැම් ලිපිය | 1 |
| | පොළොන්නරුව | ගිරිතලේ | කෝට්ටපිටිය පුවරු ලිපිය | 1 |
| ඌව | බදුල්ල | බදුල්ල | බදුලු ටැම් ලිපිය | 1 |
| | මොණරාගල | බුත්තල | කටුගහගල්ගේ ලෙන් ලිපිය | 1 |
| සබරගමුව | රත්නපුර | ඇඹිලිපිටිය | සංඛපාල ලෙන් ලිපිය අංක 1 | 1 |
| | කෑගල්ල | වරකාපොල | සල්ගලවතේ ලෙන් ලිපිය | 1 |
| නැගෙනහිර | අම්පාර | ලාහුගල | තරුලෙන් ගල කරඹහෙල ගිරි ලිපි | 1 |
| | ත්‍රිකුණාමලය | සේරුවාවිල | සේරුවාවිල ගිරි ගිපිය | 1 |
| | අම්පාර | ලාහුගල | කුඩිම්බිගල ලෙන් ලිපිය | 1 |
| | | | එකතුව | 22 |

### 03 . කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය

2016 වර්ෂයේ ද අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කාසි 364 ද යාපහුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කාසි 113 ක් ද මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කාසි 156 ද සුචිගත කරන ලදී එම කාසි වර්ග හා ප්‍රමාණයන් පහත පරිදි වේ

**පඩුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සුචිගත කරන ලද කාසි**

| කාසි වර්ගය | අවධිය | ප්‍රමාණය |
|---|---|---|
| 1.රෝම කාසි | ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් | 322 |
| 2.ඕලන්ද VOC කාසි | ක්‍රිස්තු වර්ෂ 16 සියවස් | 33 |
| 3.බ්‍රිතාන්‍ය කාසි | ක්‍රිස්තු වර්ෂ 17 සියවස් | 09 |
| | එකතුව | 364 |

**යාපහුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ සුචිගත කරන ලද කාසි**

| කාසි වර්ගය | අවධිය | ප්‍රමාණය |
|---|---|---|
| 01.තඹ මස්ස කාසිය | | |
| I වන විජයබාහු | ක්‍රිස්තු වර්ෂ 1055-1111 | 17 |
| I වන පරාක්‍රමබාහු | ක්‍රිස්තු වර්ෂ 1153-1186 | 24 |
| ලීලාවතී රැජින | ක්‍රිස්තු වර්ෂ 1197-1200 | 11 |
| සාහස්සමල්ල | ක්‍රිස්තු වර්ෂ 1200-1202 | 23 |
| ධර්මාශෝක දේව | ක්‍රිස්තු වර්ෂ 1208-1209 | 03 |
| භුවනෙකබාහු | ක්‍රිස්තු වර්ෂ 1273-1284 | 25 |
| 02.චීන කාසි | ක්‍රිස්තු වර්ෂ 1273-1284 | 10 |
| | එකතුව | 113 |

**මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සුචිගත කරන ලද කාසි**

| කාසි වර්ගය | අවධිය | ප්‍රමාණය |
|---|---|---|
| 01.තඹ මස්ස කාසිය | | |
| ලීලාවතී රැජින | ක්‍රිස්තු වර්ෂ 1197-1200 | 42 |
| සහස්සමල්ල | ක්‍රිස්තු වර්ෂ 1200-1202 | 104 |
| ධර්මාශෝක දේව | ක්‍රිස්තු වර්ෂ 1208-1209 | 10 |
| | එකතුව | 156 |

**04. අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය**

2016 වර්ෂයේ දී අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව ශිලාලේඛන 20ක් කියවා ශාස්ත්‍රීය අධ්‍යයනයට ලක්කර පර්යේෂණ සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එසේ පර්යේෂණය කරන ලද නව ශිලාලේඛන පහත පරිදි ය.

කරදියනාරු ශිලාලේඛන (I,II,III)
බුලාගල රන්දෙණිය රජ මහා විහාර ගිරි ලිපිය
මාදන්වල ටැම් ලිපිය
පරගහකැලේ ලෙන් ලිපිය
ඇඹෝගම ගිරි ලිපිය
කල්වෙට්ටුපොතාන ශිලාලිපි
රන්ගිරිලෙන විහාර ගිරි ලිපිය
ගල්ලෙන් විහාර තඹ සන්නස
රූපස්කුළම ශිලාලේඛන (I,II,III)
කයිලබේ ගිරි ලිපිය
පොල්ලේබැද්ද ගිරි ලිපිය
ඉළුක්පිටිය රජමහා විහාර ශිලාලේඛන (I,II,III,IV)

**05. ඓතිහාසික අභිලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය**

2016 වර්ෂයේ දී අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් ඓතිහාසික අභිලේඛන 50 ක් සුචිගත කරන ලදී. ඒ අනුව ශ්‍රී සද්ධර්ම ගුප්ත පිරිවෙන් විහාරයේ පුස්කොල පොත් 50 ක් මේ යටතේ සුචිගත කෙරිණි. බෞද්ධ ග්‍රන්ථ, ව්‍යාකරණ ග්‍රන්ථ, විනය ග්‍රන්ථ ආදිය මේ පුස්කොළ පොත් හි අන්තර්ගත වී ඇත.

# නඩත්තු අංශය

## මධ්‍යම පලාත

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**පුසුල්පිටිය රජමහා විහාරයේ වහළ සැකසීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවන්ගම පුසුල්පිටිය ග්‍රාමයේ මෙම රජමහා විහාරය පිහිටා ඇත. නාවලපිටිය පූඩළුඔය මාර්ගයේ කි.මී 22ක් ගිය පසු පහළ කලාපීය හන්දිය හමුවේ එතැන් සිට මීටර 5 ගිය පසු මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

මෙම පුරාවිද්‍යා ස්ථානය අනුරාධපුර, පොළොන්නරු යුගවල ඡායා මාත්‍රික තොරතුරු අනාවරණය වන ස්ථානයක් බැවින් වත්මන් පරපුරට නොව අනාගත පරපුරට තොරතුරු දැන ගැනීම පිණිස ස්මාරකයේ පැවැත්ම දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමට ඉඩ ප්‍රස්ථා ලබා දීම මෙහි ලා මුඛ්‍ය අරමුණ වේ.

පුසුල්පිටිය රජමහ විහාරය පිළිබඳ ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී එය දේවානම් පියතිස්ස රජ සමය දක්වා දිවේ. එකල ශ්‍රී මහා බෝධියට සම්බන්ධ අෂ්ටඵල බෝධියක් මෙම ස්ථානයේ රෝපණය කළ බවත් දැනට තිබෙන බෝධිය එය බවත් සඳහන් ය. 10 x 8 x 3 ක ප්‍රමාණයේ ගලක සිරි පතුල පිහිටා ඇති අතර මුල්කාලීනව වන්දනාමාන කර ඇත්තේ මෙම සිරිපතුල් ගල හා බෝධියට ය.

ජනප්‍රවාදයට අනුව දුටුගැමුණු රජතුමා තම පියා සමඟ ඇති කර ගත් අමනාපය නිසා රුහුණේ සිට පලාවිත් ගුත්තා ලෙස වෙස් වළාගෙන කොටගේපිටිය විසුරු ගෙදර සිට රජතලාව නැමැති කුඹුරු අස්වද්දා කෘෂි කර්මාන්ත කටයුතු සිදු කරමින් එම ප්‍රදේශයේ වාසය කළ කාලයේ මෙම ස්ථානය වැදුම් පිදුම් සඳහා යොදා ගත් බව ජනප්‍රවාදයේ කියැවේ.

පොළොන්නරුවේ කාලිංග මාඝ රජ සමයේ දළදා කරඬුව මෙම ස්ථානයේ සඟවා තිබූ අතර ඒ සඳහා මහ විහාරයේ කරඬු යොදා ගත් බව ද සඳහන් ය. ආවාසය ඉදිරිපිට ඇති විශාල සපු ගස පසුව දළදා සපුව ලෙස ප්‍රසිද්ධ වී ඇත්තේ මේ නිසා ය.

මෙහි දී දෙමහල් විහාරයේ උළු ඉවත් කර දැව කොටස් හා දිරා ඇති රීප්ප කොටස් ද ඉවත් කරන ලදී. දිරා තිබූ කොට්කාවත කොටස ද ගලවා ඉවත් කෙරුණි. පසුව විශේෂ පංතියේ දැව යොදා වහලය සකසා පෙති උළු සෙවිලි කර දැව ආරක්ෂක ආලේප කරන ලදී. ඉදිරිපස කුඩා පියස්සේ දිරා තිබූ රීප්ප හා පරාල ඉවත් කර අළුත් උළු සෙවිලි කර සැකසීම සිදු කෙරුණි. පියස්සෙන් වැටෙන ජලය හේතුවෙන් පියස්සේ ආධාරක දැව කණු තෙමීමට ලක් වෙමින් පැවතීම හේතුවෙන් පියස්සේ අගුව අඟල් 6ක් දිගු කර සකසන ලදී. ඉහත කාර්යයට අමතරව අටුවේ දිරා ඇති පියගැටපෙළ ද සකස් කෙරිණ.

**මහනුවර දිස්ත්‍රික්කය**

**මහනුවර විෂ්ණු දේවාලයේ මුළුතැන්ගේ වහල නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර මහා විෂ්ණු දේවාලය පිහිටා ඇත. මහනුවර රැජින වීදියේ නැගෙනහිර කෙළවරින් ආණ්ඩුකාර කාර්යාලයට යන මාර්ගයේ මීටර් 500ක් පමණ ගිය විට මෙම ස්ථානයට ලඟා විය හැකි ය.

වර්ෂාවෙන් අධික ලෙස හානියට පත්වන මුළුතැන් ගේ වහල පිළිසකර කර ස්මාරකය ආරක්‍ෂා කර ගැනීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය.

සතරකොරළයේ දැඩිමුණ්ඩ දේවාලය අසල මාර්ගයෙන් පෘතුගීසීන් යුධ කටයුතු මෙහෙයවීමෙන් දැඩිමුණ්ඩ දේවාලයට ආපදාවක් වේ යැයි සිතා (ක්‍රි.ව. 1604-1636) සෙනරත් රජු විසින් මහනුවර දළදා මාලිගාව සමීපයේ විෂ්ණු දේවාලය ඉදි කළ බව කියවේ.

මුළුතැන්ගේ අධික ලෙස හානියට පත් වහලයේ පල තුනක උළු ඉවත් කර දිරාපත් වූ රීප්ප සහ සිවිලිම සඳහා අලුතින් දැව යොදා ගනිමින් වහලය සකස් කිරීම, (ආරක්ෂිත තාර ෂීට් ආවරණය යොදා) බිඳුනු හා විතැන් වූ උළු යොදා වහල සෙවිලි කිරීම ආදි නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

මුළුතැන්ගේ නොතෙමෙන ආකාරයෙන් නඩත්තු කාර්ය නිමා කරන ලදී. සමස්ත දේවාල සංකීර්ණයේ වහල සංරක්‍ෂණය කළ යුතු බව පෙනේ. සංරක්‍ෂණ පියවර ගැනීමට යෝජනා කරමි.

**මහනුවර විෂ්ණු දේවාලයේ වහල නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවටකොරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම දේවාල භූමිය පිහිටා ඇත. මහනුවර රැජිණ වීදියේ දළදා මාලිගාව දෙසින් ආණ්ඩුකාර කාර්යාලයට යන මාර්ගයේ පිහිටා ඇත.

වහලයේ විතැන් වු උළු සකස්කිරිම මගින් ගොඩනැගිල්ල තුළට වැසි ජලය ගලා ඒම වැලැක්වෙන ලෙස නඩත්තු කටයුතු සිදු කර පිළිසකර කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය.

විෂ්ණු දේවාලයේ වහලයේ උළු රිලවුන් විසින් උළු ගලවා දැම්ම නිසා විතැන් වු උළු හා කැඩුණු උළු වෙනුවට අලුතින් උළු යොදා වහළ සැකසීම ආදී නඩත්තු කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී.

**මහනුවර ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මධ්‍යම පළාත් කාර්යාලයෙහි වහලයේ දිරා ගිය දැව හා සිවිලිම් කොටස් නැවත යෙදීම, ජල නල උපාංග සහිත නාන කාමරයක් කාර්යාල පරිශ්‍රය තුළ අලුතින් ඉදි කිරීම, කාර්යාලය පිටුපස කොරිඩෝව පුළුල් කර ආහාරපාන ලබා ගැනීමට සුදුසු ස්ථානයක් ස්ථාපිත කිරීම ආදිය මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී.

**මැදවල රජමහා විහාරයේ වාහල්කඩ නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම රාජමහ විහාරය පිහිටා ඇත. මහනුවර සිට කටුගස්තොට හරහා රණවන මැදවල මාර්ගයේ කි.මී 12 ක් පමණ ගොස් වලතැන්න අතුරු මාර්ගයේ මීටර් 500 ක් ගිය තැන මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

පැරණි වාහල්කඩ හි දිරාගිය දැව ඉවත්කර අලුත්වැඩියා කර ගෘහයේ පැවැත්ම වෙනුවෙන් කටයුතු කිරිම මෙහි අරමුණ විය.

මැදවල රජමහා විහාරය ටැම්පිට විහාරයක් වශයෙන් ප්‍රචලිත වන අතර පොහොය ගෙය, වාහල්කඩ, ශිලා ලිපි ඒ අතර වැදගත්කමක් ඇති ස්මාරක වේ. මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් කලාව, සිතුවම්, මූර්ති කලාව මෙමඟින් පිළිඹිබු කරයි.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම විහාරස්ථානයේ වහලය දිරා පත්ව ඇති රීප්ප, පරාල, උළු ඇතුළු දිරා පත් වූ ද්‍රව්‍ය ඉවත් කර ඒ වෙනුවට විශේෂ පංතියේ දැව යොදා ගනු ලැබිණ. අනතුරුව පෙති උළු යොදා 1:2:4 සිංහුංවැ බදාම මිශ්‍රණයෙන් කුමේර බැඳ වහල සකස් කර ගනු ලැබිණ. වාහල්කඩ ගෘහයේ පලුදු වී සුළු හානි පැවති බිත්ති හුණු බදාමයෙන් කපරාරු කර සුද තියන ලදී. විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය, පොහොය ගෙය සංරක්ෂණය කළ යුතු තත්වයේ පවතී

**කැටපිටිය පුරාණ විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැටපිටිය නම් ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර කොළඹ මාර්ගයේ පිළිමතලාව ඔර්ලෝසු කණුව අසළින් වම් පසට ඇති පොත්තපිටිය මාර්ගයේ ගමන් ගත් විට මෙම විහාරය හමු වේ.

මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති සහිත දෙමහල් ටැම්පිට විහාරය නඩත්තු කර පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත ය.

මෙම විහාරස්ථානය මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති සහිත දෙමහල් ටැම්පිට විහාරයකි. විහාරයේ වහල හානිව පැවති උළු ඉවත් කර අලුතින් රට උළු 100 යොදා සෙවිලි කරන ලදී. දිරා ගොස් පැවති බිත්ති යට ලී හා කොටිකාවත ඉවත් කර අලුතින් යට ලී හා කොටිකාවත යොදන ලදී.

**කඩුගන්නාව ධර්මසර විහාරයේ ආවාසගේ නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත්ගම ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර කොළඹ මාර්ගයේ කඩුගන්නාව නගරයට ආසන්නව කඩවත්ගම ග්‍රාම සේවා වසමේ මෙම ස්මාරකය පිහිටා ඇත.

වහලයේ දිරාපත්ව ඇති දැව ඉවත් කර සංරක්ෂණය කර පවත්වාගෙන යන තෙක් නඩත්තු කර පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය.

මෙම විහාරයේ මහනුවර යුගයේ සිතුවම් හා මූර්තිවලින් සමන්විත ය. පැහැදිලි ඓතිහාසික විස්තරයක් නොමැති වුවත් මෙම සිතුවම් මූර්තිවලින් පෙනෙනුයේ මෙකී විහාරය හා ගොඩනැගිලි මහනුවර යුගයේ ඉදි කරන ලද්දක් බවය. මෙම ආවාසගේ ගොඩනැගිල්ල විහාරගෙයක් සහ බණ මඩුවක් වශයෙන් භාවිත කර ඇත.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අපිළිවෙලට තිබූ සිංහල උළු ක්‍රමවත්ව සකස් කර වහලයේ කුණු රොඩු ඉවත් කර පී අයි තහඩු 20ක් ආවරණය කොට වර්ෂා ජලය කාන්දු වීම වළක්වන ලදී.

**නාගවිමාන විහාරයේ බුදු මැඳුරේ වහළ නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර නගරයේ රජපිහිල්ල මාවතේ නාගවිමාන විහාරය පිහිටා ඇත. මහනුවර රජපිහිල්ල මාවතේ ගමන් කර මහනුවර නැරඹුම් ස්ථානය අසළින් ඉහළට මීටර් 200 ක් පමණ ගමන් කළ විට මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

විහාරස්ථානයේ බෝධීන්වහන්සේ ගේ කොටසක් විහාරයේ බුදු මැදුර මතට කඩා වැටී හානි වී තිබූ හෙයින් එහි වහල සැකසීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙය මහනුවර රාජ්‍ය සමයට අයත් පිළිම ගෙයක් වන අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මෙම විහාරයට බොහෝ අනුග්‍රහ දක්වා ඇති බවට තොරතුරු වාර්තා වී ඇත. මල්වතු මහා විහාරය ආසන්නයේ පවතින එම පාර්ශ්වයේ ම විහාරස්ථානයක් ලෙස මෙම විහාරය හඳුන්වා දිය හැකි ය.

පිළිමගෙයි වහල මතට කඩා වැටුණු බෝධි වෘක්ෂයේ කොටසක් හේතුවෙන් කැඩිගිය වහලය යථා පරිදි නඩත්තු කිරීම සිදු කරන ලදී. විහාර ගෙයට ඉහලින් පවතින නා ගස සහ බෝ ගස විහාරය දෙසට කඩා වැටීමට ඉඩකඩ ඇති බැවින් කම්බි යොදා ගැට ගැසීම හා ගස් බර අඩු කිරීම සඳහා කොටස් ඉවත් කිරීම ආදිය සිදු කිරීමට යෝජනා කරමි.

නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් සපයන ලද අතර ශ්‍රමය පමණක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

**ඇම්බැක්ක දේවාලයේ සිංහාසන ගෙය නඩත්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇම්බැක්ක ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. පේරාදෙණිය නගරයේ සිට දවුලගල මාර්ගයේ කි. මී. 10ක් පමණ ගිය තැන හමුවන බූවැලිකඩ හන්දියෙන් දකුණට ඇති ඇම්බැක්ක පිළිමතලාව මාර්ගයේ කි. මී. 1ක් පමණ යා යුතු වේ.

ස්මාරකය අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ගම්පොළ iii වන වික්‍රමබාහු (ක්‍රි. ව. 1357-1374) රජ දවස ඉදි කළ මෙම දෙවොල කතරගම දෙවියන් උදෙසා පුද කරන ලද්දකි. ඉහත රජු ගේ බිසව වූ හෙනකඳ බිසෝබණ්ඩාරට අයත් මල් උයනෙහි මෙම දෙවොල පිහිටා ඇති බව විශ්වාස කෙරේ. මෙහි ඇති ස්මාරක අතුරින් මහා දේවාලය, වාහල්කඩ, සඳුන්කුඩම, වී අටුව, මුරුතැන්ගෙය මෙහි ඇති පෞරාණික ගොඩනැගිලි වේ. සුවිශේෂී කැටයම් සහ මඩොල් කුරුපාව මෙකී ස්ථානය ලෝ සුපතල වීමට ද හේතුවක් වී ඇත. එසේ ම පැරණි රජ දවස පටන් සිදු කරනු ලබන චාරිත්‍ර අතර පෙරහැර මංගල්‍ය කටයුතුවල දී ගෙන යනු ලබන දේවාභරණ මඳ වේලාවක් සිංහාසනයේ තැන්පත් කොට චාරිත්‍ර ඉටු කරනු ලබයි.

සිංහාසන ගොඩනැගිල්ලේ ඇතා ගැටීමෙන් පසු කැඩී බිඳී ගිය සුන්බුන් කොටස් පළමුව ඉවත් කරන ලදී. ඉන් අනතුරුව දැව සියල්ල යතු ගා අවශ්‍ය පරිදි සකස් කර දැව ආරක්ෂක ආලේප කරන ලදී. අත්තිවාරම් සකස් කිරීම පසුව ආරම්භ කෙරිණ. මෙහි දී ගොඩනැගිල්ලේ අත්තිවාරම දුර්වල මට්ටමක පැවති බව අනාවරණ වූයෙන් සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම)ගේ උපදෙස් පරිදි අත්තිවාරම හාරා පතුලට අඟල් 6 ඝණකමට 1 : 2 : 3 අනුපාතයට සි : වැ : මැ මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් තට්ටුවක් යොදන ලදී. අනතුරුව අත්තිවාරම ගලින් පුරවා ලූ අතර ඉංජිනේරු ගඩොල් යොදා ගනිමින් ගොඩනැගිල්ලේ බිත්ති සහ ගඩොල් කුළුණු 6ක් ගොඩනැගීම ආරම්භ කෙරිණි. ගොඩනැගිල්ලේ වහලය සැකසීමේ දී බාල්ක, පරාල සහ රීප්ප යොදා මාලිගා උළු සෙවිලි කරන ලදී. මෙම ගොඩනැගිල්ලේ පැරණි කොටසෙහි උතුරු අන්තයෙහි වහලයේ අගු කොටස සඳහා අළුතින් පරාල යොදා, මාලිගා උළු සෙවිලි කර, කුමේර යොදා වහලය සම්පූර්ණ කරන ලදී. අවසානයේ ගොඩනැගිල්ලේ බිත්ති, කුළුණු කපරාරු කර සුදු හුණු පිරියම් කර වට පිල කුස්තුර පිරවීම සිදු කරන ලදී. මෙම කාර්යන් සඳහා ඇස්තමේන්තුගත ද්‍රව්‍ය දේවාලයේ බස්නායක නිලමේ විසින් සපයා දෙන ලද අතර වහලය සෙවිලි කිරීමට අවශ්‍ය වූ උළු කලාප ගබඩාවෙන් සපයා ලන්නා ලදී.

පෙරහැර සමයේ දී දේවාභරණ තැන්පත් කිරීම සිදු කෙරෙන සිංහාසන ගොඩනැගිල්ල අනපේක්ෂිත අයුරින් කැඩීයාම හේතුවෙන් පෙරහැර කටයුතු ආරම්භ වීමට පෙර යථාවත් කිරීම අවශ්‍යව පැවතිණ. ඒ අනුව කැඩී ගිය කොටස් මෙන් ම දිරාපත් ව පැවති කොටස් සකස් කිරිමට හැකියාව ලැබුණි.

**ගඩලාදෙනිය රජමහා විහාරයේ මළුවේ ගල් ඇතිරීම**

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඩලාදෙනියේ මෙම රජමහා විහාරය පිහිටා ඇත. මහනුවර සිට පිළිමතලාව නගරයෙන් දවුලගල මාර්ගයේ කි.මී 1 ක් පමණ ගමන් කළ විට මේ විහාරය දැකිය හැකි ය.

ගඩලාදෙනිය විහාර භූමිය දෙස් විදෙස් සංචාරකයන් සඳහා ආකර්ශනීය ස්ථානයක් බවට පත් කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ විය.

ධම්මකිත්ති සීලවංශ හිමි විසින් ගඩලාදෙනිය ගල් තලාව මත විහාරය සහිත දේවාලය ගොඩනැගූ බව ගඩලාදෙණිය ශිලාලිපියේ සඳහන් වේ. ගම්පොළ යුගයේ 4 වන බුවනෙකබා රාජ්‍ය කාලයට අයත් වන මෙම විහාරයේ වාස්තුවිද්‍යාඥයා වන්නේ ගණාධිපති ගනේශ්වරචාරී නැමත්තා බව සඳහන් වේ. දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාසය ලබමින් ගඩලාදෙණිය විහාරයේ ප්‍රධාන විහාර සහ දේවාල ගොඩනැගිල්ල ඉදි වී ඇත. ප්‍රධාන ඉදිකිරීම් මාධ්‍ය ලෙස කලුගල් යොදාගෙන ඇත. මෙහි තනි ගලින් නිර්මාණය වී තිබෙන ත්‍රිත්ව කුලුණ කලාකරුවා ගේ නිපුණත්වය විදහාපායි.

ගඩලාදෙනි විහාර මළුවේ අක්‍රමවත් ස්ථාන පැවති ස්වරූපය අනුව මේ ස්ථාන සඳහා ගල් ඇතිරීමේ ක්‍රමවේදය ද වෙනස් විය. විහාර මළුවේ විජයෝත්පාය ඉදිරිපස භූමිය සහ විෂ්ණු දේවාලය පිටුපස වැට ආසන්නයට වන්නට ඇති බිම් කොටස් දෙක සඳහා අඩි 1X1 කළු ගල් ඇතිරීම සිදු කරනු ලැබීය. මෙසේ කරන ලද්දේ එම ස්ථානවල භූමිය සමතලා ස්වරූපයෙන් පැවති බැවිනි. විහාර මළුවේ භූමිය සමතලා අයුරින් නො පැවති ස්ථාන සඳහා සක්ක ගල් යොදා ගනිමින් භූමිය සැකසීම සිදු විය. මෙහි දී එම ස්ථානවල භූමියේ ස්වරූපය අනුව ජල බැස්ම ද හොඳින් සිදු වන ආකාරයට කළු ගල් ඇතිරීම සිදු කිරීමට පියවර ගන්නා ලදී. මෙසේ සක්ක ගල් ඇතිරීම සිදු කළ ස්ථාන ලෙස බෝධිය අසල භූමි ප්‍රදේශය සහ විෂ්ණු දේවාලය පිටුපස භූමි ප්‍රදේශය හඳුන්වා දිය හැකි ය. විජයෝත්පාය අසළ භූමියේ ජලය හොඳින් බැස යන අයුරින් කාණු පද්ධතිය සකස් කිරීම ද සිදු විය.

**කලාප අංක 5 පවත්වාගෙන යාම**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය, අකුරණ, පාතදුම්බර, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව මෙම කලාපය පිහිටා ඇත. අනගාරික ධර්මපාල මාවතේ අංක 17 දරණ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ මෙම ස්ථානය පිහිටා ඇත.

කලාපයේ පුරාවිද්‍යා ස්ථාන වසර පුරා නඩත්තු කර පවත්වාගෙන යාම මේ යටතේ සිදු කිරීම අපේක්ෂාව විය.

මෙම කලාපය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4 ඇතුළත පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති වසර 100 ඉක්ම වු රජමහා විහාර, දේවාල, අම්බලම්, ශිලාලිපි, ඇතුලු ස්මාරක හා පුරාවස්තු ගණනාවක් පිහිටා ඇත.

අකුරණ සමන් දේවාලයේ වටා ඉදිකර ඇති බැම්ම ඇතැම් ස්ථානවලින් සක්ක ගල් ගැල වී තිබීම, බදාම කුස්තුර ගැල වී තිබීම, නොයෙකුත් ශාක තිබීම හේතුවෙන් එහි නඩත්තු කටයුතු සිදුකෙරිණ. එමෙන් ම අනුරාගල රාජමහ විහාරයේ ද නඩත්තු කටයුතු සිදු කළ අතර එහි දී දිරාගිය රීප්ප, පරාල ඉවත්කර විශේෂ පංතියේ (කොස්) දැව යොදා කොටස් සකස් කරනු ලැබීය. එමෙන් ම වහලය ක්‍රමවත් බවින් තොරව පැවතීම හේතුවෙන් කැඩී ඇති උළු ඉවත්කර නව උළු යොදා සකසා කුමේර සැකසීම සිදුකරනු ලැබීය.

ව්‍යාපෘතියට අදාළ ව පැවති නඩත්තු කටයුතු සිදු කිරිමත් කලාපයේ පුරාවිද්‍යා ස්ථාන පරික්ෂා කිරිමත්, අවශ්‍ය ඉදිරි කටයුතු වෙනුවෙන් වාර්තා සැපයිමත් සිදු කරනු ලැබීය.

**මහනුවර කලාප අංක 6 පවත්වාගෙන යාම**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෙම කලාප අංක 6 ට අයත් පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

මධ්‍යම පළාත් කාර්යාලය හා කලාප කාර්යාල පරිශ්‍රය පවත්වාගෙන, දෛනික පවිත්‍රතා සහ සනීපාරක්‍ෂක පිරිසිදු කිරීම්, කාර්යාල ජල නල පද්ධතිය හා විදුලි පද්ධතියේ අලුත්වැඩියා කටයුතු, රජ පිහිල්ල ස්ථානය ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම, මුර සේවා කටයුතු පවත්වාගෙන යාම ආදී නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

**කලාප අංක 7 පවත්වා ගෙනයාම**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර, උඩපළාත, දොලුව, පස්බාගේ, ගඟඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි මෙම කලාපය පිහිටා ඇත. මහනුවර සිට වටදෙණිය මාර්ගයේ බූවැලිකඩ නගරයෙන් කි.මී. 1 ක් පොල්වත්තතැන්න මාර්ගයෙන් ගමන් කිරීමේ දී මේ කලාපය හමු වේ.

පුරාවිද්‍යා ස්ථාන ආකර්ශනීය මට්ටමින් පවත්වාගෙනයාම සහ ආරක්ෂා කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. කලාපය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 තුළ ජාතික මට්ටමින් වැදගත්කමක් ඇති ගඩලාදෙණිය, ලංකාතිලක, ඇම්බැක්ක වැනි පුරාවිද්‍යා ස්ථාන ද වසර 100 ඉක්ම වූ රජමහා විහාර, පුරාණ විහාර, දේවාල, අම්බලම් වැනි ස්ථාන ද පිහිටා ඇත.

වේගිරිය සිංහාසන ගෙයි වහලයේ ක්‍රමවත්භාවයෙන් තොරව පැවති උළු ක්‍රමවත් කර නව උළු යෙදීම, වහළයේ සිව්කොනේ ගැල වී පැවති කුමේර උළු සකසා අලුත් උළු යොදා සැකසීම සිදුකරන ලදී. එසේම ඇම්බැක්ක ගල් අම්බලමේ වට බැම්මේ ගල් ගැල වී පැවති අතර ගල් කණු පැවති බිමේ වළවල් සෑදී අපිළිවෙලට පත් වී තිබිණ. මෙහිදි බැම්මේ වට ගල් ක්‍රමවත් ව සකසා කුස්තුර පොයින්ට් කිරිම සිදුවිය. අම්බලමේ පඩිපෙළ සැකසීම ද සිදුකරන ලදි. බැම්මේ වැඩ අවසන් වූ පසු වැලි ඇතිරීමේ කාර්යය සිදුකරන ලදී. වේගිරිය අම්බලමේ වහලයේ අගුවක වාහනයක් වැදීම නිසා මුලප්පරාලයක් කැඩී ගොස් තිබිණ. එය සකසා රීප්ප ගසා උළු සෙවිලි කරන ලදී. පසුව කුමේර බැඳ සකසන ලදී. දස්කර ගල්කොණ අම්බලමේ වහලයේ කැඩි පැවැති

උළු වෙනුවට අලුතින් උළු යෙදීම සිදුවිය. එමෙන් ම බොහෝ සෙයින් විනාශ ව පැවැති කුමේර සැකසීම ද සිදුවිය.

කලාපය තුළ පුරාවිද්‍යා ස්ථාන වසර පුරා නඩත්තු කර පවත්වාගෙනයාම තුළින් දෙස් විදෙස් සංචාරකයන්ට ආකර්ශනීය තත්වයක් ඇතිකරලීමට හැකිවිය.

**කලාප අංක 8 පවත්වාගෙන යාම**

මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර, හතරලියද්ද, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කෙරෙන පරිදි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

2016 වසර පුරා කලාපය තුළ ඇති සියලු ම ස්මාරක නඩත්තු කර පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු කෙරිණි.

දොඩම්වල නාථ දේවාලයේ මුළුතැන්ගේ වහල සකස් කිරීම, කුමේර යෙදීම හා රිට්ටාගේ වහල තලාඳ යෙදීම සහ දේදුනුපිටිය කලෝටුවාව පුරාණ විහාරයේ සංඝාවාසයේ වහල සකස් කිරීම ආදී නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

දොඩම්වල නාථ දේවාලයේ මුළුතැන්ගේ වහල සහ රිට්ටාගේ වහල නඩත්තු කර 2016 වසර පෙරහැර සමය ආරම්භ වීමට පෙර ලබා දෙන ලදී. වර්ෂා ජලය කාන්දු වීම වැළැක්වීම සඳහා කුමේර යොදා ස්මාරක දෙකම නඩත්තු කරන ලදී.

**කලාප අංක 9 පවත්වාගෙන යාම**

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලය, මැදදුම්බර, පන්විල, මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි උඩමළුව පුරාවිද්‍යා කලාප කාර්යාලය පිහිටා ඇත. මහනුවර මහියංගන මාර්ගයේ වරාපිටිය හංදියේ සිට දකුණට හමුවන උඩමළුව ගම දෙසට විහිදෙන මාර්ගයේ කි.මී 1 ක් පමණ ගියවිට මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

කලාප අංක 9 පවත්වාගෙන යමින් කලාපයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 තුළ පවතින පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර මතු පරපුර වෙනුවෙන් රැක ගැනීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය.

අනුරාධපුර මුල් යුගයට හිමිකම් කියන පුරාවිද්‍යා වටිනාකම් සහිත ස්ථාන සහ සිංහලයේ අවසන් රාජධානියේ අවසන් කාලය සනිටුහන් කරන ශ්‍රී වික්‍රම රාජසිංහ ස්මාරකය මෙම කලාපය තුළ පවතින ඓතිහාසික ස්මාරක වේ.

පුරාවිද්‍යා රක්ෂිතයේ ගැටලු සහිත මායිම් සඳහා මායිම් කණු යොදා එම කොටසේ භූමිය නිරවුල් කිරීම, කලාප කාර්යාලය ඉදිරිපිට දැව ගරාදි වැට අලුත්වැඩියා කර වාර්නිශ් ආලේප කිරීම, කලාප කාර්යාලය අසළ දිරාගිය තහඩු සෙවිලි කළ ගොඩනැගිල්ල රැළි තහඩු යොදා නඩත්තු කිරීම,

කලාප කාර්යාලය අවට පරිශ්‍රය යටි කැළය කපා පිරිසිදු කිරීම, කලාපය තුළ පුරාවිද්‍යා ස්ථාන පරීක්ෂා කර වාර්තා කිරීම, ගල් බිඳුම් ස්ථාන පරීක්ෂා කිරිම, අනවසර කැණීම් කළ ස්ථාන පරීක්ෂා කර වාර්තා කිරීම, දීමනා රැකවල්කරුවන් පත්කර ඇති ස්ථාන පරීක්ෂා කිරීම, බෝමුරේ පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම ආදී නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

කලාප කාර්යාලය පිහිටි අක්කර 8 පුරාවිද්‍යා රක්ෂිතයේ ඇතැම් ස්ථාන අනවසර පදිංචිකරුවන් විසින් ඉතා දිගු කලක සිට අත්පත් කරගෙන තිබෙන අතර ඒවා නිරවුල් කර ගැනීම සුදුසු බවට යෝජනා කරමි. මායිම් කණු යෙදීම ද සුදුසු ය.

**කලාප අංක 10 පවත්වාගෙන යාම**

මහනුවර දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත, වලපනේ, දෙල්තොට, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ව මෙම පුරාවිද්‍යා කලාප කාර්යාලය පිහිටා ඇත.

කලාප අංක 10 හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන මැනවින් පවත්වාගෙව යාම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

පූර්ව ඓතිහාසික යුගයට අයත් කටාරම් කොටා සකස් කළ ලෙන් 18 ක් කලාපය තුළ දක්නට ඇති අතර අනුරාධපුර යුගයට අයත් නටබුන් ස්ථාන 10 ක් හා අනුරාපුර, පොළොන්නරු යුග නියෝජනය කරන ශිලාලිපි සහිත ස්ථාන 8 ක් ද මහනුවර යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ සහිත අම්බලම් 20 ක් පමණ ද දේවාල ගොඩනැගිලි 12 ක්, ධර්මශාලා ගොඩනැගිලි 16 ක්, ප්‍රතිමා ගෘහ 13 ක්, බෝධි ප්‍රාකාර 8 ක්, ආවාසගෘහ 6 ක් ආදී වශයෙන් පුරාවිද්‍යාත්මක ස්ථාන රාශියක් සහිත පුරාවිද්‍යා කලාපයකි.

කලාපයේ හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව සඳහා යොදවා ඇති දීමනා රැකවල්කරුවන්ගේ දෛනික කටයුතු අධීක්ෂණය හා ඔවුන් ගේ දීමනාවන් ගෙවීම, හඟුරන්කෙත විශේෂ කලාපයේ යාර 400 තුළ ඉදිකිරීම් හා පදිංචිකරුවන් ගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම, කිතුල්පේ රන්පත්ගේ විහාරයේ වහලයේ සුළු නඩත්තු කටයුතු කිරීම කිතුල්පේ රන්පත්ගේ විහාරයේ පොහොය ගෙයි වහලයේ සුළු නඩත්තු කටයුතු සිදු කිරීම, අරත්තන විහාරයේ වහලේ සහ පොහොයගේ සුළු නඩත්තු කටයුතු සිදු කිරීම, කිතුල්පේ රන්පත්ගේ විහාරයේ හදිසි මැදිහත්වීම, පාසැල් පුරාවිද්‍යා වැඩසටහන් හා ප්‍රදර්ශන සංවිධානය කිරීම, ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය ලබාගෙන දියතිලකපුර උරුමය අත්පත්‍රිකාවක් මුද්‍රණය කිරීම ආදී කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

කලාප අංක 10 පවත්වාගෙන යාම ව්‍යාපෘතිය යටතේ මෙම ව්‍යාපෘති සඳහා අනුමත මුදල ප්‍රමාණවත් නොවීම හා හදිසි මැදිහත්වීම් සඳහා මුදලක් නො තිබීම ගැටලුවකි.

**මාතලේ දිස්ත්‍රික්කය**

**සීගිරිය නිවස අලුත්වැඩියාව**

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීගිරිය නිළ නිවස පිහිටා ඇත. ඉනාමළුව හංදියේ සිට සීගිරිය මාර්ගයේ කි.මී 8 ක් ගියවිට මෙම ස්ථානයට ලගාවිය හැකි ය.

නිවහන මැනවින් හා විධිමත්ව පවත්වාගෙන යාම (නිල නිවස අලුත්වැඩියාව) මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ.

නව මුළුතැන්ගේ කාමරය, නාන කාමරය ඉදිකිරීම, වහළ සැකසීම, ජලය සැපයීම, විදුලිය සැපයීම හා පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියාව ආදිය මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී.

කළාප නිලධාරිට හා පිටතින් පැමිණෙන නිලධාරින්ට නවාතැන් පහසුකම් සැපයීම මේ යටතේ යෝජනා කරමි.

**සීගිරිය ක්ෂේත්‍ර නිරීක්ෂණ නිවහන අලුත්වැඩියාව**

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීගිරිය කලාප කාර්යාලය අසළ මෙම ක්ෂේත්‍ර නිවාසය පිහිටා ඇත. ඉනාමළුව හංදියේ සිට සීගිරිය මාර්ගයේ කි.මී 8 ක් ගමන් කළවිට මෙම ස්ථානයට ලගාවිය හැකි ය.

නිවහන මැනවින් හා විධිමත් ව පවත්වාගෙන යාම මෙම ව්‍යෘපෘතියේ අරමුණ වේ. ඒ අනුව, මෙම නිවහන අලුත්වැඩියාව, පොල් අතු සෙවිලි කිරීම, හුණු ආලේප කිරීම ආදිය සිදු කර නඩත්තු කටයුතු කරන ලදී.

**පල්ලේපොල ශ්‍රී වේළුවනාරාමයේ අටුවේ වහල අලුත්වැඩියාව**

මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේපොල ශ්‍රී වේළුවනාරාමය විහාරස්ථානය පිහිටා ඇත. මාතලේ ගලේවෙල මාර්ගයේ පල්ලේපොල නගරයෙන් මාදිපොල මාර්ගයේ මීටර් 200ක් පමණ ගමන් කළ විට මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය.

කැඩී පැවති වහල කොටස අලුත්වැඩියා කරමින් අටුවේ වරිච්චි බිත්ති හා දැවමය ගෙබිම තෙමීම වළක්වාලීමත් ඉන් අටුව තවත් වසර කීපයක් ඉදිරියට පවත්වාගෙන යාමත් මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

ක්‍රි.ව. 1812 දී මොණරවිල කැප්පෙටිපොල මහ දිසාව විසින් මෙම විහාරස්ථානය කරවා ඇත. මෙහි ඇති පැරණි පිළිමගෙය එම යුගයටම අයත් වේ. පිළිමගෙය ආසන්නයේම පවතින ටැම්පිට සැකසූ වරිච්චි බිත්ති සහිත අටුව එම යුගයේ ම තවත් එක් නිර්මාණයක් ලෙස පෙන්වා දිය හැකි ය.

අඩ 41x10 ප්‍රමාණයෙන් යුත් පල දෙකේ වහලින් සමන්විත අටුවේ පසු පස වහලයේ අඩි 20ක් පමණ රීප්ප දිරා කැඩී පැවතීම නිසා සිංහල උළු බිමට වැටී කැඩී පැවතිණ. එමෙන් ම කැඩුණු රීප්ප අතරින් උළු කැට පහලට එල්ලී පැවතුණි. එනිසා ප්‍රථමයෙන් ම කැඩුණු රීප්ප පැවති වපසරිය

තුළ වූ සිංහල උළු බිමට බෑම සිදු විය. දෙවනුව දැවමය සැකිල්ලේ පොල් රීප්ප ගලවා ඉවත් කරන ලදී. තෙවනුව සැකිල්ල ඇද හැරීම සිදු කරන ලදී. ඉන් පසු පොල් රීප්ප වෙනුවට කොස් රීප්ප ගසා සිංහල උළු සෙවිලි කර කුමේර යෙදීම සිදු කෙරිණි. කාර්ය අවසානයේ අටුව වටා පැවති සියලු ම අපද්‍රව්‍ය ඉවත් කිරීමත් අටුව යට ගොඩ ගැසී පැවති රට උළු, පොල් ලෙලි, දැව ආදී සියල්ල ඉවත් කර පිරිසිදු කිරීමත් සිදු කරන ලදී.

මෙහි දී පූර්ව සිදු කළ සංරක්ෂණයේ දී දැවමය රාමුවට පොල් රීප්ප ගසා ඇති බැවින් වර්තමානය වන විට ඒ සියල්ල දිරා පැවතීම, අටුවේ ගෙබිම දැව ලෑලි ද දිරා යමින් පැවතීම, අටුවේ ඉදිරිපස බිත්තියේ ඇඳ පැවති සිතුවම් මේ වන විට මැකී යමින් පැවතීම, විහාරවාසී ස්වාමීන් වහන්සේ ගේ අවධානයෙන් තොරව පැවතීම නිසා එය අපවිත්‍රව පැවතීම යනාදී කරුණු නිරීක්ෂණය විය.

ඒ අනුව අටුවේ වහල සම්පූර්ණයෙන් ම අලුත්වැඩියා කිරීම වේ නාශක යෙදීම හා සිතුවම් සංරක්ෂණය යනාදිය සිදු කිරීමට යෝජනා කරමි.

**ඇහැලේපොළ කුමාරිහාමි ස්මාරකයේ ඉදිකිරීම්**

මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෙම විහාරස්ථානය පිහිටා ඇත. මාතලේ ගලේවල මාර්ගයේ පල්ලේපොළ නගරයෙන් ඇහැලේපොළ මාර්ගයේ කි.මී. 1 ක් ගමන් කිරිමෙන් මෙම ස්ථානයට පිවිසිය හැකි ය. ඇහැලේපොළ කුමාරිහාමි ස්මාරකයේ අලංකාර බව හා ආරක්ෂිත බව වැඩි දියුණු කිරිම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ඇහැලේපොළ කුමාරිහාමි විවාහයෙන් පසු කලක් ජීවත් වූ වලව්වේ නටබුන් මෙම ස්මාරකයට පසු පස භූමිය තුළ දක්නට හැකි ය. පිළිරුව සකස් කර ඇති කුඩා වැව එදා ඇහැලේපොළ පුරාණ විහාරයේ ටැම්පිට විහාරය හා සංඝාවාසය සැකසීමට මැටි කැපූ ස්ථානය බවට ජනප්‍රවාදගත පුවතක් ද ඇත.

ඇහැලේපොළ කුමාරිහාමිගේ ස්මාරකය සඳහා ප්‍රධාන මාර්ගයේ සිට පිවිසීමට යොදා තිබූ කොන්ක්‍රීට් තට්ටුව දෙපසට හෙවිඩියුටි යකඩ අත් වැටක් සවි කිරිම. පාළම ඉදිරිපසින් බැම් දෙකක් බැඳ ගේට්ටුවක් සවිකිරීම, කුමාරිහාමි ස්මාරකය ආසන්නයට කුඩා ගේට්ටුවක් හා යකඩ අත්වැටක් සවිකිරීම, විදුලි පද්ධතිය සකස් කර දීම, ස්ථානීය ස්මාරක විස්තර පුවරුවක් යෙදීම ආදී කටයුතු සිදු කෙරිණි.

**කලාප අංක 1 පවත්වාගෙන යාම**

මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීගිරිය පුරාවිද්‍යා කලාපය පිහිටා ඇත. දඹුල්ල සිට සීගිරිය මාර්ගයේ කි.මී. 19 ක් ගමන් කරනවිට ස්ථානයට ලඟාවිය හැකි ය.

සීගිරිය, පිදුරංගල, රාම කැලේ, කළුදියපොකුණ යන පුරාවිද්‍යා ස්ථාන මැනවින් නඩත්තු කර උද්‍යාන මට්ටමින් පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට නියමිත ය.

ඒ අනුව, චිත්‍ර ලෙන, කැටපත් පවුර, මුර රාජකාරි කලාපයට අයත් පුරාවිද්‍යා ස්ථාන කණකොල කපා පිරිසිදු කිරීම, ගෘහ උපකරණ අලුත්වැඩියාව ආදී නඩත්තු කටයුතු සිදු කරන ලදී.

**කලාප අංක 2 පවත්වාගෙන යාම**

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෙම දඹුල්ල සෝමාවතිය දාගැබ පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. කුරුණෑගල දඹුල්ල මාර්ගයේ දඹුල්ල නගරයට කි. මී. 1.5 ක් පමණ පූර්වයෙන් හමුවන වළගම්බා පිරිවෙන මාර්ගයෙන් කි.මී. 1 ක් ගමන් කළ විට මෙම ස්ථානයට පිවිසිය හැකි ය.

දඹුල්ල විශේෂ කලාපයට අයත් සෝමාවති දාගැබ පුරාවිද්‍යා ස්ථානය තුළ පවතින රජයේ ගොඩනැගිල්ල, උද්‍යාන භූමිය හා ස්මාරක නඩත්තු කර පවත්වාගෙයාම මේ යටතේ සිදු කිරීමට නියමිත ය. ක්‍රි.පූ. 2 වන සියවසයේ රජ කළ සද්ධාතිස්ස රජු ගේ අනුග්‍රයෙන් මෙම පූජා භූමිය ආරම්භ වී ඇත. ක්‍රි.පූ. 1 වන සියවස රජකමට පත් වූ වළගම්බා රජු ගේ දේවිය සිහිවීම සඳහා මෙම භූමියේ දාගැබ ඉදි කර එය සෝමාවතිය විහාරය ලෙස හඳුන්වා ඇතැයි ජනප්‍රවාදගත ය. එතුමිය ගේ සොහොන්කොත යැයි පවසන ඉදිකිරීමක් ද චෛත්‍ය මළුවේ පසෙකින් දැකගත හැකි ය. මෙලෙස විකාශනය වෙමින් ආ මෙම භූමිය ක්‍රි.ව. 6-8 සියවස් වන විට පබ්බතාරාම සංකීර්ණයක් බවට පරිවර්තනය වී ඇත. නමුත් මෙහි ඇති විශේෂත්වය නම් චෛත්‍යය, උපෝසථඝරය හා බෝධිඝරය යන අංග තුන පමණක් දැකිය හැකි වීමයි. විද්වතුන් පවසනුයේ පිළිමගෙය ලෙස මෙම භූමියට ඉහළින් දඹුළු ගලේ පවතින ලෙන් විහාරය භාවිත කළ බවයි. කෙසේ නමුත් මෙහි ආගමික කටයුතුවල නිරත වූ රහතන් වහන්සේලාගේ කුටි ලෙස මෙහි පවතින ලෙන් කුටි භාවිත කළ බවට අනුමාන කළ හැකි ය.

වසරේ මාස තුනකට වරක් උද්‍යාන භූමියේ යන්ත්‍ර භාවිතයෙන් තෘණ කපා ඉවත් කිරීම, දෛනිකව උද්‍යානය ඇමදීම, ස්මාරකයෙහි වල් පැලෑටි ගලවා ඉවත් කිරීම, කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව, කාර්යාල ගොඩනැගිල්ල ඇතුළත පැවති බිත්තිය පලුදු කර නැවත කපරාරු කර වර්ණ ගැන්වීම, ගෙබිම වර්ණ ගැන්වීම සිදු කරන ලදී. කුඩා කාමරය කපරාරු කර ඇති බිත්තිය සඳහා පොටි ගැල්වීම ද මේ යටතේ සිදු කළ නඩත්තු කාර්යයන් ය.

ඉහත දක්වන ලද කාර්යයන් සිදු කිරීමත් ස්ථානයට නො ගැලපෙන බිත්ති කපරාරුව කඩා ඉවත් කර යළි සකසා වර්ණ ගන්වා සුදුසු පරිදි සකස් කිරීම යෝජනා ලෙස ඉදිරිපත් කරමි.

**කලාප අංක 3 පවත්වාගෙන යාම**

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල, පල්ලේපොල, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

කලාප අංක 3ට අයත් ස්ථිර වැඩබිම් වන මැණික්දෙන, විහාරහින්න, ගැරඬිගල යන ස්ථානයන් හි උද්‍යාන හා ස්මාරක නඩත්තු කර ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ස්ථිර වැඩබිම් හි උද්‍යානවල යන්ත්‍ර භාවිතයෙන් තෘණ කැපීම, ස්මාරක හි වල් පැලෑටි නෙලීම, උදලුගෑම හා පැති කැපීම, දෛනිකව උද්‍යාන භූමි ඇමදීම ආදී නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

ඉහත කාර්යයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන තුළින් ද්‍රව්‍ය මිළ දී ගැනීමෙන් පසු ශේෂ වූ රු 10668.75ක මුදලින් කලාප අංක 2ට අයත් සෝමාවතිය දැගැබ පුරාවිද්‍යා ස්ථානයට පිවිසෙන ප්‍රධාන මාර්ගයට ගේට්ටු කුළුණු දෙකක් සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළ දී ගැනීමත් සිදු කරන ලදී.

**කලාප අංක 4 පවත්වාගෙන යාම**

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම, නාඋල, යටවත්ත, අඹන්ගඟ කෝරළේ, රත්තොට, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. මාතලේ දඹුල්ල  මාර්ගයේ කි.මී. 25ක් ගිය තැන නාලන්ද හන්දියෙන් හැරී කි.මී. 1ක් පමන ගිය පසු මෙම ස්ථානය හමු වේ.  කලාපය තුළ පිහිටි පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම, කැණීම් සංරක්ෂණ, නඩත්තු, ගවේෂණ, රසායන සංරක්ෂණ කටයුතුවලට සහභාගි වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මධ්‍යම 4 කලාපයට අයත් පුරාවිද්‍යා ස්ථාන 150ට ආසන්න ප්‍රමාණයක් ඇති අතර නාලන්ද ගෙඩිගේ, අලුවිහාරය ආදී ආරාම මෙන් ම මැක්ඩොවල් බලකොටුව, අම්බලම් හා වෙනත් පුරාවිද්‍යා නටබුන් මෙම කලාපයට අයත් ඓතිහාසික වටිනාකමින් යුක්ත ස්ථාන වේ.

කලාපය දර්ශනීය අන්දමින් පවත්වාගෙන යාම, ස්ථාන පරීක්ෂා කිරීම නාඋල අම්බලම සංරක්ෂණය, නාලන්ද ගෙඩිගේ රසායන සංරක්ෂණ කටයුතු, ආඳාවල පුරාණ විහාරයේ පිළිමගෙය වහල නඩත්තුව, අලුවිහාරය, සුළුනාපහුර යන ස්ථානයන්  හි නඩත්තු කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

මධ්‍යම 4 කලාපය තුළ පිහිටි පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම තුළින් මෙම කලාපයේ වැඩකටයුතු කාර්යක්ෂමව හා විධිමත් ව පවත්වාගෙන යා හැකි විය.

## නුවරඑළිය දිස්ත්‍රික්කය

**කලාප අංක 11 පවත්වාගෙන යාම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩදොර දෙහඳුකඩුල්ල පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. මහනුවර සිට ගම්පොළට ගොස්, ගම්පොළ-මාවෙල මාර්ගයේ කි.මී 10 ගිය පසු කඩදොර හංදියෙන් මීටර 20 ක් ගිය පසු මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

කලාපය තුළ පුරාවිද්‍යා ස්ථාන මනාලෙස පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

දෙහඳුකඩුල්ල, යතුරුගැසුලියද්ද, මල්හෑව දළදා කරඬු විහාරය, පුසුල්පිටිය රජමහ විහාරය, නියම්ගම්දොර, වටද්දර, මැතගම දිඹුල විහාරය ආදි පුරාවිද්‍යා ස්ථාන මෙම ප්‍රදේශයේ දක්නට

ලැබේ. එමෙන් ම මේ කලාපයේ දළදා වහන්සේ සඟවා තැබූ තැන්, දුටුගැමුණු කුමරු රුහුණෙන් පලාවිත් සැඟව සිටි කාලය පිළිබඳ ජනප්‍රවාදගත තොරතුරු සහිත භූමියකි.

දෙහඳුකඩුල්ල පුරාවිද්‍යා ස්ථානයේ පැල සිටුවීම, (විෂ්ණු ක්‍රාන්ති හා තණකොළ පැළ සිටුවීම) පුසුල්පිටිය රජමහා විහාරයේ දෙමහල් විහාරයේ ලෑලි තට්ටුවේ දැව ආරක්ෂණ ආලේප කිරිම ආදී නඩත්තු කාර්යයන් මේ යටතේ සිදු කරන ලදී.

**කිතුල්පෙ රන්පත් විහාරයේ හදිසි නඩත්තු කටයුතු**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කිතුල්පෙ රන්පත් විහාරය පිහිටා ඇත. මහනුවර සිට රිකිල්ලගස්කඩ නගරය දක්වා ගොස් හේවාහැට මාර්ගයේ කි.මී. 1 ක් ගිය පසු දකුණු පසට ඇති පල්ලේ බෝවල මාර්ගයේ කි.මී. 8 ක් ගිය පසු අදාළ ස්ථානයට ලඟාවිය හැකි ය.

විහාරයේ පැරණි ප්‍රතිමා ගෘහයට බෝ අත්තක් වැටීම හේතුවෙන් විනාශ වූ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට යථා තත්වයට පත් කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත ය. මහනුවර අවධියේ දළදාව තැන්පත් කර තිබූ ස්ථානයක් ලෙස සැළකෙන කිතුල්පෙ රන්පත් විහාරය මහනුවර යුගයේ සිතුවම් මූර්ති සහිත ප්‍රතිමා ගෘහයකි. මෙහි ඉහත යුගයට අයත් යැයි සැළකිය හැකි ගල් කුළුණු 7 ක් ද දක්නට ලැබේ.

විනාශයට පත් බෝධි ගෘහයේ බෝධි ශාඛාව කපා ඉවත් කිරීම හා සුන්බුන් ඉවත් කොට පිළිසකර කිරීම ආරම්භ කෙරිණි. අනතුරුව කුළුණු බැඳීම සිදු කර යට ලී, පරාල, රීප්ප, යතු ගා මූට්ටු, ගොනැස්, සුළු පේකඩ කැපීම සිදු කොට වහලය සැකසීම සිදු කෙරිණි. මෙහි දී භාවිතයට ගත හැකි දැව කොටස් යොදා ගැණුනු අතර අඩු දැව සඳහා විශේෂ පංතියේ දැව යොදා ගැණිනි. වහලය සැකසීමෙන් පසු පෙති උළු සෙවිලි කර කුමේර බැඳ වහලයේ වැඩ අවසන් කරන ලදී. බිත්ති කුළුණු කපරාරු කර පිළිම ගේ වට බිත්ති සුදු හුණු ආලේප කරන ලදී.

## දකුණු පලාත

### හම්බන්තොට දිස්ත්‍රික්කය

**දකුණ 05 කලාපය පවත්වාගෙන යාම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය, තංගල්ල, බෙලිඅත්ත, වලස්මුල්ල, ඕකේවෙල, කටුවන, අගුණකොලපැලැස්ස යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කෙරෙන පරිදි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ දකුණ 05 කලාපය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හත තුළ ඇති ස්මාරකයන්හි නඩත්තු කටයුතු පවත්වාගෙන යාමේ කටයුතු සඳහා ය.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ කසාගල පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රාකාර බැම්මෙන් ඇතුළත හා පිටත නටබුන් ප්‍රදේශ විසි ගසා සුද්ධ පවිත්‍ර කර පවත්වාගෙන යාම, වැසිකිලියේ අබලන් වී කැඩී

ගිය දොර ඉවත් කර දැවමය දොරක් සකස් කර සවි කිරීම, වැසිකිලිය, මුළුතැන්ගෙය හා නාන කාමරය යන ස්ථානවල ආරක්ෂාව සඳහා කොණ්ඩිපට්ටම් යොදා ඉබි යතුරු සවි කිරීම, පැරණි වී ඉරී ගිය ලිපි ගොනු ඉවත් කර ඒ සඳහා අලුතෙන් ලිපිගොනු අංක සහ මාතෘකා යොදා යාවත්කාලීන කර විධිමත්ව කලාප කාර්යාලය පවත්වා ගැනීම ආදිය සිදු කරන ලදී.

එසේ ම කටුවන කොටුව දෛනිකව විසි ගසා ශුද්ධ කර ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම, ස්ථිර මුර සේවය හා මුර ආවරණය නිසි පරිදි ක්‍රියාත්මක කරවීම, ක්ෂේත්‍ර නිවාසය පවත්වාගෙන යාම, කාර්යාලයන් හි අක්‍රීය වූ යතුරු තහඩුව ඉවත් කර අලුත් යතුරු තහඩුවක් සවි කර කාර්යාලය මැනවින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

එමෙන් ම බෙලිඅත්ත සුනන්දාරාම විහාරස්ථානයෙහි ධර්මශාලාවෙහි නඩත්තු කටයුතු වශයෙන් හානියට පත් දොරපලු, ජනෙල් කඳන්, ජනෙල් පියන් අලුත්වැඩියා කිරීම ආදිය සිදු කරන ලදී.

මුල්කිරිගල රජමහා විහාරස්ථානයේ, විහාර මළුවේ ඉදිරිපිට සහ ඉන් ඉහළට විසි ගසා එළිපෙහෙළි කර සුද්ධ පවිත්‍ර කිරීම, වහලයේ කොළරොඩු ඉවත් කර පිරිසිදු කිරීම ආදිය සිදු කරන ලදී.

එසේ ම වාඩිගල සෙල්ලිපිය සහිත ඉඩමේ කැළය කපා එළිපෙහෙළි කර හඳුනාගත් අවශ්‍ය තැන් සඳහා වල් නාශක යෙදීම සිදු කරන ලදී.

මෙම කලාපය තුළ අවශ්‍ය ස්ථාන පරීක්ෂාවන් සිදු කර පුරාවස්තු විනාශයන්ට අදාළ ස්ථාන පරීක්ෂාවන් සහ පුරාවිද්‍යා වටිනාකමින් යුත් ස්ථානයන්හි කරනු ලබන ස්ථාන පරීක්ෂාවන් ආදිය සිදු කර අදාළ නඩත්තු කාර්යය අවසන් කරන ලදී.

## කෞතුකාගාර අංශය

### පුරාවිද්‍යා සති වැඩසටහන

2016 පුරාවිද්‍යා සතිය නිමිති කොටගෙන ජූලි 07 වන දින විශේෂ පුරාවිද්‍යා ප්‍රදර්ශනයක් සකස් කරන ලදි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ස්වර්ණමය යුගය දක්වා ශ්‍රී ලාංකීය ජනතාව විවිධ ඓතිහාසික යුගවල දී අත්පත් කරගත් සංවර්ධනීය අවස්ථා ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් කිරීම මෙහි දී සිදු කරන ලදි. ඒ මඟින් පුරාවිද්‍යා උරුමය සහ ඓතිහාසික යුගවල දී සංවර්ධනීය අවස්ථාව පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම මෙහි දී සිදු කරන ලදි.




ප්‍රධාන ආරාධිතයන් ජංගම ප්‍රදර්ශනය නරඹමින්




2016 ජූලි 07 වන දින පුරාවිද්‍යා දිනය නිමිති කොටගෙන පවත්වන ලද විශේෂ පුරාවිද්‍යා ප්‍රදර්ශනය

### වෙසක් උත්සවය සඳහා විශේෂ ප්‍රදර්ශනය

2016 රාජ්‍ය වෙසක් උත්සවය නිමිති කර ගනිමින් අරලියගහ මන්දිරයේ දී පැවති වෙසක් උත්සවය සඳහා විශේෂ ප්‍රදර්ශනයක් පවත්වන ලදි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ස්වර්ණමය යුගය දක්වා විවිධ අවස්ථා නිරූපණය කරනු ලැබූ මෙම ප්‍රදර්ශනයට සමගාමීව පුරාවස්තු ප්‍රදර්ශනයක් හා නීලගිරි ස්තූප කැණීමෙන් හමු වූ සර්වඥ ධාතු ප්‍රදර්ශනයක් ද පවත්වන ලදි.






අරලියගහ මන්දිරයේ දී පැවති සර්වඥ ධාතු හා ජංගම ප්‍රදර්ශනය

### නීලගිරි ධාතු ප්‍රදර්ශන හා ජංගම ප්‍රදර්ශන පැවැත්වීම

දිවයිනේ විවිධ විහාරස්ථානවල නීලගිරියෙන් හමු වූ සර්වඥ ධාතු ප්‍රදර්ශන පවත්වන ලදි. මීට අමතරව දිවයින පුරා ඇති පාසල්වල පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය ලබා දීම සඳහා පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශන පවත්වන ලදි.




සර්වඥ ධාතු ප්‍රදර්ශන

**මහනුවර කෞතුකාගාරය ප්‍රතිසංවිධානය**

ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය තුළ පිහිටා ඇති පුරාවිද්‍යා කෞතුකාගාරය දර්ශනීය ලෙස පවත්වාගෙන යාම මෙන් ම කෞතුක වස්තු ආරක්‍ෂා කර ගැනීම වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදි. තව ද කෞතුකාගාරය තුළ සිදු කරන ශාස්ත්‍රීය කටයුතු යථාවත් කර ගැනීම ද මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණක් වූ අතර ඒ අනුව කෞතුකාගාරය අවට භූමියේ තණකොළ කපා මට්ටම් කිරීම, පසුගිය වසරේ මූලික ලේඛන හා අත් පිටපත් සකසා ඇති පුරාවස්තු පසුබිම් සැකසීම, කෞතුකාගාරය අභ්‍යන්තරයට රිලව් පැමිණීම වැළැක්වීම සඳහා කොටු දැල් ආවරණයක් යෙදීම යන කාර්යයන් සිදු කරන ලදි.






**වෙල්ගම් වෙහෙර තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම**

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වෙල්ගම්වෙහෙර තොරතුරු මධ්‍යස්ථානය ස්ථානීය තොරතුරු මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපනය කර මහජනතාව වෙත විවෘත කරන ලදි.



**කෞතුකාගාර පවත්වාගෙන යාම**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු සියලු ම කෞතුකාගාර මහජනතාවට සිත්ගන්නා සුළු ආකාරයෙන් පවත්වාගෙන යාම.

# ප්‍රවර්ධන අංශය

**ජාතික පුරාවිද්‍යා සමුළුව**

මෙම වර්ෂයේ ජුලි මස 07 වන දින ජාතික පුරාවිද්‍යා සමුළුව කොළඹ 07, නිදහස් මාවතේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී දිනය පුරා ම ඉතාමත් උත්කර්ෂවත් ආකාරයෙන් පවත්වනු ලැබී ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂිකව පවත්වනු ලබන මෙම සමුළුවේ දී ප්‍රවීණ හා ආධුනික පුරාවිද්‍යාඥයින් විසින් ඉකුත් වසරේ කරන ලද පර්යේෂණ පත්‍රිකා ක්ෂේත්‍රයේ අනෙකුත් විද්‍යාර්ථීන් හමුවේ ඉදිරිපත් කර එම පර්යේෂණ සංවාදයට ලක් කිරීම සිදු විය.

ප්‍රවීණ හා ආධුනික පුරාවිද්‍යාඥයින්ට සිය පර්යේෂණ කටයුතු බෙදා හදා ගැනීම සඳහා අවස්ථාවක් ලබාදීම මෙන් ම ඒ සඳහා සහභාගිවන්නන්ට ජාතික උරුමය සම්බන්ධ නවමු තොරතුරු පිළිබඳ ව දැනුවත් භාවයක් ලබා දීම, මෙහි අරමුණ විය.

මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ය. මීට අමතරව අමාත්‍යාංශයේ නිලධාරින්, පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වැනි ආයතනවල නිලධාරින්, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ විද්වතුන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා ශිෂ්‍යයින් ඇතුලු පර්යේෂකයන් රැසක් ද මෙම සමුළුවට සහභාගි විය.

මෙවර ජාතික පුරාවිද්‍යා සමුළුවට පහත සඳහන් විශේෂාංග ඇතුළත්ව තිබුණි.

1. ප්‍රකාශන එළිදැක්වීම

   i. Procedings of Archaeological Symposium 2016 සමුළු ප්‍රකාශනය
   ii. දායාද පුවත්පත - 10 වන කලාපය
   iii. Ancient Ceylon No 25
   iv. කොළඹ, මහනුවර, කුරුණෑගල හා කෑගල්ල යන දිස්ත්‍රික් පොත්

2. සිය අතපත් පුරාවස්තු දෙපාර්තමේන්තුව වෙත භාරදුන් පුද්ගලයින්ට සහතික පත් හා මූල්‍යමය ත්‍යාග පිරිනැමීම ද සිදු කරන ලදි.

3. එමෙන් ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 126 වසරක අතීතය සනිටුහන්වන වාර්තා වැඩසටහනක් සකස් කර සමුළුවේ දී ප්‍රචාරය කරන ලදි.



2016 ජාතික පුරාවිද්‍යා සමුළුවෙහි ආරාධිත අමුත්තන්



පුරාවිද්‍යා ප්‍රකාශන එළිදැක්වීම



පුරාවස්තු භාරදුන් පුද්ගලයන්ට සහතික පත් හා මූල්‍යමය ත්‍යාග ප්‍රදානය

**පුරාවිද්‍යා සති වැඩසටහන්**

මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්කවලට අදාළව එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල "පුරාවස්තු කළමනාකරණය, ජනමත දූර්මත හා යථාර්ථය" යන්න තේමා කොට ගනිමින් පළාතේ තෝරාගත් පාසල් 20ක සිසු ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදි.

මීට අමතරව මහජන දේශනවල දී මෙරට පවත්නා පුරාවස්තු රැක ගැනීමට ප්‍රබල තර්ජනයක් වන ජනතාව තුළ පුරාවස්තු පිළිබඳ පවත්නා දූර්මතයන් ඛණ්ඩනය කිරීමට මුල් තැනක් දෙනු ලැබී ය.

පුරාවස්තු කළමනාකරණය ජනමත, දූර්මත හා යථාර්ථය මැයෙන් පාසැල් දේශන 20 ක් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික් දෙකේ පාසැල් දහය බැගින් තෝරාගෙන ක්‍රියාත්මක කෙරිණි. එමෙන් ම මේ අරමුණ පෙරදැරි කරගෙන ගෙයින් ගෙට ගොස් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.

පුරාවිද්‍යා සති වැඩසටහනට සමගාමීව පුරාවිද්‍යා උරුමය හා එය අනාගතය උදෙසා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහනක් අම්පාර දිස්ත්‍රික් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදි. පුරාවිද්‍යා සති වැඩසටහනට සමගාමීව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් මඩකලපුව කාර්යාලය මගින් ද සංවිධානය කරන්නට යෙදුණි.

රත්නපුර/කෑගල්ල දිස්ත්‍රික් පුරාවිද්‍යා සති වැඩ සටහනට සමගාමීව සබරගමුව ප්‍රාග් ඓතිහාසික උරුමය, වැව්, පැරණි දේවාල, අම්බලම්, විහාර, චිත්‍ර හා මූර්ති කලාව, ඉතිහාසය, විදේශීය පාලන කාලය ආදී විෂයයන් රැසක තොරතුරු අඩංගු විස්තර පුවරු නිර්මාණය කරන ලදි.

ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ජාතික පුරාවිද්‍යා සතිය තුළ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

පුරාවිද්‍යා සති වැඩසටහනට සමගාමීව වයඹ පළාතේ පාසැල් 20 ක් සඳහා දේශන පැවැත්විණි.

පුරාවිද්‍යා සති වැඩසටහනට යටතේ ජනතාව දැනුවත් කිරීම උතුරු මැද පළාතේ ද සිදු කෙරිණි.

**පොත් ප්‍රදර්ශන**

කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සෑම වසරක් පාසා ම සැප්තැම්බර් මස ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශකයන්, ප්‍රකාශන ආයතන (රාජ්‍ය හා පෞද්ගලික) රාශියකගේ දායකත්වයෙන් උත්කර්ෂවත් ලෙස පැවැත්වෙන ප්‍රදර්ශනයකි. මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ඇතුළත් අලෙවි කුටියක් සංවිධානය කර පවත්වන ලදි.

**ග්‍රන්ථ සංරක්ෂණය**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පුස්තකාලයේ ඇති ග්‍රන්ථ එකතුවේ වටිනා හා පැරණි ග්‍රන්ථ රැසක් සංරක්ෂණයට මෙම වසර තුළ කටයුතු කරන්නට යෙදුණි (1890-1950 කාලවල පාලන වාර්තා / 1890 ට පෙර සිදුවූ සේවාවන් අඩංගු History of the Public Worker's ග්‍රන්ථ).

**ග්‍රන්ථ මිළ දී ගැනීම (දේශීය /විදේශීය )**

දෙපාර්තමේන්තු පුස්තකාලයේ පාඨකයින්ගේ පරිශීලනය පිණිස පුරාවිද්‍යා විෂයයට අදාල විවිධ ග්‍රන්ථ, ප්‍රකාශන ආයතන හා පුද්ගලයන් මගින් මිළ දී ගැනීම මේ යටතේ සිදුකරනු ලැබී ය (දේශීය / විදේශීය සහ කර්තෘ ප්‍රකාශන 800 ක් පමණ).

**ප්‍රකාශන**

යාපනය අර්ධද්වීපයේ පුරාවිද්‍යා උරුමය පිළිබඳව භාෂා ත්‍රිත්වයෙන් "යාපනය අර්ධද්වීපයේ පුරාවිද්‍යා උරුමය" යන මැයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදි.

**දේශන හා සම්මන්ත්‍රණ**

මෙරට පුරාවිද්‍යා උරුමය පිළිබඳ ව පාසල් දරුවන් රාජ්‍ය නිලධාරින් හා මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යාලය තුළ මෙන් ම පහත සදහන් පාසල්, ආයතන, විහාරස්ථානවල පුරාවිද්‍යා දේශන හා සම්මන්ත්‍රණ පවත්වන්නට යෙදුණි.

1. රාජ්‍ය නිලධාරීන් සඳහා පුරාවිද්‍යා නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, කොළඹ.
2. සුභාරතී මහාමාත්‍ය විද්‍යාලය, ගොඩගම.
3. සෙනරත් පරණවිතාන ජාතික පාසල, මිනුවන්ගොඩ.
4. රාජසිංහ විද්‍යාලය, හංවැල්ල
5. විද්‍යාරතන විශ්වවිද්‍යාපීඨය, හොරණ
6. ගලහිටියාව හේමමාලී මහා විද්‍යාලය, ගනේමුල්ල
7. පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන, දොඩම්ගස්ලන්ද ආයුර්වේද රෝහල් පරිශ්‍රය
8. ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලය, රත්නපුරය
9. ගිරාඳුරු කෝට්ටේ මධ්‍ය මහා විද්‍යාලය
10. කඩුගන්නාව මධ්‍ය  මහා විද්‍යාලය
11. පුරාවිද්‍යා නීතිය පිළිබඳ ව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන, කැගල්ල, රත්නපුර සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පවත්වන ලදී.
12. දකුණු පළාතේ පාසල්වල දරුවන් සඳහා පුරාවිද්‍යා උරුමය කෙරෙහි දැනුවත් භාවයක් ලබා දී එමගින් එම ශ්‍රේෂ්ඨ උරුමය ආරක්ෂා කිරීමට ඔවුන් යොමු කිරීමේ අරමුණින් මෙම වර්ෂයේ ද පාසල් 10 ක සිසුන් 1344 දෙනෙකු සහභාගි කරවාගෙන දැනුවත් කිරීමේ දේශන මාලාවක් පවත්වන ලදි.
13. අනුරාධපුරය කුට්ටම්පොකුණ රජ මහා විහාරයේ දී පුරාවිද්‍යා සම්මන්ත්‍රණයක් පවත්වන ලදි.
14. මධ්‍යම පළාත් කාර්යාලය මගින් මසකට එක බැගින් පුරාවිද්‍යාව පිළිබඳ දේශන 12ක් පවත්වන ලදි.

15. පුරාවිද්‍යා සම්මන්ත්‍රණ වැඩසටහන, ශ්‍රී දළදා මාලිගා ශ්‍රවණාගාරය, මහනුවර.

16. උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා සම්මන්ත්‍රණයක් පවත්වන ලදි.

**ජංගම ප්‍රදර්ශන**

මෙරට මාහැඟි පුරාවිද්‍යා උරුමයේ අගය පිළිබඳ ව පාසල් සිසුන්, ගුරුවරුන් හා පොදුවේ මහජනයා දැනුවත් කිරීම උදෙසා පහත සඳහන් ස්ථානවල ජංගම ප්‍රදර්ශන පවත්වන ලදි.

1. මහර කඩවත වෙසක් කලාපය පුරාවිද්‍යා ප්‍රදර්ශනය,

2. කහවිල්ගොඩ රාජ මහා විහාරය, පුරාවිද්‍යා ආකෘති ඇතුළත් පුරාවිද්‍යා ප්‍රදර්ශනය

3. ජංගම ප්‍රදර්ශනවලට යොදා ගැනීම සඳහා විස්තර පුවරු 14 ක් ඌව පළාත් කාර්යාලය විසින් නිර්මාණය කරන ලදි.

4. වයඹ පළාත් කාර්යාලය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ජාතික පාසල හා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව දංකොටුව බාලිකා විද්‍යාලයේ දී පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශන දෙකක් පවත්වන ලදි.

5. උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා උරුමය පිළිබඳ පාසල් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශනයක් පවත්වන ලදි.

**පැරණි ලේඛන සම්බන්ධ ව්‍යාපෘතිය**

I. පුස්තකාලයේ ඇති තෝරාගත් පැරණි ලේඛන පරිලෝකනය කර සංරක්ෂණය කර තබා ගැනීම
II. වාස්තුවිද්‍යා අංශයේ ඇති පැරණි සැළසුම් පරිලෝකනය කර සංරක්ෂණය කර තබා ගැනීම

**සිතුවම් ඡායාරූප වාර්තාකරණය**

ඩිජිටල් ඡායාරූප ක්‍රමය යටතේ ඓතිහාසික සිතුවම් වාර්තාගත කිරීමේ ව්‍යාපෘතියක් දිවයිනේ ප්‍රධාන සිතුවම් සහිත පුරාවිද්‍යා ස්ථානවල ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව සීගිරිය, තිවංක පිළිමගෙය, දෙගල්දොරුව යන ස්ථානවල සිතුවම් ඡායාරූපගත කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.



සීගිරි සිතුවම් ඡායාරූපගත කිරීම



තිවංක පිළිමගෙයි සිතුවම් ඡායාරූපගත කිරීම



දෙගල්දොරුව ලෙන් විහාරයේ සිතුවම් ඡායාරූපගත කිරීම